# 2018.11.13 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති

## මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය-

| | |
|---|---|
| ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරුසභාපති |
| කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ග්‍රේෂන් කොරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඒ.පී.ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| දිනයාදුර ධර්මදාස මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| නන්දන රාජපක්ෂ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ලලිත් ධම්මික කොඩිකාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ආර්. එම්. ලසන්ත අජිත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| මගගේ අතුල ප්‍රියන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. ඒ. සෝභිත රංජිත් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඊ. ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ජී. ජී. ආර්. පේෂලා කුමාරි මහත්මිය | ගරු නගර සභා මන්ත්‍රී |
| එච්.ඉනෝකා ක්‍රිෂාන්ති | ගරු නගර සභා මන්ත්‍රී |
| එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| ඩබ්. එම්. නිලානි මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| ධනසේන මාදුවගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| එස්. එම්. සරත්චන්ද්‍ර ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ.ව. **10.49** රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී☸

## (01)

**01.01 2018 – 10 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම**

**2018 – 10 – 02** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු නගර සභා ජගත් කුමාර මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ ඒ අනුව **2018- 10- 02** දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන නැත

**(03)** ලැබී ඇති පැමිණිලි ,පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3.01 අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා විසින් 2018.10.05 මිටියාගොඩ උප කාර්යාලයේ පැවැත්වීමට නියමිත ජංගම සේවය** සඳහා උපකරණ හා භාණ්ඩ නගර සභාවෙන් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව මඟින් මිටියාගොඩ උප කාර්යාලයේ 2018.10.05 දින පැවැත්වූ ජංගම සේවය සඳහා නොමිලේ ප්ලාස්ටික පුටු 200 , පාට කොඩි 40 , කැනපි 10 ලබා දීම සඳහා ඉල්ලීමක් කර ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙම ඉල්ලීම සභා අනුමතියට යටත්ව ඉටු කර ඇති බැවින් ඒ සඳහා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

තිරණය -

අම්බලන්ගොඩ ප්‍රාදේශිය සභාව විසින් 2018.10.05 දින පවත්වනු ලැබූ ජංගම සේවය සඳහා ප්ලාස්ටික් පුටු 200 ක් , පාට කොඩි 40 සහ කැනපි 10 ක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව සභා අනුමැතියට යටත්ව එම භාණ්ඩ ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**3.02 පළාත් පලාන ආයතනවල කසළ කළමනාකරණ සේවයේ යෙදි සිටින කණිෂ්ඨ සේවකයන් සඳහා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**2018.10.04 සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පළාත් පාලන ආයතනවල , කසළ කළමනාකරණ සේවයේ යෙදි සිටින කණිෂ්ඨ සේවකයන් සඳහා පැවැත්වෙන පුර්ණ වෛද්‍ය සායනයක් 2018.10.11 වන දින පැවැත්වෙන අතර ඒ සඳහා 2018.10.10 වන දින පුටු 400 ක් නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සභා අනුමතියට යටත්ව ප්‍රධාන අමාත්‍යතුමාගේ ඉල්ලීම පරිදි මෙකි අවශ්‍යතාව ඉටු කර ඇති නිසා ඒ සඳහා සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.
තිරණය -

පළාත් පලාන ආයතනවල කසළ කළමනාකරණ සේවයේ යෙදි සිටින කණිෂ්ඨ සේවකයන් සඳහා සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2018.10.10 දින සඳහා පුටු 400 ක් ලබා දෙන ලෙසට ප්‍රධාන අමාත්‍යාංශය (දකුණු පළාත) විසින් කරන ලද ඉල්ලීමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**03.03** සුනාමි නිවාස ගැටළුව **ආර්.එම් ඥානසිරි** මහතා **ප්‍රාදේශීය ලේකම්තුමියට** යවන ලද ලිපිය සම්බන්ධව **ප්‍රාදේශීය ලේකම්තුමියට** විසින් 2018.10.31 දින ඉදිරිපත් කළ ලිපිය සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ආර්.එම් ඥානසිරි මහතා මෙම ලිපියෙන් ප්‍රකාශ කර සිටින්නේ වාර කන් කාලයේදි ගොඩබිමට වතුර පැමිණීමෙන් එම වතුර දේවාල තාප්පය නිසා එය බාධා වී තම නිවෙස් යටවෙන බවත් මේ නිසා දේවාල තාප්පය කඩා ඉවත් කරන ලෙස ඉල්ලීමක් කර ඇත.

**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙම දේවාල තාප්පය අප ඉදිකළ එකක් නෙමෙයිද? මෙය දේවාල කමිටුව මඟින් ඉදිකළ එකක් නිසා එය දේවාල කමිටුව මඟින් විසඳා ගත යුතුය. අප මේම ප්‍රශ්නයට මැදිහත් වුවහොත් අනවශ්‍ය ප්‍රශ්නයකට සභාවට මුහුණ දීමට සිදුවේ. මොකද මෙය පූජනිය ස්ථානයක් නිසා, මෙය දේවාල කමිටුව මඟින් විසඳා ගැනීමට සෝභිත මන්ත්‍රීතුමාට පුළුවනි මෙයට මැදිහත් වීමට.

**ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙම දේවාල තාප්පය කලින් දැන් අවුරුදු ගණනක් වෙනවා හදලා. ඔය ප්‍රශ්නය පැන නැගුනේ ඇතුල් වීම සඳහා අපි තබන ලද ගේට්ටු දෙක වැසිම නිසාය. අපි ගිය සභාවේ තීරණය කළා ගේට්ටු දෙකක් දමා මෙය සම්පූර්ණ කර දෙන ලෙස . මා ඉල්ලා සිටින්නේ සභාපතිතුමනි, තාප්පය කඩන එක නෙමේ පිලියම . අපි කිව්ව විදියට ගේට්ටු දෙකක් දමමු . මෙම වතුර එන්නේ දේවාල වත්තේන්ම නෙමේ. ඒ එන වතුර දේවාල වත්තෙන් බැස යාමට එ අය ඉල්ලන්නේ .මම කියන්නේ ගේට්ටු දෙකක් දමා දෙන්න .තාප්පය කඩන එක නෙමේ පිලියම .දැන් ඔය තාප්ප ප්‍රශ්නේ ආවේ අපි ඔය ගේට්ටු දෙක වහන්න හැදුවානේ ඒ නිසා තමයි ඔය තාප්පය කඩන ප්‍රශ්නය ආවේ. ගෙට්ටු දෙකක් දමමු අපි උදේ සවස අරින වහන .ගේට්ටු දෙකක් කියන්නේ වහන ගේට්ටුවක් නෙමෙයි.යකඩ කූරු දාලා අරින වහන ගේට්ටු දෙකක් දේවාල වත්තෙන් අනෙක් පැත්තට වතුර බැසයන්න පුළුවන්.තාප්පය කඩන එක නෙමේ පිලියම.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

තප්පය කැඩීම වැරදියි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ සම්බන්ධව අනෙක් මන්ත්‍රීවරුන්ගේ අදහස් මොනවාද

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මම හිතන්නේ එය තාක්ෂණ සේවා නිලධාරි වාර්තාවක් අරගෙන කටයුතු කරමු. මේ පිළිබද කවුරුහරි මහත්මයෙක් ඉල්ලීමක් කලාම ඒ පිළිබඳ අදහස් විමසා බලා කටයුතු කළ යුතුයි. මොකද මේ මහතා සෝභිත මන්ත්‍රීතුමා දන්නවා ඇති, නමුත් අපි මේ පුද්ගලයා දැකලා නෑ. දේවාල කමිටුවත් සමඟ සකච්ජා කර සාධාරණ තින්දුවක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහිදි ඥානසිරි මහතා මේ සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කර ඇත. 03.04 යටතේ සකච්ජා වන්නේද මේ පිළිබඳවයි.මෙම කාරණයත් එකට සකච්ජා කල යුතුයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමනි , මෙහදි මේවැනි දෙයක් මෙම දේවාල කමිටුව මඟින් සිදු කර තිබෙනවා. අපි විසින් කළ යුතු දෙයක් ඔවුන් මෙහිදි කර තිබේන්නේ .මෙම දේවාල තාප්පය බැඳිම වරදක් නම් නෙමේ මා දකිනා ලෙස. මෙම දේවාල තාප්පය බැඳිය යුතුයි. අපි ඉතිහාසයේ දන්නාවා ඔතන පවුල් 14 ක් විතර පදිංචි වී සිටියා. මේ පවුල් 14 ඉවත් කිරීම සම්බන්ධව ඔබතුමත් මා සමඟ මෙයට හවුල් වුනා. මේ පවුල් 14 සඳහා ඉඩම් දී මේ දේවාල භූමිය ශුද්ධ භූමියක් කළා. මේ දේවාල භූමිය ශුද්ධ කර නිම කර විවෘත කරනු ලැබුයේ එවකට ධීවර ඇමතිතුමා ලෙස සිටි මහින්ද රාජපක්ෂ මහතාගේ අතිනි. මේ සඳහා එහි යම් ආරක්ෂාවක් සඳහා එහි ගම්වැසියන් විසින් එකතු වි ගත් ක්‍රියාවකි මෙය. මේ සම්බන්ධව ගැටලුව පැන නැගුනේ මේ ගේට්ටු දෙක වැසිම පටන් ගත් පසුවයි. අපි මේ ගේට්ටු දෙක වසන්නේ නැතුව වතුර බැස යාමට තබා එක ග්‍රිල් ගේට්ටුවකින් දේවාල භූමියේ ආරක්ෂාව තහවුරු කළ යුතුයි . එයත් අපසතු වගකිමකි .නැතිනම් මෙහි නොයෙකුත් අපචාර ක්‍රියාවන් සමහර විට සිදු විමට හැකිය.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**

දැන් එතුමා කියලා තිබෙනවා මෙය ගිහින් බලන්න කියලා. තාක්ෂණ සේවා නිළධාරි මහතෙකු ලවා මෙය බලා කටයුතු කිරීම සියලු දෙනාටම හොඳයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

ගිය වර සභාවේ 03.09 යටතේ තීරණයක් ගෙන තිබෙනවා සභාව විසින් ආර්. එම් .ඥානසිරි මහතා විසින් මෝදර දේවාල බැම්ම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමට අනුව සභාව මඟින් එම කඩුලු දෙක සඳහා ගේට්ටු දෙකක් සවිකර දීම සුදුසු බවට අපි සභාවෙන් කියා තිබේනවා ගේට්ටු දෙකක් සවිකර වහන්න කියා. එය අවශ්‍ය වේලාවට විවෘත කරන ලෙසත්. මෙය මා හට පෙනෙන පරිදි පුද්ගලික ප්‍රශ්නයක් බවට පත් වී ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**
ඔය ප්‍රශ්නේ ආවේ අපි ගිය සභාවේ ගේට්ටු දෙකක් දමන්න කියා තීරණයක් ගත් පසුවයි. ගෙට්ටු දෙක වැසීමට තීරණයක් ගත් පසුවයි ඔය දේවාල භූමියේ තාප්පය කැඩීමේ ගැටලුව පැන නැගුනේ. තාප්පය කඩන එක මෙයට විසඳුමක් නොවේ . මෙම තාප්පය නිසා දේවාල භූමියේ ආරක්ෂාව සැලසෙන අතර මෙය වසර කිහිපයකට පෙර ඉදි කරන ලදි. අපි සුනාමියට පෙර තමයි මෙම ගේට්ටුව සදන ලද්දේ. අපි ගත් තීරණයේ වෙනසක් සිදු විය යුතු නම් මා කියා සිටින්නේ ගම් වාසින් , දේවාල කමිටුව හා අදාල පුද්ගලයා ද එකතු කරගෙන දේවාල භූමියේ ගොඩනැඟිල්ලේ සාකච්ජාවක් සිදු කර විසඳුමකට පැමිණෙමු. එවිට මේ සඳහා ගම්වාසිනුත් මේ සඳහා යම්කිසි තීරණයක් ගනු ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
අපි හිතනවා ඔබතුමා ගමේ නියෝජිතයෙක් ලෙස සුදුසුම තීරණය සභාවට දන්වා සිටින්නට ඇති බව . ඒ අනුව තමයි අපි කතා කරලා තිබේන්නේ. මා කියූ යෝජනාව ඔබතුමා විසින් ස්ථිර කර තිබේනවා. මේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ සඳහා විරුද්ධ වී නැත. මා දකින එය තිබෙන හැම පන්සලකම , කතරගම දේවාලය ගත්තත් දෙවුන්දර ගත්තත් හැම එකේම ගේට්ටු තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි ඔය දේවාල භූමියේ ඉදිරිපස ගේට්ටුව කැඩී ඇත .සෑම දිනකම පහේ උදේ සිට සවස් වනතුරු ගේට්ටුව විවෘත තබනවා. ඔය එක දිනක් කපු මහතා නිවාඩු අරගෙන තියෙනවා . ඒ මහතාගේ පෞද්ගලික අවශ්‍යතාවයකට .එත් ඉදිරිපස ගේට්ටුව වසා තබන්නේ නැත .එදා පමණක් කතරගම දේවාලයේ ගේට්ටුව පමණක් වසා තබා ඇත.එ කපු මහතා නිවාඩු ගත් නිසාය .කොහොමත් ඉදිරිපස පොඩි ගේට්ටුවක් හැම දිනකම විවෘත තබනවා. කිසිම දිනක එය වසා තබන්නේ නැත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ විදියට තිබීම සුදුසු යයි අපි මන්ත්‍රීවරුන්ගේ සිතනවාද ? එසේ නම් අපි විදියට තබමු.

**තීරණය**
සුනාමි නිවාස ගැටලුව මැයෙන් මෝදර දේවාල භූමියේ ඉදිකර ඇති තාප්පය සම්බන්ධයෙන් අම්බලන්ගොඩ ප්‍රාේදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව විසින් මිට පෙර සභාවේදි ගන්නා ලද තිරණය පරිදි ක්‍රියා කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.04** **ආර්. එම්. ඥානසිරි මහතා විසින් මෝදර දේවාල භූමිය** පිළිබඳ **2018.10.11** වන දින ඉදිරිපත් කළ ලිපිය සභා ගත කරන ලදී.

**තීරණය**
**හිරේවත්ත, අම්බලන්ගොඩ පදිංචි ආර්.එම්.ඥානසිරි මහතා විසින්** මෝදර දේවාලයේ ගේට්ටු සම්බන්ධයි මැයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව විසින් මිට පෙර සභාවේදි ගන්නා ලද තිරණය පරිදි ක්‍රියා කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.05** අම්බලන්ගොඩ , පෝරම්බ පදිංචි **, අයි. බී. පසන් උදාර** මහතා විසින් ප්‍රචාරක පුවරු සවි කිරීම සඳහා **2018.10.22** වන දින එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ , පෝරම්බ පදිංචි අයි. බී . පසන් උදාර මහතා හිරු ස්ටාර් තරඟයේ 48 දෙනා අතරට තරඟ ඉදිරිපත් වුන නිසා නොමිලේ ප්‍රචාරක පුවරුවක් සවි කිරීමට අවසර ඉල්ලා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඉහත නම සඳහන් මා හිරු ස්ටාර් තරඟයේ 48 දෙනා අතරට තරඟ වදින බවත්, මොහු පෝරඹ ප්‍රදේශයේ බවත්ය. ඒ සඳහා නොමිලේ ප්‍රචාරක පුවරු සවි කිරිම සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටි. ඔහු අම්බලන්ගොඩ පුරවැසියෙකි. මෙකි මෙම ඉල්ලීම සභා අනුමතියට යටත්ව ඉටු කර ඇති බැවින් ඒ සඳහා සභා අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මහගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , පසන් උදාර සහෝදරයා මේ තරඟයෙන් ප්‍රතිශතය නොමැති නිසා ඉවත් වි ඇත. මා මෙම වැඩ සටහන නැරඹුවා. ඔහු මෙම තරඟයෙන් පරාදයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ඔහුගේ ප්‍රචාරක පුවරු සවි කිරීම සඳහා අනුමතිය ඉල්ලා ඇති බවයි. ඒ සඳහා ප්‍රචාරක පුවරුව සවි කිරීමට ගාස්තු වලින් තොරව අවසර දි ඇති බැවින් ඒ සඳහා සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

තීරණය :-
අම්බලන්ගොඩ , පෝරඹ පදිංචි **, අයි. බී. පසන් උදාර** මහතා විසින් හිරු ස්ටාර් තරඟයේ 48 දෙනා අතරට තරඟ වදින වටය සඳහා ඉදිරිපත් වන බැවින් ඒ සඳහා නොමිළයේ ප්‍රචාරක පුවරු සවි කිරීම සඳහා අවසර ලබා ගැනිම වෙනුවෙන් කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**03.06** වරාය කළමණාකාරතුමා විසින් **2018.10.22** වන දින **J.C.B. යන්ත්‍රය පැය 02** කාලයක් ලබා ගැනීම සඳහා අනුමතිය ඉල්ලා එවන ලද ලිපිය සභා ගත කරන ලදී.

ගරු ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ 2018.10.28 දින පැමිණිම වෙනුවෙන් සංවිධානය කරන ලද උත්සවය සඳහා,අම්බලන්ගොඩ ධිවර වරාය භූමියේ කොටසක් පිරිසිදු කර සමතලා කර ගැනීම සඳහා J.C.B යන්ත්‍රය පැය 2 ක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මේ සඳහා J.C.B යන්ත්‍රය පැය 2 ක කාලයකට පසුව මුදල් ගෙවීම මත ලබා දී ඇත.එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා.

තීරණය;-
අම්බලන්ගොඩ ධිවර වරායේ වරාය කළමණාකාරතුමා විසින් **2018.10.22** වන දින සඳහා **J.B.C. යන්ත්‍රය පැය 02** කාලයක් පසුව මුදල් ගෙවිමේ පදනම මත ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**03.07 ගරු නාගරික මන්ත්‍රී කේ.පි. දයානන්ද සිල්වා** මහතා නගර සභා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් **2018.10.26** වන දින එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ. පී දයානන්ද සිල්වා මහතා ඔහුගේ අයහපත් සෞඛ්‍ය තත්වය නිසා නගර සභික ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ලිපියකින් 2018.10.26 වන දින දන්වා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ගරු නාගරික මන්ත්‍රී කේ. පී දයානන්ද සිල්වා මහතා විසින් තේරිම් භාර නිලධාරි , (අම්බලන්ගොඩ නගරය) මැතිවරණ කාර්යාලය , ගාල්ල. යන ලිපිනයට නගර සභික ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධව ලිපියක් යවා ඇත .ඉහත ලිපිනයේ සඳහන් කුකුලේගේ පද්මසිරි දයානන්ද සිල්වා වන මම ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය

කරමින් අම්බලන්ගොඩ නගර සභික ධුරය භෙබ වුයෙමි .එහෙත් දැනට අයහපත් සෞඛ්‍ය තත්වයෙන් පෙලෙන බවත් , එම නිසා නගර සභික ධුරයෙන් ඉල්ලා අස්වන බවයි.එහි පිටපතක් අපට දැන ගැනීමට එවා ඇත. ඒ සම්බන්ධව සභාව දැනුවත් කරමි.
තිරණය-

ගරු නාගරික මන්ත්‍රී කේ.පි. දයානන්ද සිල්වා මහතා 2018.10.29 දින සිට නගර සභා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලිම සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි.

**03.08 "2019 වාර්ෂික මුද්දර"** වැඩ සටහන සඳහා යෝජනා ලබා ගැනීම යන මැයෙන් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වන ලද **2018.10.29** වන දින ලිපිය සභාගත කරන ලදී.

සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානින් වෙත , 2019 වාර්ෂික මුද්දර වැඩ සටහන සඳහා යෝජනා ලබා ගැනීම. උක්ත කරුණට අදාළව පළාත් පාලන අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් මා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ. ඒ අනුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් 2019 වර්ෂයේදි නිකුත් කරනු ලබන සමරු මුද්දර සඳහා පළාත් පාලන ආයතනයන්ට අදාළ යෝජනා ලබා දෙන ලෙස දන්වා ඇත. මේ සඳහා පළාත් පාලන ආයතනය මගින් ලබා දිමට යෝජනා පවති නම් 2018.10.29 දිනට පෙර පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලිපියක් ඉදිරිපත් කරන ලදී. සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානින් වෙත , උක්ත කරුණට අදාළව පළාත් පාලන අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් විසින් මා වෙත යොමු කරන ලද ලිපිය හා බැඳේ. ඒ, 2019 වාර්ෂික මුද්දර වැඩ සටහන සඳහා යෝජනා ලබා ගැනීම. ඒ අනුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් 2019 වර්ෂයේදි නිකුත් කරනු ලබන සමරු මුද්දර සඳහා සුදුසු තේමාවක් සලකා බැලිමට යෝජනාවක් කැඳවා ඇති අතර ඒ සඳහා පළාත් පාලන ආයතනයන්ට අදාළ යෝජනා ලබා දෙන ලෙස උක්ත ලිපියෙන් දන්වා ඇත.මේ සඳහා නගර සභාවට යෝජනා ලබා දීමට ඇත්නම් පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කරන ලෙස දන්වා සිටි. මෙකි ලිපිය අපහට ලැබුනේ 2018.10.29 දිමයි. 2018.10.29 පෙර දැනුම් දෙන ලෙස දන්වා තිබුණි . මෙය සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කරමි.

<u>ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි ඒ සඳහා එක් යෝජනාවක් තිබේ. ඒ අම්බලන්ගොඩ සුනාන්දාරාම විහාරස්ථානයේ මකර තොරණ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කළයුතු ස්ථානයක් ලෙස නම් කර තිබෙනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
තවත් යෝජනා තිබෙනවාද ?

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ ප්‍රථම නගරාධිපතිණිය ලෙස සිටි ගරු සිරිනාවති ද සිල්වා මැතිණිය නමිනුත් සමරු මුද්දරයක් නිකුත් කිරිම සුදුසු යයි මා යෝජනා කර සිටිනවා.

**පෙරවරු 11.05 ට පමණ සභාපතිතුමා සභාවේ මුලසුන උපසභාපතිතුමාට භාර දී සභාවෙන් නික්ම යන ලදි.**

<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
තවත් මේ සඳහා යෝජනා තිබේනවාද?

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ ඉන්ද්‍ර අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , අම්බලන්ගොඩ නගරය කලා පුරවරයක් ලෙස හඳුන්වනවා. ඒ නිසා ආරියපාල ගුරුන්නාසේගේ නමත් මම මේ සඳහා යෝජනා කර සිටිනවා .

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා කතා කරමින්</u>

එම යෝජනාව මා ස්ථිර කර සිටිනවා.

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
මෙම යෝජනා සියල්ලම පළාත් පාලන කොමසාරිස්තුමාට දන්වා යවන්න.

**තීරණය**
2019 වාර්ෂික මුද්දර වැඩසටහන සඳහා යෝජනා ලබා ගැනිම මැයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව 2019 වර්ෂයේ දි නිකුත් කරනු ලබන සමරු මුද්දර සඳහා සුදුසු තේමාවන් සම්බන්ධ යෝජනාවන් ලෙස
01. සුනන්දාරාම විහාරස්ථානයේ මකර තොරණ
02. ලංකාවේ ප්‍රථම නගරාධිපතිතුමිය වන සිරිනාවතී මන්ත්‍රීතුමීගේ රුව
03. අම්බලන්ගොඩ ආරියපාල ගුරුණ්නාන්සේගේ රුව
යන යෝජනාවන් ගරු සභාව විසින් ඉදිරිපත් කරන ලදි.

**03.09 තුඩුවමුල්ල ඒක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය** සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධයෙන් **2018.10.29** දිනැති ලිපිය සභා ගත කිරීම.

ඉහත නම් සඳහන් සමිතියේ උපකරණ සහ භාණ්ඩ ගබඩාකර තැබීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් මැතිතුමා විසින් රුපියල් ලක්ෂ පහළොව (රු.1500000/=) ක් මේ වන විට අනුමත කර දී ඇත. නමුත් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් සමිතිය සඳහා ගොඩනැගිල්ල ඉදි කිරීමට බලාපොරොත්තු වන ඉඩම රජයට අයිති ඉඩමක් නොවන බැවින් එම ප්‍රතිපාදන මුදල ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. එහෙත් එම ඉඩම නගර සභාවට පවරා දෙනු ලබන්නේ නම් එකී මුදල ලබා දීමට හැකිබවට නීතිමය උපදෙස් ලැබුණි. ඒ අනුව අප සමිතියේ සියළුම සාමාජිකයින්ගේ එකඟත්වය මත එම ඉඩම නගර සභාවට පවරා දීමට එකඟ වුනී.

ඒ අනුව පහත සඳහන් එකඟතාවන්ට අනුව මෙම ඉඩම නගර සභාවට පවරා දීමට අවශ්‍ය කටයුතු සලස්වන මෙන් ඉල්ලා සිටිමු.

01. රජයේ සහ ගම්වාසීන්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදිකිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ අයිතිය සහ බුක්තිය තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුබ සාධක සමිතිය සතු වේ.
02. එම ඉඩම් කොටසේ අයිතිය අම්බලන්ගොඩ නගර සභාව සතුවේ
03. ගොඩනැගිල්ලේ සම්පූර්ණ නඩත්තු කටයුතු සමිතිය විසින් දරනු ලැබේ.
04. මෙම ගොඩනැගිල්ල තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුබ සාධක සමිතයේ අවශ්‍යතාවන්ට සහ කටයුතු වලට හැර වෙනත් කටයුත්තකට භාවිතා කළ නොහැකි බවට දෙපාර්ශවය එකඟ වේ.
05. තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුබ සාධක සමිතිය මගින් ඉදිකරනු ලබන මෙම ගොඩනැගිල්ල වෙනස් කිරීමට හෝ කඩා ඉවත් කිරීමට අම්බලන්ගොඩ නගර සභාව විසින් කටයුතු නොකරනු ඇත.

ඉහත කී සමිතිය මගින් තුඩුවමුල්ල ගම්වාසීන් වෙනුවෙන් කරනු ලබන මෙම ප්‍රජා සත්කාරය සඳහා ඉහත සඳහන් එකඟතාවන් අනුව මෙම ඉඩම් කොටස අම්බලන්ගොඩ නගර සභාවට පවරා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ගරු නගරාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ඉහත නම් සඳහන් සමිතියේ උපකරණ සහ භාණ්ඩ ගබඩාකර තැබීම සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට දකුණු පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් මැතිතුමා විසින් රුපියල් ලක්ෂ පහළොව (රු.1500000/=) ක් මේ වන විට අනුමත කර දී ඇත.

- **පෙරවරු 11.09 සභාවේ මුලාසනයට සභාපතිතුමා නැවතත් පැමිණීම.**

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙම ඉල්ලීම් ලිපිය එවනු ලබන්නේ තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුබ සාධක සමිතියෙ සභාපති වන හරිස්චන්ද්‍ර ටුක්කාවඩු සහ ලේකම් වන ආර්. ටී . විශාකා යන මහත් මහත්මීන් විසිනි.

<u>**ගරු නගර සභා මන්ත්‍රීනි ඒ.පී.ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි, මේ සඳහා එකඟතාවය දෙන ලෙස ඉල්ලා සිටිමි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා මහතා කතා කරමින්**</u>

සභාපතිතුමනි මෙහි සඳහන් කොන්දෙසි වල යටතේ ඇති 5 කොන්දෙසියට අපිට එකඟ වෙනවාට වඩා එය වෙනස් කරන එක තමයි හොඳ. මොකද නගර සභාවට මොනම විදියට වත් මෙම ගොඩනැගිල්ල වෙනස් කිරීමට කියන දෙයට එකඟ විය නොහැක. ගොඩනැගිලි ඉදිකිරීමට අනුමතිය ලබා දෙන ආයතනයක් ලෙස අපිට ඒ සඳහා අපට කොන්දෙසියක් ලෙස අත්සන් කළ නොහැකිය. මෙවැනි කොන්දෙසියක් නොදා ඉන්න එක තමයි හොඳඒ සඳහාඑකඟ වීමට කැමත්ත ප්‍රකාශ කිරීමට නොහැකිය.කොන්දෙසි 4ක් දමා අනුමත කරන්න 5 වෙනි කොන්දෙසිය ඉවත් කරන්න.

<u>**ගරු නගර සභා මන්ත්‍රීනි ඒ. ජී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

සභාපතිතුමනි, මම මේය කැඩීමට අවශ්‍ය වන්නේ නැහැ. මොකද මෙම ගොඩනැගිල්ල අයිති ඉඩම පාර අද්දර නෙමේ පවතින්නේ. එය කමල් මහතාගේ ඉඩමේ අයිනෙන් තමයි සැදිමට නියමිත. පාරට මුහුණලා නෙමෙයි මෙය ඉදිකිරීමට අදහස් කරන්නේ .මෙම කොන්දෙසිය තිබුණත් ප්‍රශ්නයක් නොවේ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා මහතා කතා කරමින්**</u>

නෑ සභාපතිතුමනි මා අදහස් කළේ මෙය කැඩීමට නොවේ. මෙම සමිතිය තව අවුරුදු 10 ක් තියෙන්නත් පුළුවන් අවුරුදු 20ක් තියෙන්නත් පුළුවන් 30 වෙනි අවුරුද්දේදි මෙය වෙනස් කරන්න බෑ මේ ආකාරයෙන් අත්සන් කලහොත් එය අපිට ප්‍රශ්නයක් විය හැකිය .එය වෙනස් කිරීමට අවශ්‍ය නම් ඔවුන් නගර සභාවට දන්වා ඔවුන් එය වෙනස් කර ගනී.නැතිව කඩා ඉවත් කිරීමට නෙමේ මා පවසන්නේ.මෙම කොන්දෙසියට යටත්ව අත්සන් කලහොත් නගර සභාව ඊට යටත් විය යුතුයි.මෙහි සඳහන් 5 වෙනි කොන්දෙසිය ඉවත් කර ඉතිරි කොන්දෙසි හතරට අනුමතිය ලබා දෙන්න.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ගරු ලක්ෂ්මී මන්ත්‍රීතුමිය 5 වෙනි කොන්දෙසිය නැතිව මේ සඳහා එකඟ ද?

<u>**ගරු නගර සභා මන්ත්‍රීනි ඒ. ජී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**</u>

ඕන විදියකට එකඟයි. මෙම ගොඩනැගිල්ල සැදිමයි අවශ්‍ය වන්නේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නෑ. අදහස් දෙකක් තිබුණාම මේ තීරණයක් දීමට නොහැකියි. මෙය මහජන අවශ්‍යතාවයකට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන මත තමයි මෙම ගොඩනැගිල්ල ඉදි කිරීමට නියමිත. මහජන අවශ්‍යතාවයක් නිසා එහි ඇති නිතිමය බාධා ඉවත් කර අපි මේ සඳහා අනුමතිය ලබා දෙමු.

තීරණය:-

තුඩුවමුල්ල ඒක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම සම්බන්ධයෙන් එක්සත් බෞද්ධ සුභසාධක සංගමය විසින් නගර සභාවට මෙම ඉඩම පවරා දිම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපියට අනුව

1. රජයේ සහ ගම්වාසින්ගේ ධන පරිත්‍යාගයෙන් ඉදිකිරිමට අපේක්ෂිත ගොඩනැගිල්ලේ අයිතිය සහ බුක්තිය තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුභ සාධක සමිතිය සතුවේ.
2. එම ඉඩම් කොටසේ අයිතිය නගර සභාව සතුවේ.
3. ගොඩනැගිල්ලේ සම්පුර්ණ නඩත්තු කටයුතු සමිතිය විසින් දරණු ලැබේ.
4. මෙම ගොඩනැගිල්ල තුඩුවමුල්ල එක්සත් බෞද්ධ සුභ සාධක සමිතියේ අවශ්‍යතාවයන්ට සහ කටයුතුවලට හැර වෙනත් කටයුත්තකට භාවිතා කළ නොහැකි බවට දෙපාර්ශවය එකඟ වේ.

යන කරුණු සඳහා එකඟතාවය ලබා දිමට යටත්ව නගර සභාව වෙත පවරා ගනිමින් මෙම ඉල්ලීම ඉෂ්ඨ කිරීම සුදුසු බවට බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී

ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
මේ සමහපෙරවරු 11.15 පමණ මිළ ගණන් ඇත. මිළ ගණන් විවෘත කරන්න.
පෙරවරු 11.15 පමණ මිළ ගණන් විවෘත කරනු ලැබිය.

**03.10 ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලයීය අධ්‍යාපනික හා වෙළඳ සැණකලියේ** ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ **2018.10.26 දින** ලිපිය සභා ගත කරන ලදී.

අධ්‍යාපනික හා වෙළඳ සැණකෙලියේ ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගා/සවුත්ලන්ඩ් විද්‍යාලයීය 91-2000 හා 2001-2010 ආදි ශිෂ්‍ය කණ්ඩායම් හි සාමුහිකත්වයෙන් පාසලේ සංවර්ධනය අරමුණු කර ගනිමින් 2018 නොවැම්බර් මස 29.30 හා දෙසැම්බර් මස 01,02 යන දිනයන්හි අධ්‍යාපනික වෙළඳ සැණකෙලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙහි විස්තර ඇතුලත් 8*6 ප්‍රමාණයේ ප්‍රචාරණ දැන්වීමක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ ප්‍රදර්ශනය කිරීමට ද අවසර ඉල්ලා ඇත.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

**ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලයීය අධ්‍යාපනික හා වෙළඳ සැණකලියේ** ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ **2018.10.26 දින** අධ්‍යාපනික හා වෙළඳ සැණකෙලියේ ප්‍රචාරණ දැන්වීම් ප්‍රදර්ශනය සඳහා ගා/සවුත්ලන්ඩ් විද්‍යාලයීය 91-2000 හා 2001-2010 ආදි ශිෂ්‍ය කණ්ඩායම් හි සාමුහිකත්වයෙන් පාසලේ සංවර්ධනය අරමුණු කර ගනිමින් 2018 නොවැම්බර් මස 29.30 හා දෙසැම්බර් මස 01,02 යන දිනයන්හි අධ්‍යාපනික වෙළඳ සැණකෙලියක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙහි විස්තර ඇතුලත් 8*6 ප්‍රමාණයේ ප්‍රචාරණ දැන්වීමක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ ප්‍රදර්ශනය කිරීමට සභා අනුමතියට යටත්ව අවසර දී ඇත.

තීරණය:-
**ගාල්ල සවුත්ලන්ඩ් විද්‍යාලය විසින් 2018.11.29, 30 සහ 2018.12.01,02 දිනයන්හි පවත්වනු ලබන අධ්‍යාපනික හා වෙළඳ සැණකලියේ** ප්‍රචාරණ දැන්වීම් පුවරුවක් අම්බලන්ගොඩ නගර මධ්‍යයේ ප්‍රදර්ශනය කිරිම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**03.11 "ගම්පෙරළිය" වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018 -** යටතේ අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ආගමික ස්ථාන සංවර්ධනය කිරීම වැඩ සටහන යටතේ **පටබැදිමුල්ල අල්ලිය දේවාලයෙහි ප්‍රතිසංස්කරණ** කටයුතු පිළිබඳ **2018.10.22** දින ලිපිය සභා ගත කරන ලදී.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>
ඉහත ලිපියේ සඳහන් පරිදි සංවර්ධන කටයුතු සඳහා පහත සඳහන් යෝජනාවේ පරිදි රුපියල් ලක්ෂ 3 ක මුදලක් අනුමත වී ඇත.

- අල්ලිය දේවාලයේ වහල ප්‍රතිසංස්කරණ කිරීම.

එහෙත් අප කාර්යාලයේ තාක්ෂණ නිලධාරි විසින් ක්ෂේත්‍ර පරීක්ෂා කරන ලද අවස්ථාවේ දේවාලයේ භාරකරු විසින් දේවාල භූමියේ බැතිමතුන්ගේ ප්‍රයෝජනය සඳහා අමානෝ ෂීට් යොදා වහලක් ඉදි කිරීම හා දේවාලයේ කුටිවල වහලේ ජල කාන්දුව වැලැක්වීම හා පොලොවේ ටයිල් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. මේ සඳහා ඉහත දේවාල භූමියේ ඉදි කිරීම සිදු කිරීමට සභාවේ අනුමතිය ඉල්ලා ඇත.

පටබැඳිමුල්ල , අල්ලිය දේවාලයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සම්බන්ධ ලිපියේ සඳහන් පරිදි සංවර්ධන කටයුතු සිදු කිරීමට සභා අනුමතියට යටත්ව මෙය සභාවට ඉදිරිපත් කරමි. මාගේ යුතුකමකි මෙය සභාවට ඉදිරිපත් කිරීම. අලුතින් සංවර්ධනය කරන වැඩ සටහන් සියල්ලම නවතා ඇත.

**තීරණය:-**
**ගම්පෙරළිය" වේගවත් ග්‍රාමීය** සංවර්ධන වැඩසටහන **2018** මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් අල්ලිය දේවාලයේ වහල ප්‍රතිසංස්කරණය කිරිම සඳහා අනුමැතිය ඉල්ලා සිටි අතර මෙම කටයුත්ත සභා

අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**03.12 කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලෙය් විදුහල්පති ඒස්.පී. ආරියරත්න** මහතා විසින් **ප්‍රචාරක පුවරුවක්** ප්‍රදර්ශනය කිරීම සදහා අවසර ලබා ගැනීම සඳහා **2018.10.31** දින ලිපිය සභාගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඉහත සඳහන් පාසලේ 75 වෙනි සංවත්සරය වැඩසටහන සඳහා පූර්ව ප්‍රචාරක පුවරුවක් අම්බලන්ගොඩ බස් නැවතුම්පල ආසන්නයේ ගාස්තු අයකිරිමකින් තොරව ප්‍රදර්ශනය කිරීමට අවසර ඉල්ලා ඇත. එකි ඉල්ලීම සභා අනුමතියට යටත්ව ලබා දී ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපේ උකුසු ඇස් ඇති නිළධාරීන් පෙරේදා සවිකර තිබූ මෙම ප්‍රචාරක පුවරුව ඉවත් කර ඇත. මා ඉල්ලා සිටිනවා නැවත මෙය සවිකර දෙන ලෙස. ඔබතුමාගේ තීරණය නොදැන වෙන්නැති මෙය ඉවත් කරන්න ඇත්තේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මෙම දැන්වීම් පුවරුව ඉවත් කළාද ?

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>
DJ ආයතනය අසල තමයි මෙම දැන්වීම් පුවරුව සවිකර තිබුණේ. දැන් එය ඉවත් කර ඇත.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මේ සම්බන්ධව මට කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමත් කතා කර ඇසුවා.මෙය සභාව මඟින් ඉවත් කරයි කියන එක බොරු කතාවක් . අපි ඉවත් කළේ නෑ. ඔබතුමා එහෙම කියන්න එපා. අපි ඉවත් කළාද ? නැද්ද? කියා පවසන්න. RO මහතා මෙය ඉවත් කළාද ? ඉවත් කළේ නැතිනම් ඔබ ඊට එහා උත්තර දීමට අවශ්‍ය නැත.චෝදනාවක් ඇවිත් තිබෙනවා අපිට. අපි සභාවෙන් එහෙම දෙයක් කළේ නෑ . සභා අනුමතියට යටත්ව මා මේ සඳහා තීරණය දී ඇත. මෙය සභාවේ අනුමත කරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය අදාල වෙළඳ ආයතනය මඟින් ඉවත් කළාද දන්නේ නෑ.

තීරණය:-
**කරන්දෙණිය මධ්‍ය මහා විද්‍යාලය විසින් විද්‍යාලයේ 75 වන සංවත්සර වැඩසටහන සඳහා පූර්ව ප්‍රචාරක පුවරුවක් (බස් නැවතුම්පළ ආසන්නයේ) ගාස්තු අයකිරිමකින් තොරව** දර්ශනය කිරීම සඳහා සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**03.13 2018.09.18 දින පැවති රථවාහන කමිටුවේදී** ගත් තීරණය පරිදි බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණ භූමියේ වැට ඉදිරිපිට නවතා තබන රථවාහන සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අදාල ලිපිය සභා ගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
2018 **දින පැවති රථවාහන කමිටුවේදී** ගත් තීරණය පරිදි බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණ භූමියේ වැට ඉදිරිපිට නවතා තබන රථවාහන සඳහා ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් අදාල ලිපියේ සඳහන් විස්තරය සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත්චන්ද්‍ර මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , මෙතැන දි පළමු විනාඩි 30 ගාස්තු අය කිරීමෙන් නිදහස් බව පවසා ඇත. යතුරු පැදියක් පැමිණියහොත් එහි පළමු විනාඩි 30 ගණනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද? කොහොමද ගණනය කරන්නේ.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
කවුද මෙම රථ වාහන කමිටුවේ ඉන්නේ? මන්ත්‍රීවරු කවුද මෙහි සිටින .මේ මන්ත්‍රීවරු තමයි මෙය

ඉදිරිපත් කර තිබෙන්නේ.මම දන්නේ නෑ මේ ගැන.

<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
කවුද ඔහොම තීන්දුවක් ගත්තේ?කමිටුව ඔවැනි තීන්දුවක් ගත්තේ නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී ඊ ඉන්දා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>
නම් ටික ඉදිරිපත් කරන්න.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
එදින රැස්වීමට පැමිණ සිටියේ කවුද? මම රථ වාහන කමිටුවේ නැහැ.

<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි, ඔහොම දෙයක් ඉදිරිපත් වුනේ නෑ. අපි ඔය වගේ තීන්දුවක් ගත්තේ නෑ.මේ සම්බන්ධව ඔබතුමා සමඟ සාකච්ජා කර මෙවැනි තීරණයක් ගන්න ඕන බව. එවැනි වාර්තාවක් නම් කමිටුවට ඉදිරිපත් කළා..ඔබතුමා මෙතැන මන්ත්‍රීවරුන්ට නැති ප්‍රශ්න ඇති කරන්න එපා. මම දැන් කිව්වේ විනාඩි 30 ක් නිදහස් කළේ ඇයි කියා. එහෙම තීන්දුවක් ගත්තේ නැනේ. ගත්තද එවැනි තීන්දුවක්.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්.ඩබ්.රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
මේ කමිටුව සඳහා ඉදිරිපත් කරනු ලැබූ යෝජනා

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
අපි මෙය රථ වාහන කමිටුවේදි සාකච්ජා කර විශ්ලේෂණය කර තීරණයක් ගනිමු.

**තීරණය**
රථවාහන නවතා තැබිමට ගාස්තු අය කිරිම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව මෙම යෝජනාව රථවාහන කමිටුවට ඉදිරිපත් කොට එම කරුණු විශ්ලේෂණය කර සභාවට ඉදිරිපත් කිරිම සුදුසු බවට සභාව විසින් තිරණය කරන ලදි.

**03.14** කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා සහ සුභ සාධක සංගමයේ ලේකම්තුමා විසින් **2018.11.18** වන දින අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලීයිය ශ්‍රවණාගාරයේදි **"අමන්දා"** නමින් සංගිත ප්‍රසංගයක් පැවැත්විම සම්බන්ධයෙන් එවන ලද ලිපිය සභා ගත කරන ලදී.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා සහ සුභ සාධක සංගමයේ ලේකම්තුමා විසින් ධර්මාශෝක විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදි අමන්දා නමින් පවත්වනු ලබන සංගීත ප්‍රසංගය එම ගුරු භවතුන්ගේ සුභසාධන කාර්යයන් සඳහා යොදවා ගැනීමට අපේක්ෂා කරන බවත්,එකි ප්‍රසංගයෙන් ලැබෙන අදායම ආදායම් බද්දෙන් නිදහස් කර දෙන ලෙසත් එය මේ සඳහා කරනු ලබන අනුග්‍රහයක් ලෙසද ඉල්ලා සිටි. තවද ප්‍රසංගය සඳහා අදාල ප්‍රචාරක පුවරු 15 ක් නගර සීමවේ නොමිලේ සවි කර දෙන ලෙසත් ඉල්ලා සිටි .

<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි , මෙය ලබා දෙන්න. අම්බලන්ගොඩ දරුවෙකු පාසලට ඇතුලත් කර ගත හැකි පාසල කුලරත්න විද්‍යාලයයි.

**තීරණය**
ගා/පි ද එස් කුලරත්න මහා වාද්‍යාලය විසින් ගුරු සුභසාධක සංගමයට ආධාර පිණිස 2018.11.18 දින අමන්දා නමින් පවත්වනු ලබන සංගිත ප්‍රසංගය විනෝද බද්දෙන් නිදහස් කරන ලෙසටත් , මෙම ප්‍රසංගයේ ප්‍රචාරක කටයතු කිරිමට අදාළව ප්‍රචාරක පුවරු 15 ක් පමණ නගර සභා සිමාව තුළ නොමිළයේ සවි කිරිමටත් අවසර ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලිමට අනුව මෙම ඉල්ලිම ඉටු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ

අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

- පෙ.ව.11.30 ට ජගත් කුමාර මන්ත්‍රීතුමා සභාවෙන් පිට වුනා

**03.15 විෂය ලිපිකරු (පරිසර)** විසින් ඉදිරිපත් කර තිබූ **වීදුරු ඒකතු කිරීමේ ව්‍යාපෘතිය** සම්බන්ධ **2018.10.11** දිනැති ලිපිය සභාගත කරන ලදී
නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසල අතරින් පිරිසිදුව වෙන් කරන ලද වීදුරු මිලදී ගැනීම සඳහා රන්ඩම් ගෝබල් ප්‍රයිවට් නැමති ආයතනය මගින් කැමැත්ත ප්‍රකාශ කර එවනු ලබන යෝජනා පහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇත.

01. එකතු කරන ලද වීදුරු ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ස්ථානයක් හඳුනා ගැනීම.
02. පිරිසිදු කරන ලද වීදුරු නගර සභාව භාර ගන්නා බව ට්‍රැක්ටර් රථ මඟින් හා ප්‍රචාරක කටයුතු මඟින් ජනතාව දැනුවත් කිරීම.
03. එකතු කිරීමේ පහසුව සඳහා නගර සභා බල ප්‍රදේශයේ එකතු කිරීමේ මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීම හා එක්රැස් කිරීමේ දිනයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
04. පිරිසිදු කරන ලද වීදුරු භාර ගැනීම සඳහා සේවකයකු යෙදවීම.
05. වීදුරු පැටවීම බැම වැනි කටයුතු වල යෙදෙන සේවක මහතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම.
06. කිලෝ ග්‍රෑම් 15000-20000 අතර ප්‍රමාණයක් එකතු වූ පසු ඒවා ගැනුම්කරු වෙත විකිණීම දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹීම හා ගිවිසුම් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීම

- පෙ.ව.11.35 ට ජගත් කුමාර මන්ත්‍රීතුමා නැවත සභාවට පැමිණියා

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසල අතරින් පිරිසිදුව වෙන් කරන ලද වීදුරු මිලදී ගැනීම සඳහා රන්ඩම් ගෝබල් ප්‍රයිවට් නැමති ආයතනය මගින් කැමැත්ත ප්‍රකාශ කර එවනු ලබන ඉහත සඳහන් යෝජනා ඉදිරිපත් කරන ලදි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මේ වීදුරු නිසා ලොකු ව්‍යසනයකාරි තත්වයක් ඇති වි තිබේ.මේ ගොබල් කියන ආයතනය අප සභාවට ඉතාමත් හොඳ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන අප සතුටු වෙනවා. මේ සම්බන්ධව පූර්ණ ප්‍රචාරණයකින් මෙම ද්‍රව්‍ය එක්රැස් කිරීම සිදු කළ යුතුයි . මෙම ආයතනය සමඟ එකතු වී මෙම වැඩසටහන ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ගත වන ලෙස මා ඉල්ලා සිටිනවා.

<u>**ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි , මෙම ආයතනය මේ සම්බන්ධව සාකච්ජා කළා. ඉන් අනතුරුව මේ වැඩ සටහන ගැන මා ඔබතුමා වෙත යොමු කලේ. මෙය ඉතා හොඳ වැඩ සටහනකි.මේ පිළිබඳව මා සොයා බැලුවා ගාල්ල නගර සභාවත් මෙම ව්‍යාපෘතිය කරගෙන යනවා. ඔවුන් වීදුරු කිලෝවක් මිලදි ගනු ලබන්නේ රු.2.50 ක මුදලකට.දැනට මෙම බෝතල් පාරවල් අයින් වල පවා ගෙනවිත් දමනවා. ඒ නිසා මේ සඳහා යම්කිසි ස්ථානයක් ලබා දී මේවා එක්රැස් කළ යුතුවේ. ඔවුන් මේවා ටොන් 15 ක් පමණ සම්පූර්ණ වූ පසු මේවා ගෙන යන බවද පැවසිය. මම හිතන්නේ සභාපතිතුමනි, මෙය සභාවට ම ආදායම් ලබා ගත්තොත් මෙය ක්‍රියාත්මක වෙයි කියා.අපේ සෞඛ්‍ය අංශයේ සේවකයින් තමයි මේ සඳහා මැදිහත් වෙන්නේ. මොකද මේවා ගෙනවිත් ගොඩ ගසන්නේ ඔවුන්. ඔවුන්ගේ ආර්ථික මට්ටම යහපත් කිරීමට හොඳ වැඩ සටහනක් ලෙස මෙයඉවහල්වේ. මින් ඔවුනට හොඳ ආදායම් මාර්ගයක් ලැබේ.අපිට පුළුවනි මේ සඳහා කුණු දමන ස්ථානයේම වෙනත් තැනක් සකසා දෙන්න . මෙහි අදායම අපේ සභාවට ම ගන්නේ නැතිව එම සේවකයන් අතරේම මෙය බෙදි යාමට සැලැස්වීම හොඳයි. ඔවුන් තමයි මීට අදාල කාර්යයන් සිදු කිරීමට මහන්සි වෙන්නේ .ඒ නිසා මේ සඳහා සෞඛ්‍ය අංශයේ සේවකයන් අතරේ ආදායම බෙදි යන ලෙස මෙම වැඩ සටහන සාර්ථකව ක්‍රියාත්මක කලහොත් මෙය සාර්ථක වෙයි. ගාල්ලේ නම් මේ සඳහා ශත 50ක මුදලක් තමයි සභාවට තබා ගන්නේ.ඉතිරි මුදල් සේවකයන් අතරේ බෙදි යයි. එම නිසා මෙම සේවකයන්ගේ පැත්තෙනුත් සලකා බලා මේ සඳහා සුදුසු හොඳ ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**</u>

ගරු උප සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබුවේ කාලෝචිත හොඳ යෝජනාවක් ලෙස මා පිලිගන්නවා. මොකද විදුරු කියන්නේ කොහොමටවත් දිරන්නේ නැති දෙයක්.මේ වීදුරු වගේ දෙයක් එකතු කර අනුන්ගේ යහපත වෙනුවෙන් යෙදවීමට හැකි නම් එය හොඳ යෝජනාවක් ලෙස මා අගය කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මේ ගොබල් කියන ආයතනය කරන ලද යෝජනාව හෙඳයි. නමුත් මිට වඩා අම්බලන්ගොඩ නගරයේ ප්ලාස්ටික් , කැළි කසල ප්‍රශ්නය මිට වඩා බලවත් . මට මතකයි එක් කාලයක ඔබතුමාගේ සභාපතීත්වයෙන් අර්ථ වාරියා පදනම මඟින් අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ යට තැනක කාඩ්බෝඩ් ආදි ද්‍රව්‍ය මිලදි ගැනීමේ මධ්‍යස්ථානයක් ඇති කළා. නමුත් මෙම වැඩ සටහන සාර්ථක වුයේ නැත.ගරු ප්‍රධාන අමාත්‍යතුමා හල්වතුරේ රු.ලක්ෂ 20 ක් වියදම් කර කසළ ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් සෑදිමට ප්‍රතිපාදන දුන්නා. එයින් දැන් ප්‍රයෝජන ගන්නේත් නෑ.එත් මෙම වැඩපිළිවලවල් සැකසීමේදි අපි ඉල්ලා සිටිනවා නිසියාකරව කළ යුතුයි. තවම මෙය ක්‍රියාත්මක වන්නේ නෑ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එම ගොඩනැඟිල්ලේ වැඩ තවම ඉවර නෑ..

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

එත් ලක්ෂ 20 ක් දිලත් තවම ඉවර නෑ කියන්නේ . අපි මේ සඳහා ගෙවිම් කලනේ.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

කපරාරුව මේ දිනවල කෙරෙමින් පවතින්නේ.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

එත් සභාපතිතුමනි, ඒ ටික අරගෙන .මුලික වශයෙන් අපේ ජනතාවගේ ප්‍රශ්නයක් ව තිබෙන්නේ වීදුරු නෙමේ. වීදුරු නම් එකතු කරලා දෙනවා. නමුත් මේ කැලිකසළ ප්‍රශ්නය තමයි වඩාත් වැදගත් වෙන්නේ. මෙම කැලිකසළ කොම්පොස්ට් සාදන ව්‍යාපෘතියක් සමඟ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසුයි. වීදුරු නෙමේ මුලිකම ප්‍රශ්නේ . දැන් විශේෂයෙන්ම බලපාන්නේ ෆොන් බැටරි ,සෞඛ්‍ය අංශයේ එක එක CFL ආදියයි ඒවා හරි ගැටලු සහගත තත්වයක්. එවත් ඇතුලත් ගන්න . ව්‍යාපෘතිය හොඳ වෙන්න පුළුවන් . නගරයේ ජනතාවට හොඳ ඵලදායිතාවයක් ඇති කර මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්න. පෞද්ගලික ආයතන කොහොමත් මුදල් දි මුදල් හම්බකරගන්න ක්‍රමවේදයක් තමයි යන්නේ. ඒවා සාර්ථක කර ගන්න නම් දැන් අපි ඒවා එකරැස් කරන්න ස්ථානයක් දෙන්න වෙයි.එය නොමිලේ සැපයිය යුතු වෙයි . ඒ වැනි දේ ගැන සලකා බලා ඔබතුමා මිට මැදිහත් වී කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්. එත් මෙම යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ පෞද්ගලික වෙළඳ ආයතනයක්. පෞද්ගලික වෙළඳ ආයතනයක් කිසිම දිනක අපිට වාසි ලෙස යෝජනා ඉදිරිපත් නොකරයි.

**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මේ යෝජනාව ඉදිරිපත් කර ඇත්තේ පෞද්ගලික වෙළඳ ආයතනයක් නොවේ.එය ඉදිරිපත් කර ඇත්තේ පරිසර විෂයභාර ලිපිකරු. මේවා විකිණීමට අදාල ආයතනයට හැකි බව තමයි පවසා ඇත්තේ.

**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්**

මට තේරෙනවා එය. මා පැවසිමට උත්සාහ කළේ, මේ වීදුරු ගැන කියන විට අපේ සේවකයන් පවා මැලි වෙනවා මේවා එකතු කිරිමට. එතරම් බරපතල තත්වයකි. සමහර නිවෙස් වලින් හොරෙන් හරි බෑගයකට දමා කුණු බාල්දියට මේ වීදුරු දෙනවා. සේවකයන්ගේ අත කැපෙන වාර බහුලයි . මෙය ඉතා සරලව සිදු කළ හැකි කාර්යයක් නොවේ. සරලව අනුගත විය හැකි කාරණයකුත් නොවේ.අපි මේ සඳහා නගරයේ එක් ස්ථානයක ට්‍රැක්ටරයක් හරි ටේලරයක් තබා නගරයේ සියළුම දෙනාට මේ වීදුරු දැම්මට සලස් වන්න. නැතිනම් මේ ආයතනය ලවා මෙය එකතු කර ගන්න.අපේ සේවකයන් මේ වීදුරු ග්‍රෑම් 500 කිලෝ එකක් මේ ට්‍රැක්ටරයෙන් රැගෙන එන්නේ නැත. මෙය වෙනම රැගෙන එන්නේද නැත. ඒ අයට ආදායම් මාර්ගයක් බව ඇත්ත .මේ රුපියල් දෙක මේ තරම් මහන්සි

වෙන්නේ නැත. ඔන්න වීදුරු කිලෝ 20 ක් 30 ක් තිබුණොත් මෙය රැගෙන එයි. බෝතලයක් දෙකක් කැල්ලක් අරන් එන්නේ නැත. අපේ සේවකයෝ එය ඉතිරි කර එයි.එනිසා මේ සඳහා නිවැරදි වැඩපිළිවෙලක් අවශ්‍ය වෙයි. මේ සියළුම වීදුරු නගරයේ බරපතල තත්වයකි. නගරයේ තැන් තැන්වල මේ වීදුරු ඇත . අපිට මෙවා ගෙනවිත් දැමිය නොහැකිය .. අපට මෙය ගෙනවිත් නගර සභා කුණු ගොඩේ දැමිය නොහැකිය. සුද්ද කිරිමට බෑ. මේ සඳහා නගර සභා සේවකයන් යෙදවිය නොහැකිය. මේ සඳහා අර පැවසූ ආකාරයට ඒ ස්ථාන දෙකෙන් එකක් මේ සඳහා තෝරා ගත යුතුය. නැති නම් ඒ ආයතනයක් සමඟ සාකච්ඡා කොට එම ආයතනය සමඟ ගිවිසුමකට ගිවිසුමකට පැමිණ එම ආයතනය විසින් වීදුරු එකතු කිරීමට එම ආයතනය විසින්ම වාහනයක් අපිට සපයා දිය යුතුය. ට්‍රැක්ටරයක් හරි ට්‍රෙලරයක් හරි වීදුරු එකතු කිරිමේ පොදු ස්ථානය යනුවෙන් සඳහන් කර පොදු ස්ථානයක තබා වීදුරු එකතු වූ පසු එවා රැගෙන යා යුතුය . මෙහිදි සභාවට අගතියක් නොවන පරිදි සේවකයන්ට මෙම මුදල් බෙදී ගියාට ප්‍රශ්නයක් නැත. මෙය එක් රැස් කිරීමේ වැඩ පිළිවළක් සකස් කරන ලෙසද මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම්.නිලානි මෙනවිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මේ පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සිතුවේ මෙයින් ජීවත්වන වන පිරිසක් සිටිනවා. මා දන්නා එක්තරා පුද්ගලයෙක් සිටිනවා මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ. බියර් ටින් හා මත්ද්‍රව්‍ය දමන වීදුරු බෝතල් එකතු කරමින් ආදායමක් උපයා ගන්නවා. මේ යෝජනාව අපේ නගර සභාව පැත්තෙන් ඉතාමත් හොඳයි. අර සරත් ශ්‍රීලාල්මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි මේ සඳහා හල් වතුරේ පොදු ස්ථානයක මෙම වීදුරු එකතු කිරීමට ආරක්ෂිතව පොදු ට්‍රැක්ටරයක් තබා ඊට සේවකයකු යෙදවිය යුතුය. මේ සඳහා ජනතාව දැනුවත් කරමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වැදගත්වේ. මේ සඳහා අපේ සේවකයන් යෙදවීම සුදුසු නැත. ජනතාවට මේ වීදුරු දැමීමට තැනක් නැත. මෙමඟින් ඔවුන්ට ඊට නිසි විසඳුමක් ලැබේ. ඒ සඳහා මේ ආකාරයෙන් කටයුතු කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

ගරුසභාපතිතුමනි, ඔබතුමා සිතනවාද ? අපේ මිනිසුන් හැඩගැසි ආකාරයට මේ බෝතලයක් වීදුරු කැල්ලක් මේ හල්වතුරට රැගෙන එයි කියා. මෙය ප්‍රායෝගික නෑ

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

දැනට මෙය කරන්නේ කුණු බාල්දියට මෙය දමන එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

කුණු එකට දමනවාට වඩා කුණු ට්‍රැක්ටරයේම වෙනම බාල්දියක් තබා එයට දැමිය හැකිබව මාගේ අදහස එහෙම නැතුව අර විදිය ප්‍රයෝගික නෑ නේද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

මා අදහස් කළේ නගරය මැද ට්‍රෙලරයක් තබන්න. එවිට ඕනෑම කෙනෙකුට එයට දැමිය හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රිනි ඊ.ඉන්ද්‍රා අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මා මේ සම්බන්ධව යම්කිසි අදහසක් ඉදිරිපත් කිරීමට කැමතියි. මේ වීදුරු කටු සම්බන්ධව බොහෝ නිවෙස් වල ගෘහනියන්ට බලපා ඇත . මොකද මේවා ඉවත් කර ගැනිමට නොහැකිවීම. මේ සඳහා කුණු ගෙන යන ට්‍රැක්ටර්වල මහතුන්ට යෝජනාවක් කරන්න, මේ සඳහා ගම්වාසීන් මෙයට කැමති වෙයි. මේ බෝතල් කටු ගන්නා බවට ජනතාවට දැනුම් දෙන ලෙස. මෙම වීදුරුකටු වෙනම බෑග් වලට දමා සුරක්ෂිතව දමා දෙන ලෙස. අපි එන සෑම මොහොතකම මේවා වෙනම බෑගයකට දමා දෙන ලෙස.කොට්ඨාශවල යන සෑම කෙනෙකුටම දන්වන්න. එහෙම නැතිව වෙනම තැනක තබා එක්රැස් කරන්න ගියොත් මෙම වැඩ සටහන සාර්ථක වෙන්නේ නැත. මේ පිළිබඳව ගෙවල් දැනුවත් කිරීමෙන් මෙය නිවෙස්වල කාන්තාවන් නිසි ලෙස ක්‍රමානුකුලව මෙය සකසා දෙයි. කොළඹ පැතිවල නම් ඉඳුල් වෙනම දිනයකත් , කුණු රොඩු වෙනම දිනයකත් ආදි ලෙස වර්ග කිරිමෙන් තමයි ගෙන යන්නේ . අපිට එහෙත් එසේ කිරීමට නොහැකිය. අපි වීදුරු කටු ගන්නා බව ජනතාව දැනුවත් කළ යුතුය. මොකද කුණු ගෙනයන අය පවසානවා අපි වීදුරු කටු ගන්නේ නෑ. එම නිසා තමයි ජනතාව මේවා කුණු බෑග් අස්සට දමන්නේ. අපි මේවා රැගෙන යන වැඩ සටහනක් කරන බව කියමින් ජනතාව දැනුවත් කිරිමෙන් සාර්ථකව මෙම වැඩ සටහන ක්‍රියාත්මක කළ හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මාත් මේ සඳහා යම් අදහසක් ප්‍රකාශ කරන්නම්. දැන් කොළඹ කුණු ගෙනියන්නේ කුණු වර්ගීකරණයක් කරලා. වීදුරු කටු වගේ දේවල් කුණු වගේ ගඳ ගහන්නේ නැති නිසා ගෙවල් වල නිතරම ගොඩ ගැසෙන්නේ නැත.මාසයකට දවසක් වගේ වීදුරු කටු රැගෙන යන්නත්, සතියේ මෙන්න මේ දිනයේ ප්ලාස්ටික් රැගෙන යන්නේ. දැන් අපේ කොළඹ කර්යාල වල වීදුරු කටු , ප්ලාස්ටික් , ඉඳුල් ආදී ලෙස වර්ග කර තමයි එක එක දිනයන් වලට මේවා රැගෙන යන්නේ.කුණු තමයි දිනපතා රැගෙන යන්නනේ .එ වැනි වර්ගීකරණයක් කරලා වැඩ සටහනක් හැදුවා නම් මෙය එතරම් බරපතල ප්‍රශ්නයක් නොවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස් සලකා සුදුසු පරිදි මෙමව්‍යාපෘතිය සිදු කිරීමට සභාවේ අනුමතිය මේ සඳහා ලබා දෙනවා.

**තීරණය**

නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ අතරින් පිරිසිදුව වෙන් කරන ලද විදුරු මිළදී ගැනීම සඳහා රන්ඩම් ගෝබල් ප්‍රයිවට් ලිමිටඩ් කැමති ආයතනය විසින් කැමැත්ත පළ කර ඇති බැවින් ඒ අනුව වැඩටහනක් ක්‍රියාත්මක කිරීම ඉදිරිපත් කර ඇත.

1. එකතු කරන ලද විදුරු ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ස්ථානයක් හඳුනා ගැනීම.
2 පිරිසිදු කරන ලද විදුරු නගර සභාව භාර නොගන්නා බව ට්‍රැක්ටර් රථ මගින් හා ප්‍රචාරක කටයුතු මඟින් ජනතාව දැනුවත කිරීම.
3. එකතු කිරීමේ පහසුව සඳහා නගර සභා බල ප්‍රදේශයේ එකතු කිරීමේ මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීම හා එක්රැස් කිරීමේ දිනයන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම
4. පිරිසිදු කරන ලද විදුරු හා ගැනීම සඳහා සේවකයකු යෙදවීම
5. විදුරු පැටවීම බෑම වැනි කටයුතුවලට යෙදෙන සේවක මහතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම
6. ක්ලෝ ග්‍රෑම් 15000- 20000 අතර ප්‍රමාණයක් එකතු වූ පසු ඒවා ගැනුම්කරු වෙත විකිණීම
7. දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹීම හා ගිවිසුම් ප්‍රකාරව ඉදිරි කටයුතු කිරීම.

ඇතුළත්ව ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව කසළ බැහැරලන ස්ථානයේ යම් ස්ථානයක් මේ සඳහා යොදා ගැනීම සුදුසු බවත් මෙය කාලෝචිත යහපත් යෝජනාවක් බැවින් මෙම කටයුත්ත ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.16** **අභ්‍යාන්තර විගණන නිලධාරි** විසින් පරිගණකය සඳහා මුද්‍රණ යන්ත්‍රයක් ඉල්ලා සිටීම **2018.09.17** දින ලිපිය සභා ගත කරන ලදී.

අභ්‍යාන්තර විගණන නිලධාරි මුද්‍රණ යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බවත් එය නැවත අලුත් වැඩියා කටයුතු සිදු කල නොහැකි බැවින් රාජකාරි කටයුතු වලදී මුද්‍රණ යන්ත්‍රයක් නොමැති වීම ගැටලු සහගත බවත් දන්වා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අභ්‍යාන්තර විගණන නිලධාරි මුද්‍රණ යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බවත් එය නැවත අලුත් වැඩියා කටයුතු සිදු කල නොහැකි බවත් දන්වා ඇත. රාජකාරි කටයුතුවලට අදාල පරීක්ෂණ වාර්තා, විගණන වාර්තා , අත්‍යවශ්‍ය ලිපි ලේඛන ආදිය මුද්‍රණය කර ගැනීම අවශ්‍යව ඇත. එම වාර්තා ඡායා පිටපත් යන්ත්‍රය මගින් මුද්‍රණය කර ගැනීමට යාමේදි ගැටලු සහගත බවත් නව මුද්‍රණ යන්ත්‍රයක් ලබා දෙන ලෙස අභ්‍යාන්තර විගණන නිලධාරි විසින් දන්වා ඇත.මේ සඳහා සභා අනුමතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

තීරණය

**අභ්‍යාන්තර විගණන නිලධාරි** විසින් තම රාජකාරි ඉටුකරගෙන යාම සඳහා නව මුද්‍රණ යන්ත්‍රයක් ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව මෙම ඉල්ලීම ඉටු කිරීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.17 සහකාර විගණකාධිපතිතුමා** විසින් අම්බලන්ගොඩ නගර සභාවේ **2017 දෙසැම්බර් 31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
අම්බලන්ගොඩ නගර සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වාර්තාව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණකාධිපතිතුමා විසින් එවා ඇත. එතුමාගේ මතය පමණක් මා ඉදිරිපත් කරනවා. මෙම විගණන වාර්තාවේ පිටපත් අවශ්‍ය අයෙකුට ලබා ගන්න පුළුවනි. මෙම වාර්තාවේ 2.2 කරුණු වලින් බැහැර හැර මූල්‍ය ප්‍රකාශන 2017 දෙසැම්බර්31 දිනෙන් අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්වය එදින අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සත්‍ය හා නිවැරදි සමහර වසර වල මේ පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරයි. එහෙත් මෙම වසරේ ඒ පිළිබඳව මතයක් ඉදිරිපත් කිරීම ගැන අපි නිලධාරන්ට ස්තුතිය පුද කරමි.

තීරණය:-
**සහකාර විගණකාධිපතිතුමා** විසින් අම්බලන්ගොඩ නගර සභාවේ **2017 දෙසැම්බර් 31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**03.18 පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා** විසින් **ගාල්ල දිස්ත්‍රික්** මිල නියම කිරීමේ කමිටු වාර්තාව **"2018 වර්ෂයේ දෙවන භාගය"** යන ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් ගාල්ල දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු වාර්තාව 2018 වර්ෂයේ දෙවන භාගය සඳහා මිල ගණන් ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව දැන ගැනීමට අවශ්‍ය මන්ත්‍රීවරයෙකු සිටිනම් ලේකම්තුමියගෙන් ඒ පිළිබඳව විස්තර ලබා ගත හැකිය. මෙන්න මේ වාර්තාව. පිටපත් දෙකකින් සමන්විතයි.

තීරණය:-
**පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා** විසින් **ගාල්ල දිස්ත්‍රික්** මිල නියම කිරීමේ කමිටු වාර්තාව **"2018 වර්ෂෙයේ දෙවන භාගය"** යන ලිපිය සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**03.19** ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා **දකුණු පළාත් ඉංජිනෙරු සේවා** කාර්යාලය විසින් **2018** දෙවන භාගය වෙනුවෙන් මිළ ගණන් වාර්තාව සභා ගත කරන ලදී.

තීරණය:-
ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා **දකුණු පළාත් ඉංජිනෙරු සේවා** කාර්යාලය විසින් **2018** දෙවන භාගය වෙනුවෙන් මිළ ගණන් වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**03.20** අම්බලන්ගොඩ නගර සභාවට අයිති කුලරත්න පාරේ පිහිටි **බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය (පැරණි)** ඉදිරි පිට භූමිය රථ වාහන නැවතුම්පළක් පවත්වා ගෙන යාමේ **ගිවිසුම් සම්බන්ධ** ලිපි ගොනුව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවට අයිති කුලරත්න පාරේ පිහිටි බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය (පැරණි) ඉදිරි පිට භූමිය රථ වාහන නැවතුම්පළක් පවත්වා ගෙන යාමේ ගිවිසුම 2019සම්බන්ධ ලිපි ගොනුව

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
අම්බලන්ගොඩ නගර සභාවට අයිති කුලරත්න පාරේ පිහිටි බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය (පැරණි) ඉදිරි පිට භූමිය රථ වාහන නැවතුම්පළක් පවත්වා ගෙන යාමේ බදු ගිවිසුම 2017.11.11 සිට 2018.10.31 දිනෙන් බදු ගිවිසුම් අවසන් වේ.මෙය රොසෙත් ආතනයට තමයි බදු දී ඇත්තේ. අදායම් පරීක්ෂණ වාර්තාවට අනුව මේ සඳහා 5% ක වැඩි වීමේ ගාස්තුව මත වර්ෂයකට රු.30634/= ක මුදලකට වසරක් සඳහා බදු දීමට සභාවේ අනුමතිය ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි, මෙය මීට වඩා වැඩි මුදලකට බදු දිය හැකි නේද අද තිබෙන තත්වය අනුව. රු.30000/= ක් කියන්නේ අවුරුද්දකටම.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මන්ත්‍රීතුමා, දැනට මෙතැන අපි දන්නාත් නොදන්නත් වාහන නවතා යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
හරි සභාපතිතුමා , මෙහි වාහන නවතා යන එක හරි.මිනිසුන්ට අවශ්‍ය තැනක වාහන නවතා යනවා එක හරි. එක වෙනම කතන්දරයකි. මේ සඳහා අපි දැන ගන්න ඕන ක්‍රමයක් සකසා ගැනීමට . අපිට ආදායමක් ලබා ගන්න. නගර සභාවට .අපි කියන්නේ නගර සභා දේපල තුල අනෙකුත් කට්ටිය ප්‍රයෝජන ගන්නවා. ගොඩක් තැන්වල සිදු වී ඇත්තේ මෙයයි. එය නගර සභාවේ ආදායම් තත්වය අපිට ගන්න පුළුවන් තැන් වලින් ගන්න ඕන. දැන් බැලුවාම රු.2500/= වගේ තමයි ලැබෙන්නේ . සමුපකාර භූමියේ රථගාලේ අයකරන මුදල දිනකට රු1000/= ක් පමණවේ. මම හිතන්නේ මේ රොසේත් රෝහලට එන වාහන තමයි මෙතැන නතර කරනු ලබන්නේ.මෙය මා හිතන්නේ මසකට රු.2500/= කට වඩා වැඩි විය යුතුයි. මම කියන්නේ මෙම මුදල වැඩි කර යුතුයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
දිපු ප්‍රමාණය තමයි 5% කින් වැඩි කරලා තමයි මේ ගණන.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
අපි කියන්නේ වැඩි කර එම ගණන ගන්නා ලෙස. ටෙන්ඩර් කරලා හරි. අලුතින් සකස් කර මෙය කරන්න.අපි කියන්නේ නගර සභාව පැත්තෙන් බලා. ඊළඟ වර්ෂයට මෙය අහෝසි වෙනවා.එතකොට වැඩි කරලා ගන්න.ඒ තමයි මගේ අදහස.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙය අහෝසි වෙනවා 2018.10.31 දිනෙනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**
මේ සඳහා මිල වැඩි කිරීම ගැන මාගේ විරුද්ධත්වයක් නැත. සාධාරණ මිල වැඩි කිරීමක් කලාට කමක් නැත. රොසෙත් එක පැත්තෙන් කියනවානම් ඒ අය මේ සඳහා මුදලක් අයකරන්නේ නැත. ටිකට් එකක් අයකරන්නේද නැත. ඕනැම කෙනෙකුට මෙහි වාහනයක් නතර කිරීමට පුළුවනි. ප්‍රසිද්ධ රථගාලක් ලෙස තමයි අපි මෙය හඳුන්වන්නේ. ඒ නිසා මේ පිළිබඳ නගර සභාව සාධාරණ වේ යයි කියා මා සිතනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි, සරත් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට එහෙම ප්‍රශ්නයක් තිබෙනවා .මේක අපි මිල වැඩි කරලා බදු ගිවිසුමෙන් ඉවත් වුවහොත් මින් පිඩාවට පත් වන්නේ රොසෙත් රෝහලට පැමිණෙන රෝගීන්ය. මොකද එතැන නතර කරනු ලබන්නේ වෛද්‍යවරුන්ගෙන් වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගීන්ගේ වාහනයි. අපි හිතන්නේ පෞද්ගලිකව වෙළඳ ආයතනයට සහනයක් දෙන්න නෙමේ. එහි ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගින්ට සහනයක් දිමටයි. පොදු මහජනතාවට සහනයක් දෙන්න තමයි මෙම ආයතනය මෙය පවත්වාගෙන යන්නේ. ඔය මුදලවත් අපිට ලැබෙන්නේ නැති වෙයි.දැන් අර බස්නැවතුම්පොළ ඉදිරිපිට ඇති ත්‍රිරෝද රථ ගාල පවත්වන භූමියෙන්. දැන් බලහත්කාරයෙන් ත්‍රීරෝද රථ නවතා ගෙන ඇත.එහෙත් අපිට රොසෙත් එකට එම භූමිය දීමෙන් රු2500/= ක මුදලවත් ලැබෙයි. ඊටත් වඩා ඉන් විශාල සේවයක් සිදු වෙනවා. අපි මෙය එම ආයතනයට නොදුන්නොත් එහි ප්‍රතිකාර ගැනීමට පැමිණෙන රෝගින් වෙනත් ස්ථානයක වාහනය නතර කර පැමිණිමෙන් පිඩාවට පත් වෙයි. මෙය එම ආයතනයට දීමෙන් ජනතාවටයි මින් සහනය සැලසෙන්නේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
එසේ නම් නිකම්ම මෙය දුන්නා නම් හරි. ව්‍යාපාරික ආයතනයක රථගාල් පිළිබඳව මිල ගණන් තීරණය කරනු ලබන්නේ එම ආයතනයි. නගර සභාවේ දුර්වලතාවය නිසා තමයි බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති භූමියේන් මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත්තේ. ඒ සඳහා අපි නිසි ක්‍රමවේදයක් සකසා මුදල් අයකර ගත යුතුයි. ගන්න බැරිනම් කරන්න දෙයක් නැහැ. යම් දෙයක සාධාරණීකරණයක් තිබිය යුතුයි මාසයකට අයවිය යුතු මුදල පිළිබඳව. දැන් එය ගොඩක් දුරට තිබේ.සමහර අය බලපත්‍ර ගන්නවා. බලපත්‍ර නොගන්නා පුද්ගලයෙනුත් ඉන්නවා.එහෙම වෙන්න බෑ. කාටත් සාධාරණ විය යුතුයි

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙම මුදලඅයකරනු ලබන්නේ වසරකටද? නැතිනම්මසකට ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**
මාසයකට නම් කමක් නෑ. එසේ නම් ඒ සඳහා අපි එකඟයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එසේ නම් වසරකට මෙම මුදලට බදු දීමට සභාව විසින් තීරණය කරන ලදී.

තීරණය:-
අම්බලන්ගොඩ කුලරත්න පාරේ පිහිටි බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය ඉදිරිපිට භූමිය 2018.11.01 දින සිට 2019.10.31 දින දක්වා කාලයකට බදුදිම සඳහාත් ඒ වෙනුවෙන් මාසිකව රු.30634.00 ක බදු මුදලක් ලබා ගැනිමටත් අනුමැතිය ඉල්ලිමට අනුව මේ සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**03.21** අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමෙයේ සභාපතිතුමා විසින් අම්බලන්ගොඩ **(පැරණි) බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයේ බදු ගිවිසුම්** දිර්ඝ කිරීම **2018.09.28** ලිපි ගොනුව සභා ගත කිරීම.

අම්බලන්ගොඩ **(පැරණි)** ගෘහස්ථ **බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයේ** බැඩ්මින්ටන් සංගමයේ සභාපතිතුමා විසින් බදු ගිවිසුම 2018.10.31 දිනෙන් අවසන් වේ. එකි බදු ගිවිසුම2019 වර්ෂය සඳහා දිර්ඝ කිරීම ට නියමිතව ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය මඟින් පාලනය වන කුලරත්න පාරේ පිහිටි ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය බදු දීම සම්බන්ධව බැඩ්මින්ටන් සංගමෙයේ සභාපතිතුමා විසින් බදු ගිවිසුම දීර්ඝ කර කිරිම සම්බන්ධ ලිපිය ඉදිරිපත් කරමි.බැඩ්මින්ටන් සංගමයට RO මහතාගේ තීරණය අනුව අම්බලන්ගොඩ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය බදු ගිවිසුම 2018.11.01 සිට 2019.12.31 දින දක්වා මාසිකව රු 4200+ vat+Nbt සමඟ සම්පූර්ණ මුදල රු.4914/= මුදලක් අයකිරීම සුදුසු බවට යෝජනා කර ඇත. එය අනුමත කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , වසර ගණනක සිට මෙය අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයට බදු දෙනු ලබනවා. එය කිසිම ගැටලුවක් නැත. නගරයේ සහ පාසල්වල දරුවන්ගේ ක්‍රීඩා දියුණු කිරීමට සඳහා එය යෙදවීම ගැන. මම සභාවට යෝජනාවක් කරනු ලබනවා අපි මෙය දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන් දියුණු කිරීමට බැඩ්මින්ටන් සංගමයට ලබා රු.4200 ක් වැනි මුදලකට ඔවුන් මේ සඳහා ක්‍රිඩකයන්ගෙන් යම් මුදලක් අයකර ගනී. මෙය වසරකට නොදී මාස තුනකට පමණක් මෙම ක්‍රීඩාංගනය බදු දෙන ලෙස. මේ සඳහා අපේ නිලධාරින් ලවා මෙහි වාර්තාවක් ගත යුතුය.මේ සඳහා දරුවන්ගෙන් අධික මුදලක් පැයකට අයකරනු ලබයි.අපි මෙය දෙන්නේ දරුවන්ගේ ක්‍රීඩාව දියුණු කිරීම සඳහායි. අපි මෙය රු.4200 ක් වැනි අඩු මුදලකට ලබා දුන්නාත් අපිට මේ සඳහා සභාවට ඊට වැඩි ආදායම් මාර්ගයකි. මා ඉල්ලා සිටින්නේ මෙය මාස තුනකට පමණක් බදු ගිවිසුම් දිර්ඝ කර මේ සඳහා සොයා බලා සම්පූර්ණ වාර්තාවක් ලබා ගෙන කමිටුවක් පත් කර ඊලඟ පියවරට යන ලෙස මා යෝජනා කර සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , උප සභාපතිතුමා විසින් ගෙන එනු ලබන යෝජනාව ඉතාමත් වැදගත් යෝජනාවකි. මොකද අපි මේ සඳහා අපි මහජනතාවගේ , දෙමාපියන්ගේ අදහසුත් විමසා බලා කටයුතු කරමු. උපසභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , අපි මෙම බැඩ්මින්ටන් ක්‍රිඩාංගනය ඉතිහාසයේ යම් දවසක අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයට බදු දීමට ඉදිරිපත් වුණා.ඒ ඉදිරිපත් වීමේ පරම චේතනාව වුයේ අම්බලන්ගොඩ දිළිඳු පාසල් නගා සිටුවිම

සඳහායි . එම දරුවන්ගේ ක්‍රීඩා හැකියාවන් දියුණු කිරීමසඳහායි. මේ සඳහා ඉදිරිපත් වුයේ එම දෙමාපියන්ගේ දරුවන්ට සාධරණ ලෙස ඉතාමත් අඩු මුදලකට ලබා දිම සඳහායි. නමුත් අද වෙනකම් අපි සභාව දන්නේ නෑ මෙම බැඩ්මින්ටන් සංගමයේ ක්‍රියාකාරිත්වය හෝ අයකරන ගාස්තු හෝ මෙහි ඇතුලත පරිපාලනය, කුමන ක්‍රමවේදයකට මෙය දරුවන්ට ලබා දෙනවාද කියා. මම ද්වේශයෙන් නෙමේ කතා කරන්නේ. ඉතාම ශ්‍රද්ධාවෙන් තමයි කතා කරන්නේ. ඔවුන් සමහර විට ඉතාමත් හොඳ වැඩපිළිවලක් මේ සඳහා අනුගමනය කරනවා ඇති. නමුත් අපිට මේ ගැන දැනගන්න බෑ. අපි අවුරුද්දකට වරක් මෙය බදු දෙනවා. එතැනින් එහාට ඒ සංගමය විසින් එය ක්‍රියාත්මක කරගෙන යනවා. ඉන් ජනතාවට ලැබෙන සෙත පිළිබඳව අපි දැනුවත් වී නැත. මා කරුණාවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා කමිටුවක් පත් කරලා මෙම සංගමයේ විගණනය කරන ලද ගිණුම් වාර්තා අප වෙත ලබා ගන්නා ලෙස , එය සේවයක් වශයෙන් බදු ගිවිසුමට මෙම විශාල ගොඩනැගිල්ල ලබා දෙනවා නම් එම සංගමයෙන් විසින් නගරයේ ජනතාවට එම පාසල් දරුවන්ට ලබා දුන් සේවය ඒ අයකරන ලද ගාස්තු වලින් කරන ලද සේවය පිළිබඳ ව අපිට වාර්තාවක් ලබා ගන්නා ලෙස. ඒ සඳහා මා ඉල්ලා සිටිනවා ඒ අනුව මාසයක් ඇතුලත එම වාර්තාව පරිශීලනය කර බැඩ්මින්ටන් සංගමය විසින් දිළිදු දුප්පත් දරුවන්ගේ ක්‍රීඩාව නඟා සිටුවීමට කරන ලද ඌනතිය පිළිබඳ කැපවීම පිළිබඳ සොයා ඉදිරියට මෙම බදු ගිවිසුම දීර්ඝ කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මේ සඳහා අපි මාස තුනකට දීර්ඝ කරමු. මේ සඳහා වාර්තාවක් ලබා ගැනීමට ඒ පිළිබඳව සොයා බැලීමට මන්ත්‍රීවරු කණ්ඩායමකුත් නිලධාරින් කිහිප දෙනෙකු පත් කරමු.ඒ සඳහා RO මහත්වරු දෙදෙනාත් ,උපසභාපතිතුමා , ධම්මික මන්ත්‍රීතුමා , සරත් චන්ද්‍ර මන්ත්‍රීතුමා,රාහුල මන්ත්‍රීතුමා සෝභිත මන්ත්‍රීතුමා සහ සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා , එම කමිටුව සඳහා පත් කරමු.

තීරණය:-
අම්බලන්ගොඩ නගර සභාවේ පැරණි ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගනය අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය වෙත බදු දිමේ ගිවිසුම 2018.11.01 සිට 2019.12.31 දින දක්වා දිර්ඝ කිරිම සඳහාත් මාසික මුදල රු.4200.00 * VAT *NBT සමඟ අය කිරිම සඳහාත් සහ අනුමැතිය ඉල්ලීම සම්බන්ධයෙන් සාකච්ඡා කළ සභාව මේ සම්බන්ධයෙන් මාස 03 කට දිර්ඝ කොට නිලධාරින් නියෝජනය සඳහා ආදායම් පරික්ෂක නිලධාරින් දෙදෙනාත් ගරු මන්ත්‍රීතුමන්ලා අතුරින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා , ගංගේ සරත් ශ්‍රීලාල් මහතා ඇතුලු පිරිසෙන් සමන්විත කමිටුවක් මගින් මේ සම්බන්ධව ගනු ලබන තිරණය සභාව වෙත ඉදිරිපත් කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(04)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නැත

**(05)** යථා පරිදි කල් දී ඇති යෝජනා

**05:01** ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා

**05.01.01** 2019 වර්ෂයේ අයවැය ලේඛනය සහා අනුමතිය සඳහා ඉදිරිපත් කිරීම.

<u>ගරු සභාපති ඩබ්.එම්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
පලමු යෝජනාව ලෙස 2019 වර්ෂය සඳහා අයවැය ලේඛනය ඉදරිපත් කිරීම. මා විසින් අම්බලන්ගොඩ නගර සභාවේ 2019 වර්ෂයේ අයවැය යෝජනා ඉදිරිපත් කරනවා ඒ ඉදිරිපත් වන යෝජනාවේ 2019පුනාරාවර්තන ආදායමරු.152916077/= කුත් ප්‍රාග්ධන ආදායම රු.140003000 /=ලෙසත් මුළු ආදායම රු.166919077/= ලෙසත් ද , පුනරාවර්තන වියදම රු.135837709/= ක්ද ප්‍රාග්ධන වියදම රු.31069000/= ලෙසත් මුළු වියදම රු.166906709/= ලෙසද දක්වා ඇත. අතිරික්තය රු.12368/= ක් ලෙස යෝජනා කරමි. මෙම වසර සඳහා අපි වැඩසටහන් 6 ක් යටතේ

අයවැය කෙටුම්පත සියලුම මන්ත්‍රීවරුන්ට ලබා දී ඇත. සියලුම මන්ත්‍රීවරුන්ට අමතරව , සියලුම වැසියන් ද සහභාගි වන ආකාරයේ දැන්වීම් පල කර රැස්වීම් සෑම කොට්ඨශයකම පවත්වා ඇත.රැස්වීම් 13 බැඟින් පවත්වා ඇත. සෑම කොට්ඨාශයකම ජනතාවට ලබන අයවැය සඳහා වැඩසටහන් කුමන ආකාරයකින් විය යුතු දැයි මහජනතාවගේ අදහස් විමසා තිබේනවා.එ වගේම ජනාතව මඟින් ලබා ගත් යෝජනා ප්‍රමුඛතාවය ලබා දීම සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන් සමඟ 2018.10.11වන දිනයෝජනාවක් ලෙස එකතු වි සකච්ජා කර පෙල ගස්වා තිබේනවා. නැවතත් අයවැය පිළිබඳ සාකච්ජාවක් මෙම මන්ත්‍රීවරුන් සමඟ 2018.11.08 වන දින සාකච්ජාවක් පවත් වන ලදී. මෙම අයවැය සියලු දෙනාගේ එකඟත්වයෙන් හා  මෙය සියළු දෙනාගේ යෝජනා සලකා බලා සකස් කරන ලද අයවැයක්.ඇත්තවශයෙන්ම මෙය මගේ අයවැයක් නොව ඔබගේ අයවැයක් වශයෙන් තමයි ඉදිරිපත් කොට තිබෙන්නේ.මේ අයවැය මේ ප්‍රදේශයේ ජනතාව විසින් ලබාදුන් අයවැයක්.ඒ වගේම මහජන නියෝජිතයන් මගින් සම්මත් කරන ලද අයවැයක් වශයෙන් අපි ඉදිරිපත් කරනවා.මෙහිදී අපි වැඩසටහන් 6ක් යටතේ අයවැය සාරාංශය ඉදිරිපත් කර තිබෙනවා.1 වැනි වැඩසටහන වනුයේ පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩලය, 2 වන වැඩසටහන සෞඛ්‍ය සේවා, 3 වන වැඩසටහන භෞතික සැලසුම් , මංමාවත් හා ගොඩනැගිලි වශයෙනුත් 5 වන වැඩසටහන ලෙස මහජන උපයෝගීතා සේවා හා 6 වන වැඩසටහන ලෙස සුභ සාධක සේවා ලෙස වැඩසටහන් 6කින් ඉදිරිපත් කර තිබෙනවා.මෙහිදී ප්‍රථමයෙන්ම කිව යුතුයි අපේ ප්‍රධානම ආදායම වන්නේ වරිපනම් බදුයි. පසුගිය වසරේ අප ඡන්දයට යන විට ජනතාව අපට කියපු දෙයක් තමයි අධික බදු බරක් ඔවුනට දැරීමට සිදුව තිබෙන බව.නගර සභාව මගින් අවස්ථානුකූලව බදු කුලී ඉහළ නැංවීම තුළ ඒ බදු බර පැනනැගී තිබෙනවා.අපි එදා ජනතාවට දුන් පොරොන්දුවක් තමයි මේ අයවැයේදී ජනතාවට යම්කිසි සහනයක් ලබාදිය හැකිනම් අප එය උපරිමයෙන්ම ඉෂ්ට කරන බව.ඒ අනුව මේ වසරේ නගර සභාවේ අයවැය මගින් අය කරන ලද වරිපනම් බදු ප්‍රතිශතය අප අයකොට තිබෙන්නේ ව්‍යාපාර ස්ථාන වලින් 12% කුත්, ගෘහස්ථ 8%කුත් වශයෙන්.මෙවර අපි ඒ ජනතාවට වූ පොරොන්දුව අනුව ඔවුනට යම් සහනයක් සැලසිය යුතුයි.ජනතාව ජීවත්වීම සටනක යෙදී සිටින අවස්ථාවක, නවරජයක බලාපොරොත්තුවෙන් සිටින අවස්ථාවක ඒ රජයේ ප්‍රතිපත්ති අනුකූලව යාම උදෙසා අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා පුටුවට ඇවිත් පළමුවෙන්ම කළේ රටේ ජනතාවගේ යම්කිසි බදු බරක් අඩු කිරීම.ඒ ඔස්සේ අනුගත වෙමින් මම පළමුවෙන්ම යෝජනා කරනවා මෙම බදු ගැනීමේ ප්‍රතිශතය 1% කින් අඩු කිරීමට.ඒ අනුව ගෘහස්ථ ස්ථාන සඳහා 7% ක ප්‍රතිශතයකුත් , වාණිජ දේපලක් සඳහා අය කරනු ලබන මුදල 11% ක් ප්‍රතිශතයකුත් ලෙස අඩු කිරීමට මා යෝජනා කරනවා.මෙසේ 1% කින් බදු මුදල් අඩු කරන විට සභාවට රු.2500000/= ක මුදලක් අහිමි වනවා. නමුත් අඩුවන මුදල යම් යම් ක්ෂේත්‍ර තුළින් නැවත උපයා ගැනීමේ ක්‍රමවේදයක් අපි ඇති කොට තිබෙනවා.ඒ නිසා ප්‍රදේශයේ සියළු ජනතාවට පැවරුනු බදු බර අඩු කිරීම සඳහා යම්කිසි පියවරකට යන අවස්ථාවේ මා සියලු මන්ත්‍රීවරුන්ට මේ සඳහා සහාය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම මෙම වසරේදී අපිට අපේක්ෂිත මුදල් ලබා ගත හැකියි. ඒ වගේම නැවුම් බලාපොරොත්තුවක් තැබිය හැකියි , අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා පාලනය කරන සෑම අවස්ථාවකදීම සෑම කොට්ඨාශයකම නාගරික මන්ත්‍රීවරයා බලවත් වන ආකාරයෙන් එතුමා අපට මුදල් ලබා දුන්නා.එතුමන් සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකටම රු.1000000/= ක මුදලක් ලබා දුන්නා.ඒ නිසා අප බලාපොරොත්තුවනවා ඒ වැඩසටහනම සෑම කොට්ඨාශයක් තුළම ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ප්‍රබලත්වයට පත් වන ආකාරයෙන්  සිදු කරාවි කියා.ඔහුගේ යෝජනා සාක්ෂාත් කර ගැනීමටත් ජනතාව දුන් පොරොන්දු ඉටු කිරීමටත් අවශ්‍ය ශක්තිය මේ නව රජය තුළින් උපදීවි යන්න මාගේ අදහසයි.ඒ වගේම සමස්ථ අයවැයේදීම වියදම් කරන ආකාරය , ආදායම් උපයන ආකාරය  පිළිබඳ සාකච්ඡා කිරීමට මවිසින් රැස්වීම් 15 ක් පැවැත්වූවා.ඒ 15දීම සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස්, සියලු නිළධාරීන්ගේ අදහස් , අපේක්ෂා සලකා බැලුවා.මට මතකයි ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන් මට පෞද්ගලිකව කිවුවා ගස් කැපීමේදී අය කරන මුදල වැඩි බව.එතුමන් ඒ රැස්වීමට සහභාගී නොවුනත් එතුමාගේ නම මතක් කොට අපි ඒ ගාස්තු අඩු කළා.2018.11.18 වන දින පැවති රැස්වීමට සහභාගී වූ අවස්ථාවේදී මේ මුදල අඩු කරන්න කියා ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන් මගෙන් ඉල්ලීමක් කළා.ඒ අනුව සියලුම මන්ත්‍රීවරුන්ගේ එකඟත්වයෙන් මා එය අඩු කළා.මෙම අයවැය සකස් කිරීමේදී නිළධාරී මණ්ඩලයත් විශේෂයෙන්ම කළමණාකරණ සහකාර රෝෂිනී මහත්මියත්, ප්‍රමිලා මහත්මියත් මේ සෑම රැස්වීමකටම සහභාගී වී මා හට උදවු කළා.ඒ වගේම ඇස්තමේන්තු ලබාදීමේදී කාර්මික නිලධාරීන් සියලු දෙනා උදවු කිරීම සම්බන්ධයෙන්ද අපගේ ස්තූතිය පුද කරමින් අම්බලන්ගොඩ නගරයේ 2019 වසර සඳහා කළයුතු වැඩසටහන් සියල්ලම මෙහි පෙලගස්වා තිබෙන අතර ඒ අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, මම දැනගන්නට කැමතියි ගස් කැපීමේ හෝ සැලසුම් අනුමත කිරීමේ ගාස්තු කොපමණ අඩුවී තිබෙනවාද කියා.

**ගරු සභාපති ඩබ්.එම්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය රුපියල් එක්දහස් හත්සිය ගණනේ සිට රු.1000 /= දක්වා අඩු කරනු ලැබුවා. මෙය රු.1750/= දක්වා මුදලක් තමයි එහි තිබුණේ.

**ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත් චන්ද්‍ර මහතා කතා කරමින්**

මා යෝජනා කරනවා එය රු.500/= දක්වාවත් අඩු කරන ලෙස.

**ගරු සභාපති ඩබ්.එම්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙහි මේ මුදල තිබෙන්නේ අයහපත් ප්‍රතිඵල මත.දැනට අවුරුදු 21 ක් මම අම්බලන්ගොඩ නගර සභාවේ සභාපතිධූරය දැරුවා.එම අත්දැකීම් අනුව මේ ගස් කැපීමේදී යාබද ගෙවල් දෙක යාලුවෙලා ඉන්න තාක්කල් මේ ගස් වලින් කිසිදු අවධානමක් නෑ.නමුත් තරහ වුන ගමන් මේ ගස් ගැටලු පැන නගිනවා.එහිදී ඔවුන්ගේ තිබෙන පුද්ගලික ගැටලු විසදා ගන්න හදන්නේ නගර සභාව හරහා.මෙහිදී අඩු ගණනක් දැම්මොත් මේ සදහා වැඩියෙන් තරග කරන්න ඉදිරිපත් වනවා.අන්තිමට නගර සභාවට අනෙක් පාර්ශවය සමග ගහගන්න සිදු වනවා.නැත්තම් ඔබතුමා කියන ගාස්තුව පනවන්න පුලුවන්.නමුත් අධෛර්යයට පත් කිරීම සදහා තමයි මෙම ගාස්තු අය කරන්නේ. 1999 පළාත් පාලන පිළිබද කොමිෂන් සභාවේදී පැහැදිලිව සාක්ෂි දීලා මා කියා සිටියා මේ ගස් කැපීමේ බලය නගර සභාවෙන් ඉවත් කොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දෙන ලෙස.මොකද මේක නීරස දෙයක්.ජනතාව රණ්ඩු වනවිට අපිත් කියනවා ගහ කපන්න කියා.එය තමයි මෙහි තිබෙන තත්වය.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, අපි සතුටු වනවා අලුත් පෙරලියක් යටතේ අද මුලින්ම සහභාගී වීමට හැකිවීම ගැන ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ගේ දර්ශනය තුළ හිටපු ජනපති වත්මන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ද සමග සම්බන්ධ වෙමින් නව ගමනක් යාමට සැරසෙන මේ මොහොතේ ඔවුන්ගේ බලාපොරොත්තුත් ඉටු කරමින් ඒ වගේම දකුණු පළාත් සභාවේ මහ ඇමතිතුමන් ප්‍රමුඛ කවදත් මහජනතාව වෙනුවෙන් සේවය කරන ඒ නායකයන් වෙනුවෙන් පෙනී සිටිමින් ඔබතුමන් මෙවර ඉදිරිපත් කරන ලද අම්බලන්ගොඩ නගර සභාවේ අයවැය වෙනුවෙන් අප ස්තූතිවන්ත වනවා.මොකද ඒ අයවැය තුළ ගැබ් වී ඇති පරිදි කොට්ඨාශ 13 යෝජනා සමග ගම්වැසියන්ගේ අදහස් වලටද මූලිකත්වය දරා ඒ අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීමට අපගේ සහයෝගය ලබා දෙනවා. කුමන ආකාරයකට පැමිණියත් අපි කවුරුත් පැමිණ සිටින්නේ මහජනතාවට සේවය කිරීමට.ඒ වගේම නගර සභාව විසින් දෙන ඔවුන්ගේ යටිතල පහසුකම් ඒ වගේම උප්පත්තියේ සිට මරණය දක්වා දෙන සේවය ඔවුනට සැපයීමට.ඒ නිසා ඔබතුමන් අයවැයේ සදහන් කළ සහන නිසි ආකාරයෙන් ලබා දෙන්න අපිත් සහයෝගය ලබා දෙනවා.ඉදිරියේදී මැතිවරණයක්ද බලාපොරොත්තු වන වකවානුවක ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුත් එක්සත්ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් ඇතුලු අපි සියලුදෙනා සහයෝගයෙන් සංවර්ධන කටයුතු සිදු කරමින් අපේ නගරය අපි හදමු කියා මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මම හිතන්නේ අද සුවිශේෂී වූ දවසක්. පොදුජන එක්සත් පෙරමුණ බලයට පැමිණ අභිනවයෙන් ඉදිරිපත් කරන මංගල අයවැය.ඒ වගේම මේ අයවැය තුළ අපි පසුගිය වසරත් සමග සංසන්දනය කළහොත් සාම්ප්‍රදායිකව ඒ නිළධාරීතුමියන් ලබාදී ඇති ඇස්තමේන්තු අනුව 2019 වසර සඳහා අයවැය සාරාංශය කොටස් 6කට බෙදා තිබෙනවා.එහිදී මන්ත්‍රීවරයකු ලෙස මා දකින ආකාරයට 1 වන වැඩසටහනේ ඇති පරිපාලන හා කාර්ය මණ්ඩලයේ වියදම් අනිවාර්යයෙන් දැරිය යුතුයි.2 වන වැඩසටහන වන සෞඛ්‍ය සේවය වෙනුවෙන් අනිවාර්යයෙන්ම මුදල් ප්‍රතිපාදන වෙන් කළ යුතුයි.3 වන වැඩසටහන භෞතික සැලසුම් , 4 මංමාවත් හා ගොඩනැගිලි වශයෙනුත් 5 වන වැඩසටහන ලෙස මහජන උපයෝගීතා සේවා හා 6 වන වැඩසටහන ලෙස සුභ සාධක සේවා ලෙස ඉදිරිපත් කර තිබෙනවා මෙහිදී මා කතා කිරීමට අදහස් කරන්නේ භෞතික සැලසුම් , මංමාවත් හා ගොඩනැගිලි යන

මාතෘකාව.මොකද අනෙක් මාතෘකා 4 අප අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුව තිබෙනවා.මේ සඳහා අපේ නගරයේ බදු ගෙවන ජනතාවගේ ආදායම හැරුණු කොට අපට පුනරාවර්තන ආදායම ලෙස ලබා දී තිබෙනවා වරිපනම් බදු අදායම, කුලී ආදායම, බලපත්‍ර ගාස්තු ආදි වශයෙන් මේ එකතුව හැරුණු කොට විවිධ ලැබීම් සහ විකිණීම් , ආදායම් ආධාර වැනි මේ සමස්ථයේ එකතුව තමයි ප්රග්ධන ආදායම් විදියට සමස්ථ ආදායම වියදමට සමාන වන ආකාරයෙන් දක්වා තිබෙන්නේ.මෙහිදී අපේ ගණකාධිකාරීතුමිය අපට පෙන්වා දී තිබෙනවා අංක 3 වැඩසටහන යටතේ වියදම් තිබෙන ප්‍රමාණය.මෙය 2018 වසරේදී ඇස්තමේන්තු කර තිබෙනවා 30423562/= ගණනක් ලෙස.මා හිතන්නේ ලැබීම් දෙස බැලූවිට 2018 ජුනි වනවිට අපට ලැබී තිබෙන්නේ ඉතාමත් අඩු ප්‍රමාණයක්.අනෙක් සියලුම අංශ සඳහා අපේ නගර සභාවේ ආදායම යම් මට්ටමකට ප්‍රමාණවත් වුවත් භෞතික සැලසුම් සඳහා අවශ්‍ය මුදල් අපට අපගේ දේශපාලන අධිකාරිය විසින් සැපයිය යුතුව තිබෙනවා.එවිට අප බලාපොරොත්තු වනවා එක් කොටසක් අභියෝජනය කරන රජය  විසින් මේ මුදල් සඳහා දායකත්වය අපේ මන්ත්‍රීවරුන් හරහා පළාත් සභා මන්ත්‍රීවරුන් හරහා මේ ප්‍රතිපාදන අපට ලැබෙයි කියා.එසේ වුනොත් තමයි 2019 වර්ෂයට අම්බලන්ගොඩ නගරයේ අප බලාපොරොත්තු වන සංවර්ධනය සිදුකළ හැකි වන්නේ.මා මේ කතා කරන්නේ ප්‍රාග්ධන වියදම් සම්බන්ධව. ප්‍රාග්ධන වියදම් ලෙස සඳහන් කරන්නේ මංමාවත්, ගොඩනැගිලි, පාලම්, බෝක්කු, කාණු.අද වනවිට අම්බලන්ගොඩ කාණු පද්ධතියේ සමස්ථයක් වශයෙන් ගැටලු පවතිනවා.පාරවල් සම්බන්ධයෙන් ඔබතුමාගේ පසුගිය පාලන කාලයේ ගම නැගුම යටතේ මුදල් වෙන්කොට අම්බලන්ගොඩ නගරයේ බොහෝ මාර්ග කොන්ක්‍රීට් කොට, කාපට් කොට ඒවා සකස් කොට තිබෙනවා.නමුත් අම්බලන්ගොඩ නගරයේ සමස්ථ කාණු පද්ධතිය සඳහා රජයේ මුදල් ලබා ගැනීමේ අත්‍යවශ්‍යතාවක් පැන නැගී තිබෙනවා.ඒ අනුව සියලුම මන්ත්‍රීවරුන්ට ලබාගත හැකි ප්‍රතිපාදන ලබාගෙන දකුණු පළාත් මහ ඇමතිතුමාගෙන් අම්බලන්ගොඩ නගර සභාවට ගත හැකි උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කරන ලෙස මා මේ මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.අප මේ වනවිටත් කසළ තුනී කිරීම සඳහා යන්ත්‍රයක් ලබා ගැනීමට ඉල්ලීමක් කර තිබෙනවා.එයත් රු.4500000/=ක් රු.5000000/=ක් අතර මුදලක් වනවා.එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අපේ මන්ත්‍රීවරු හතර දෙනෙක් සිටිනවා.ආණ්ඩු පක්ෂයේ හෝ ඔවුන්ගේ ඉදිරිපත් වීම ඔවුන්ගේ කැපවීම අපි පසුගිය කාලයේ දැක්කා.ඔවුනට අම්බලන්ගොඩ නගර සභාවට  මුදල් ගෙන ඒමට හැකි වුනත් නොහැකි වුනත් ඔවුන් ඒ සඳහා ප්‍රතිපදන වෙන් කර ගන්න විශාල වෙහෙසක් දැරුවා.අපි ඒ ගැන ස්තූතිවන්ත වනවා.ඒ වගේම ඒ ගැන සන්තෝෂ වනවා.රජය මොන පැත්තට හිටියත් අපි නගර සභාවක් ලෙස අපේ සියලුම මන්ත්‍රීවරු මොන පක්ෂයෙන් ආවත් අම්බලන්ගොඩ නගරයේ ජනතාවට සේවය කිරීමටත් ඔවුන්ගේ සුභ සාධනය වෙනුවෙන් කටයුතු කිරීමටත් පොරොන්දු වී සිටිනවා.එහිදී අපි ඉදිරිපත් කරන ප්‍රධාන තීරකය තමයි ඔබතුමන් ඉදිරිපත් කරන අයවැය.ඒ අනුව එය සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගත යුතුයි.ඒසඳහා ආදායම් එකතු කිරීම ඔබලාගේ යුතුකම වනවා.වරිපනම් බදු, කඩකුලී ආදී ආදයම් එකතු කර ගැනීම නිළධාරීන්ගේ යුතුකම හා වගකීම වනවා.මේ ආකාරයෙන් අයවැය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ඔබතුමන්ට ස්තූතිවන්ත වනවා.ඒ වගේම මා මේ නගර සභාවේ වසර  16 ක 17 ක මන්ත්‍රීවරයෙක් ලෙස මා දන්නා නගර සභා ඉතිහාසය තුළ කිසිම දිනක නගරාධිපතිවරයකු නගරයේ ජනතාවට වෙනුවෙන් වරිපනම් බදු අඩු කිරීමට කටයුතු කොට නෑ.මෙය 1% ක ප්‍රතිශතයක් වෙන්න පුලුවන්.නමුත් මේ ගන්නා පියවර අභියෝගයක්.ඒ නිසා මම දන්නා තරමින් අපේ නගර සභා ඉතිහාසය තුළ වරිපනම් බදු ප්‍රතිශතය අඩු කරන්න තීරණය කොට නෑ.නිරන්තරයෙන් අපට සිදු වී තිබුනේ එය වැඩි කරන්න.ඒ අනුව ගෘහස්ථ හා වාණිජ වරිපනම් බදු ප්‍රතිශතය 1% අඩු කිරීමට ගත් පියවර පිළිබද අප ප්‍රශංසා කළ යුතුව තිබෙනවා.දේශපාලන පොරොන්දු කෙසේ වුනත් පොදුජන එක්සත් පෙරමුණ විදියටත් පාලක පක්ෂය විදියටත් ගරු සභාපතිතුමා ඉදිරිපත් කල පරිදි නගරයේ ජනතාව වෙනුවෙන් යම්කිසි සහනයක් , ආධාරයක් අපට දිය හැකි නම් අපි ඊට සහයෝගය දක්වනවා.අපේ සියලු මන්ත්‍රීවරුන්ට මේ පිළිබද සතුටු විය හැකියි.මොකද මේ ගැන ඔවුන්ගේ ගමේ ජනතාවට ප්‍රකාශ කළ හැකියි.සභාවක් ලෙස මේ වරිපනම් බදු ප්‍රතිශතය අපට හැකි මට්ටමකට අඩු කර ගැනීමේ මාවතකට අප පැමිණිය යුතුයි.මොකද ගමක් නගරයක් දියුණු වෙද්දී ඕනෑම නගරයක ඕනෑම රාජ්‍යක වරිපනම් බදු වැඩි වීමක් මිසක් අඩු වීමක් බලාපොරොත්තු විය නොහැකියි.මා දන්නේ නෑ ලංකාවේ වෙන නගර සභාවල මේ ආකාරයෙන් වරිපනම් බදු අඩුකොට තිබෙනවාද කියා.මා දන්නා තරමින්නම් එසේ වී නෑ.නමුත් අපි මේ ආකාරයෙන් වරිපනම් බදු 1% කින් හෝ අඩු කිරීම ඉතිහාසගත වනවා.ඒ නිසා ලබන වසර වනවිට තවදුරටත් අඩු කිරීමට අප උත්සාහගත යුතුව තිබෙනවා.මෙය ඉතාමත් වෙහෙසගත කාර්යයක්.අයවැය යනු අය හා වැය දෙක සමාන විය යුතුයි.සත 50 ක් හෝ වෙනස් වුනොත් මේ අයවැය තුලනය වන්නේ නෑ.ලක්ෂ 1669 ක ගනුදෙනු තුලනය කොට අප වෙත ලබාදීම සඳහා දැඩි වෙහෙසක් දැරූ ලේකම් තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිළධාරීන්ට මාගේ විශේෂ ස්තූතිය පිරිනමනවා.

**ගරු නගර සභා මන්ත්‍රීනී ඊ.එම් .අයිරාංගනී මහත්මිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,අගමැතිතුමා අද ඉදලා හෙට වනවිට වෙනස් වේවිද දන්නේ නෑ.එහෙම සාමාජයක අපි ඉන්නේ.අගමැතිතුමා කවුරු වුනත් අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරු ලෙස අපි ඔබතුමන්ට ශක්තියක් වනවා.ඒ අනුව ඔබතුමන් සකස් කරන ලද මේ 2019 අයවැය සඳහා එකිසත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරියක ලෙස මගේත් සියලු මන්ත්‍රීවරුන්ගේත් සහාය ඔබතුමන්ට පළ කරනවා.අයවැය හදන්න ආරම්භ කරන විට අගමැතිතුමන් ලෙස කටයුතු කළේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා.නමුත් එය අවසන් වනවිට වෙනත් අගමැති කෙනෙක් ආවත් අපි මෙය හොදට කරගෙන යමු.මොකද මේක අපේ රට, අපේ ගම, අපේ නගරය.ඉහළ පෙළේ ජනාධිපති කෙනෙක් සමග ජීවත් වන රටක බොහොම කණගාටු වනවා.අපිඅවංකවම මිට වඩා බුද්ධිවත් කියා හිතනවා. ඇත්තටම මගේ ගරු සභාපතිතුමා ඊට වඩා බුද්ධිමත් .මොකද රටේ එවගේ නිතියක් රජයන මොහොතක මොකද අපි නොසිතන මොහොතේ නොසිතන දේවල් සිදු වනවා.නමුත් අපි එකාවන්ව නගරය දියුණු කරන්න වැඩ කරමු.ඔබතුමාට මාගේ සම්පූර්ණ ශක්තිය දෙනවා.ඒ වගේම මේ අයවැය සකස් කරන්න දැඩි වෙහෙසක් දරා තිබෙනවා.මෙය සැකසීමේ දි සියලුම කාර්ය මණ්ඩලය මේ සඳහා දැඩි වෙහෙස මහන්සි වි ඇත. 2019 වසරේ අයවැයට කිසිම ප්‍රශ්නයක් වන්නේ නෑ.මොකද ෂාන් විජයලාල් මැතිතුමාගෙන් පොඩි පොඩි ගැටලු තිබුණා. සමහර දේවල් අනුමත් නොකිරීම සම්බන්ධව .දැන් ඔබතුමාට කිසිම ප්‍රශ්නයක් නෑ.ගරු ෂාන් විජයලාල් මැතිතුමා ඕනෑම දෙයකට සහයෝගය ලබාදේවි.මොකද දැන් දෙගොල්ලෝ එකතු වු නිසා. 2019 වසරේ අම්බලන්ගොඩ නගර සභාවට හොඳට වැඩ කිරීමට හැකි වෙයි.කිසිම අභියෝගයකට භය නැතිව මුහුණ දිමට හැකි වෙයි. හැබැයි ඉතිං එහෙම වුණේ තවත් අගමැති කෙනෙක් පත් වුණොත් අගමැතිතුමන් වෙනස් වෙලා එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් දිවුරුම් දුන්නොත් එහිදී ඕනෑම දෙයකට අපි ඉන්නවා.ඒ නිසා රටේ අගමැති කවුරු වුනත් නගර සභා මන්ත්‍රීවරු ලෙස අපි කිසිම භේදයකින් තොරව බුද්ධිමත් ලෙස 2019 අයවැය සාක්ෂාත් කර ගැනීම සඳහා වැඩ කරමු.නාගරික මන්ත්‍රීවරයෙක් ලෙස මම කිව යුතුයි, ජනාධිපතිතුමන්ට අම්බලන්ගොඩ ආසනයෙන් මම සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා.
අම්බලන්ගොඩ ආසනයේ සෑම වේදිකාවකම කතා කළා.හැබැයි අපි මොමොතකටවත් සිතුවේ නෑ මෙවැනි තින්දුවක් ගනියි කියා .පස්සේ තමයි දැන ගත්තේ.ඒ නිසා ඒ ගැන මගේ කණගාටුව ප්‍රකාශ කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රීනී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ගරු සභාපතිතුමනි,මෙවැනි සිද්ධියක් 2015 ජනවාරි 08 ත් සිදුවුනා.එදත් එතුමා තමයි අගමැති කෙනෙක් පත් කළේ.එදා එහෙම කිව්වේ නෑ වෙන අගමැති කෙනෙක් පත් කරනවා කියා.අද එතුමා ට දොස් කියනවා මහින්ද මහතා පත් කළ නිසා, එය අධිකරණය තීරණය කරාවි මෙය කුමක් නිසාද කළේ කියා.ගරු ජනාධිපතිතුමා තමයි මේ රටේ විධායකය.

**ගරු සභාපති ඩබ්.එම්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අධිකරණය විසින් තීන්දුවක් දෙනු ලැබුවා.

**ගරු නගර සභා මන්ත්‍රීනී ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කතා කරමින්**

ඔව්, ඒ අනුව මේ රටේ විධායකයට පුලුවන් ගැණියෙක් මිනිහෙක් කරන්න හැර වෙන ඕනෑම දෙයක් කළ හැකියි.1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවේ එක්සත් ජාතික පක්ෂ ජේ.ආර් ජයවර්ධන මහතා, 1972 ව්‍යවස්ථාවට තිබුණු අඩුපාඩු සකස් කොට එය සෑදුවේ අපි නෙවෙයි ඔබතුමන්ලා. අපි නෙමේ හැදුවේ .අපි හැදුවේ නැති නිසා තමන් තමන්ටම කර ගන්නවා කියන්නේ ඒ නිසායි. ගරු සභාපතිතුමනි,මෙය අපට මංගල අයවැයක්.2019 වසර සඳහා ඉදිරිපත් වු. මේ අයවැය එන්න කලින් අපිත් හිතුවේ නෑ රටේ මෙවැනි වෙනසක් වේවි කියා.ඒ අවස්ථාවේ අපේ අම්බලන්ගොඩ එක්සත්ජාතික පක්ෂ සංවිධායක ගරු ඩෙනට් පතියන්දුවගේ මන්ත්‍රීතුමා කියා සිටියා ගම්පෙරළිය යටතේ ප්‍රතිපාදන ලබාදෙන බව.අපි බොහොම සන්තෝසෙන් එය අගය කොට කතා කලා.අපි සියලු දෙනා ඒ අවස්ථාවේ එය අභය කළා.අපි සියලු දෙනා එකතු වී සහොදරයන් සේ එකතු වී වැඩ කරමු. ඒ නිසා අපි එහෙම විවෙචනය කරන්නේ නෑ මන්ත්‍රීවරු සියල්ල එකට එකතු වෙලා අපේගම දියුණු කරමු කියලා අපේ නගරය දියුණු කරමු.මොකද රට දියුණු කරන්න තමයි ජනතාව ඡන්දයක් දීලා අපිව මෙතැනට ගෙනැල්ලා තියෙන්නේ.මේ වෙනස ඇති වුනත් නැතත් අපට කොහෙන් හරි ලැබෙන ප්‍රතිපාදන අරගෙන ගම දියුණු කළ යුතුයි.එයට පක්ෂයක් පාටක් අවශ්‍ය නැත. එදා අපිට ඩෙනට් පත්යන්දුවගේ මැතිතුමා ගම්පෙරළියෙන් මුදල් ලබා දෙන බව පැවසුවා.එදින අපි සියලු දෙනාම ඒ සඳහා ආශිර්වාද කළා.දැන් කිසි ගැටලුවක් නෑ අපි එකතුවි වැඩ කටයුතු කරමු. පටු දේශපාලන මති

මතන්තර අපට අවශ්‍ය නෑ ගම හදන්න. කෙසේ වෙතත් 2019 ජනවාරි 05 වනදා වනවිට හොදම තීරණය ලැබේවි.සියලුම වාමාංශික පක්ෂ එකතු වි විරසකකම් ඉවතලා කවුරු ජන්දෙ ඉල්ලුවත් අපේ අම්බලන්ගොඩ නගරයට මන්ත්‍රීවරයෙක් පත් කර ගනිමු .අපිට ප්‍රතිපාදන ලබා ගැනිමට එක්සත් ජාතික පක්ෂයෙන් වුණාත් එය අපිට අශිර්වාදයක් .එතුමා අපිට ප්‍රතිපාදන වෙන් කරාවි.මේ සියලු ප්‍රතිපාදන ගෙන 2019 අයවැය ලේඛණයට අනුව අපේ ගම සංවර්ධනයට සියලුදෙනා එක්ව වැඩ කළ හැකියි.

<u>ගරු නගර සභා මන්ත්‍රිනී නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,ඔබතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද මංගල අයවැය ගැන ඔබතුමාටත් ඔබගේ ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත් මගේ සහෝදර මන්ත්‍රී මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වනවා සාර්ථක අයවැයක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්.නමුත් අපගේ එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීතුමිය අපේ විධායක ජනාධිපතිතුමන් විවෙචනය කිරීම සම්බන්ධයෙන් සභාවක් වශයෙන් විරෝධය ප්‍රකාශ කිරීම අපගේ යුතුකම හා වගකීම කියා මා විශ්වාස කරනවා.මොකද විධායක ජනාධිපති කියන තත්වය අපට ඇතිකළේ ප්‍රථම විධායක ජනාධිපති වන එක්සත් ජාතික පක්ෂයේ නායක ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා.සාමාන්‍ය පන්තියේ ජනාධිපති වන වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඒ විධායකය නොසිතු වෙලාවක පාවිච්චි කිරීම නිසා පසුගිය දිනවල රටේ තත්වය වෙනස් වුනා.මෙය විසදිය හැකි එකම ක්‍රමය වන්නේ ඡන්දයකට යාම බවයි මාගේ අදහස.ජනාධිපතිතුමන්ගේ විධායක බලය එතුමන් මෙතෙක් කල් භාවිතා කළේ නෑ. නමුත් බැරිම තැන තමයි එතුමන් එසේ කළේ.අපේ ප්‍රධාන බලය ජනතාව. මගේ පෞද්ගලික මතය නම් ජන්දයකට යාම මා නිතරම ගරු සභාපතිතුමන්ට කියන දෙයක් තමයි ප්‍රධාන අමාත්‍යතුමන් සමග එකතු වෙලා අපි මේ ගමන යමු කියා.අපේ නගරය හදන්න අපි ඇවිත් තිබෙන්නේ අපි නගරයට ශක්තියක්වෙමු.අපේ වටේ ඉන්න පිරිස් කැමතියි ප්‍රශ්න ඇතිකොට ඒ ප්‍රශ්න ඒ විදියටම තිබෙනවානම්.ඔබතුමාත් ප්‍රධාන අමාත්‍යතුමාත් ජනතාවගේ ප්‍රශ්න කෙරෙහි හොඳ දැක්මත් හොඳ අවබෝධයක් තිබෙන පුද්ගලයන් දෙදෙනෙක්.ඒ නිසා ජනතාව වෙනුවෙන් අම්බලන්ගොඩ නගරය දියුණු කිරීම සඳහා අපේ යුතුකම් ඉටු කිරීමට තිබෙන අනගි අවස්ථාවක් ලෙස මා මෙය දකිනවා.ඒ නිසා සියලු මතභේද පක්ෂභේද අතහැර අපි සියලු දෙනා එක්ව ජනතාව සඳහා යුතුකම් ඉටු කිරීමට පෙළගැසෙමු කියා මා ප්‍රකාශ කර සිටිනවා.ඒ වගේම මෙවැනි අවස්ථාවක ජනතාව අතරට ගොස් ඔවුනගේ ගැටලු සොයාබලා ඒවා තමයි අයවැය සඳහා ඉදිරිපත් කළ යුත්තේ.ඔබතුමා ඔවුන්ගේ අදහස් විමසා බලා ඒ අනුව අයවැය සකස් කළා. ඒ නිසා ඒ සම්බන්ධයෙන්ද ඔබතුමන්ටත් ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයටත් පක්ෂ භේදයකින් තොරව මේ සඳහා සහාය දුන් මාගේ සහෝදර මන්ත්‍රීවරුන්ටත් මනිත්‍රීවරියන්ටත් මාගේ ස්තුතිය පුද කර සිටිනවා.

- පස්වරු 12.15 ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය සභාවෙන් නික්ම ගියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>
මෙය හොඳ අයවැයක් .අපි හිතනවා ජනතාවාදි අයවැයක් ලෙස. මට විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි අයවැයෙන් වරිපණම් බදු අඩු කර අපේ නගරයේ වැසියන්ට සහනය දෙනවා වගේම ඔවුන්ගෙන් අපට අයවිය යුතු වරිපණම් බදු අය කර ගැනීමටත් කුමක් හෝ හොඳ ක්‍රම වේදයක් යෙදය යුතු බව සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද මේ වනවිටත් අපිට විශාල හිගයක් මේ සඳහා පවති . අපේ නගර සභාවට මේ පවතින වරිපණම් බදු එකතු කර ගැනීමටත් හොඳ ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිනවා.

- ගරු නගර සභා මන්ත්‍රිනී ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය පස්වරු 12.22 පමණ නැවතසභාවට පැමිණියහ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර කොඩිකාර මහතා කතා කරමින්</u>
ගරු සභාපතිතුමනි ,අත්තටම ඔබතුමාගේ නායකත්වය යටතේ මා මන්ත්‍රිවරයෙක්ව සිටි කාලයේ අප විසින් ඉදරිපත් කරනු ලබන 10 වෙනි අයවැය ලේඛනයයි මේ සඳහා ඉදිරිපත් වී ඇත්තේ. මට මතක ඇති ආකාරයට අපි තමයි මුලින්ම ගමට ගොස් ගමේ අයගේ අදහස් හා යෝජනා ගෙන අයවැයක් සකස් කරනු ලැබුවේ. මීට ඉහතදී ගමෙන් මන්ත්‍රීවරයා විසින් තමයි මෙම අයවැය කෙටුම් පතට ඇතුලත් කරන්නේ . නමුත් ඔබතුමා විසින් යෝජනා කර ගමෙන් ගමට කොට්ඨාශ13 ගොස් එතුමන්ලාගෙන් අදහස් අරගෙන පෙළ ගස්වා තමයි මෙවැනි අයවැයක් සැදුවේ .පසුගිය අයවැයේත් ගොඩක් සාර්ථකව වැඩි වැඩ කොටසක් නිම කළා. 2019 අයවැයත් සාර්ථකව ඉටු කර ගැනීමට උත්සාහ දරමු. ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයක් පැමිණීමට ඇත. ගරු අයිරාගනී මන්ත්‍රීතුමිය විසින් ප්‍රකාශ කර සිටි චෝදනාව අප විසිනුයි කළ යුක්තේ.කලින් ඔවුන් තමයි එකට එකතු වී කටයුතු කළේ. අපිට ගැටලුවක් වි තිබුණේ

මේ දෙපිරිස එකතු වී සිටිමයි. දැන් ප්‍රශ්නයක් නැත. ඉදිරියට මේ කටයුත්ත කරගෙන යා හැකියි. එක්සත් ජාතික පක්ෂයේ සහයෝගයත් අපිට දෙන බව පැවසුවා. ඒ වගේම ගම්පෙරළියෙන් අපේ ගමේ වැඩ කොටසක් දමා තිබුණා. සමහර විට එවා නොලැබෙන එවත් ඇති. මට එවා වෙනස් කිරීමට අවශ්‍යාව ඇත.2019 අයවැය ඉතා සාර්ථකව කර ගැනීමටත් අම්බලන්ගොඩ නගරය සම්පූර්ණ අංග සම්පූර්ණ නගරයක් කිරීමට හැකියාව ඔබතුමාටත් අපේ මන්ත්‍රී කණ්ඩායමටත් ධෛර්ය ලැබේවායි ප්‍රර්ථනා කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ ගරු සිරිසේන ජනාධිපතිතුන්ගේ තැනට සුදුසු නුවණ එ වගේම ගරු මහින්ද රාජපක්ෂ මැතිතුන්ගේ එඩිතර නායකත්වය සංකලනය වීමෙන් මුළු මහත් රටම ඉදිරියට ඇදෙන වේලාවේ අම්බලන්ගොඩ බුද්ධිමතුන්ගේ පුරවරයක් ලෙස සාර්ථක අයවැයක් ඉදිරිපත් කිරීමට හැකි වීම ගැන අපේ ශුභාශිංෂණය පුද කරනවා. එ වගේම නගරයේ පුරවැසි සියලු දෙනාට බදු බර අඩුවීම නිසා දැඩි ප්‍රමෝධයක් ඇති වී තිබෙන වේලාවේ ප්‍රජාතන්ත්‍රික ක්‍රමයට අයවැය යෝජනාව ලබා ගැනීම. මම හිතනවා ඔබතුමා ඉතා යෙහෙන් වැඩ කටයුතු සිදු කිරීමට හැකිවේවායි ප්‍රර්ථනා කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ඩී. ධර්මදාස මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , ඔබතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ මංගල අයවැය සම්බන්ධවයි . එහෙත් ඊට ප්‍රථම මේ ප්‍රදේශයේ ජනතාවගේ මැසිවිලි නැගීමක් තිබුණා නගර සභාවෙන් අයකරන බදු වැඩියි යන මතය තිබුණා. ඒ අනුව ඔබතුමා ඒ සලකා බලා ජනතාවට සහනයක් වන ලෙස බදු අඩු කිරීම ගැන අපගේ ගෞරව පූර්වක ස්තුතිය පලමුවෙන්ම අපේ සතුතිය පුද කර සිටිනවා.අපි ගම්වලට ගොස් අයවැය යෝජනා ගෙන සකස් කරනු ලැබූ වැඩ පිළිවල පිළිබඳව. එහිදි එක කොටසකින් යෝජනා 5ක් 6ක් ගෙන ඇත. ඉදිරියේදි 2019 වර්ෂයේදි මේ යෝජනා වලින් වැඩිම ප්‍රමාණයක් ඉටු කිරීමට හැකිවෙයි කියා මා සිතනා අතර මා හිතන්නේ අපට ප්‍රධාන අමාත්‍යතුමාගෙත් සහයෝගය ඇතිව එම යෝජනා වලින් සෑම ගමකම වැඩ කොටසක් සාර්ථකව ඉෂ්ඨ කර ගැනිමට හැකිවේ. එය ඉටු කර ගැනීමට ඔබතුමාට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි මා ප්‍රර්ථනා කරනවා. එසේ අපේ ගරු නගර සභා මන්ත්‍රී අයිරංගනි මහත්මිය ප්‍රකාශ කලා එතුමිය අතිගරු ජනාධිපතිතුමාට චෝදනා කළා. අපේ රටේ කිසිම නායකයෙකුට දිව්‍යාංගත නායකයෙකුට හෝ අපේ ජනතා විමුක්ති පෙරමුණේ ගරු විජේවීර සහෝදරයා හෝ කිසිම නායකයෙකුට අපහාස කිරීමක් සභාවක් තුල සිදු නොවිය යුතු යයි මා තරයේ ප්‍රකාශ කර සිටිනවා. මොකද දේශපානයේ සාදා හතුරොත් නෑ සදා මිතුරොත් නැත යන කියමන හිතේ තබා ගෙන එතුමියගේ ප්‍රකාශයට දැඩි විරෝධය ප්‍රකාශ කර සිටිනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , අපි නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් ලෙස. එවිට අපේ නායකතුමා තමයි අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා. එතුමාගේ නායකත්වය යටතේ තමයි පසුගිය කාලයේ පරිපාලන යම් යම් දේ සිදු වුණේ. ඒ නායකයාගේ ප්‍රශ්න ගැටලු ගැන අපිට කතා කළ නොහැක ඒ සම්බන්ධව. මොකද අපිත් එක්ක ගිය සභාවේ සිටි එක්සත් ජාතික පක්ෂයේ සිටි සහෝදර මන්ත්‍රීවරයා දැන් අපි සමඟ නැහැ. අපි දැන් වෙනම . අපි කල්පනා කළේ අපේ ජනතාව වෙනුවෙන් එතුමා ගත් තින්දුවත් එක්ක, ජනාධිපතිතුමා ගත් තින්දුවත් සමඟ අප සිටිය යුතුයි. එයට ජනාධිපතිතුමාට චෝදනා කිරීම සම්බන්ධව එතුමියට දැඩි සේ අපේ විරෝධතාව ප්‍රකාශ කරනවා. එවගේම මෙහි සහයෝගය යා යුතු නම් ගරු නගර සභා මන්ත්‍රිනි අයිරංගනි මහත්මියට ඉල්ලා අස් කර ගත යුතු බව.නැතිනම් ඒ සඳහා අපිට ඉදිරියේදි ප්‍රශ්න ගැටලු වලට මුහුණ පැමට සිදුවේ. අපිට රටට ඔබින හොඳ තීන්දුවක් ගෙන ඇත . එවගේ ප්‍රශ්න ගැටලු කතා කිරිමට ගියහොත් එය අපට සභාවේ වැඩ කටයුතු සිදු කර ගැනීමට බාධා වේ . මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෙහි සිටින මන්ත්‍රීවරුන්ගේ දැඩි විරෝධය ප්‍රකාශ කර සිටිනවා. එම විරෝධයට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් අපේ පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය පුද කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>

විෂයෙන් එහාට ගිය මේ සාකච්ඡාව පිළිබඳ මට යම් අදහසක් දරන්න වෙනවා. අයවැය වාර්තාව සැකසීමට මහන්සි වු කාර්යාලයේ නිලධාරි මහත්ම මහත්මින්ට ස්තුති වන්ත වෙනවා. අර සින්දුවක් තියෙනවා වංශෙ කුල බේදේ මෙහි නොවේ බමුණා හෝ වසලයා කියා. එතකොට මේ අපි කියන වැසියා ,මන්ත්‍රීවරයා, අමාත්‍ය ,ජනාධිපතිවරයා හෝ තීරණය වෙනවා ඔතනදි පිලේ කොයි පිලට ද වැටෙන්නේ කියා. කරන කියන කටයුතු අනුව එවිට පසුගිය වකවානුව රටේ ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා හැටියට ගරු රනිල් වික්‍රමසිංහ මහතා පත් කළා.ඊට පසු දැන් ගරු මහින්ද රාජපක්ෂ මහතා පත් කරනවා. එය විසුරුවා දැන් වැඩි හරියක් ලෙස පුද්ගලික දේපලක් ලෙස තමයි වෙන්නේ. ඒ පිළිබඳව අපේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා. අනික් කාරණය තමයි අධිකරණ ඇමතිවරයා පත් කරනු ලබන්නේ

ජනාධිපතිවරයා විසිනි. එතකොට අධිකරණ ඇමතිවරයා විසින් තමයි අග්‍ර විනිශ්චකාරවරයා පත් කරන්නේ. එතකොට කිසිම දිනක ජනාධිපතිට විරුද්ධව තීරණයක් අග්‍ර විනිශ්චකාරවරයා ගනු නොලබයි.

<u>ගරු සභාපති එම් .ඩබ් අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
නෑ ජනාධිපතිතුමා විසින් තමයි අග්‍ර විනිශ්චකාරවරයා පත් කරන්නේ .

<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම් සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>
එතුමාගේ ඔනෑ එපාකම් තමයි ඉෂ්ඨ කරන්නේ . එතකොට අපිට කිසිසේත් බලාපොරෝත්තුවක් තබා ගත නොහැකියි මෙවැනි පාලන කාලයක් තුල සර්ව සාධාරණ විනිශ්චයක් අධිකරණයක් තුලින් ලැබෙනවා කියා. එය තමයි අද තිබෙන ප්‍රශ්නය.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,මාස 16 ක් වැනි කාලයක් පක්ෂයක් හදලා ඒ පක්ෂයෙන් මැතිවරණයකට ඉදිරිපත් වෙලා ජයග්‍රහණය කොට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මංගල අයවැය ඉදිරිපත් කරන මේ මොහොතේ මා ඉතාමත් සතුටු වනවා 1997 සිට වසර ගණනක් මේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හා උප සභාපතිවරයෙක් හැටියට මගේ සභා කාලය තුළම කිසිම දිනක මා නොදැක්ක සහයෝගයක් අම්බලන්ගොඩ නගර සභාවේ 2019 අයවැය සඳහා ලැබුණා.ඒ නිසා සියලුම මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවනීය ස්තුතිය මා මේ අවස්ථාවේදී පුද කරනවා.මොකද අපි දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කළා.ඒ වගේම අපි ොකෙටි කාලයක් තුළ පක්ෂයක් හදාගෙන, ආණ්ඩු පක්ෂයේ උප සභාපතිවරයකු වන්නට හැකියාව ලැබුනේ මුලු ලංකාවේම පළාත් පාලන මන්ත්‍රීවරුන්ට කොන්ද කෙලින් තබාගෙන වැඩ කරන්නට හැකියාව ලැබුනේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අපට ලබා දුන් ශක්තිය හා ධෛර්යය නිසා.එය විපක්ෂයේ මන්ත්‍රීවරුන්වත් ප්‍රතික්ෂේප කරන එකක් නෑ.අපට ගම් වල වැඩ කරන්න වසරකට අතිවිශාල මුදලක් දුන්නා.අපි ඒ හරහා ලොකු වැඩ කොටසක් කළා.විශේෂයෙන්ම එතුමන් කියූ පරිදි අම්බන්ගොඩ නගරයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරයා වශයෙන් තුන් වතාවක්ම ප්‍රධාන අමාත්‍යධූරය දරන්නට එතුමන්ට හැකියාව ලැබුනා.ඒ නිසා ඒ හරහාත් අම්බලන්ගොඩ නගරයේ ලොකු වැඩ කොටසක් කිරීමට අපට හැකියාව ලැබුනා.ඒ නිසා තමයි අම්බලන්ගොඩ නගරය වගේ තැනක අලුත් පක්ෂයක් හදාගෙන නගර සභාවක් පිහිටුවන්න ඔබතුමන්ට අපට හැකියාව ලැබුනේ. නොයෙක් සමිති සමාගම් හරහා ගම් වල ජනතාව අතරට ගොස් ඔවුන්ගේ අදහස් යේජනා අරගෙන තමයි මේ අයවැය කෙටුම්පත සකස් කළේ.එහිදී එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් සහභාගී වුනා.ඒ නිසා පක්ෂ භේදයකින් තොරව අයවැය යෝජනාව කළ නිසා අපට සහයෝගය ලැබුනා.නමුත් දීර්ඝ කාලයක් මේ සභාව නියෝජනය කළ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු කිසිම දිනක මෙවැනි සහයෝගයක් ලබාදී නෑ.ඒ නිසා අපේ ගෞරවය ඔබතුමන්ලාට මා මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.විශේෂයෙන්ම අද ඩෙනට් මන්ත්‍රීතුමන් නැති වුනත් අද ඒ මන්ත්‍රීවරුන් පස්දෙනා ගත් තීරණය ඉතාමත් වැදගත් වනවා. අම්බලන්ගොඩ වැනි බුද්ධිමතුන්ගේ නගරයට දියහැකි හොඳම පෙන්වීම තමයි ඒ මන්ත්‍රීවරු පස්දෙනා අද ගත්තේ.ඒ නිසා අපි ජනතාව වෙනුවෙන් ගත් තීන්දුව අනුමත කරනවා.ඒ කියන්නේ අම්බලන්ගොඩ ජනතාවද මෙය ජනතාව වෙනුවෙන් සාධාරණය ඉටු කරන සභාවක් ලෙස අම්බලන්ගොඩ නගර සභාව සඳහා ප්‍රසාදය පළ කරනවා.අද අයිරාංගනී මන්ත්‍රීතුමිය කළ ප්‍රකාශය එතුමියගේ කේන්තියට ඉදිරිපත් කළත් එවැනි ප්‍රකාශ මෙවැනි සභාවකට සුදුසු නෑ. එවැනි ප්‍රකාශ ඉදිරිපත් කළ යුත්තේ විරෝධතා රැළි වලදී.මොකද එතුමන් රටේ ජනාධිපතිතුමා.අපි නෙවෙයි ජනාධිපතිතුමන්ට ඡන්දය දුන්නේ තමුන්නාන්සේලා.ඔබලා ඡන්දය දීලා 2015 දී අපේ බලයේ තිබූ එකක් තමයි උදුරලා අරගෙන කලේ.නමුත් ඔබලා කවදාවත් නොසිතන්නට ඇති අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මෙවැනි තීන්දුවක් ගනීවි කියා. අවුරුදු 50 කට වඩා දේශපාලනය කළ පුද්ගලයින් දෙපළක් තමයි රටේ ජනාධිපති වෙලා තිබෙන්නේත්, අගමැති වෙලා තිබෙන්නේත්.ඒ නිසා මේ දෙපළටම දේශපාලනය ඉගැන්වීමේ අවශ්‍යතාවක් නෑ.මොකද දේශපාලනයෙන්හොදට බැට කාලා හිටපු පුද්ගලයින් දෙදෙනක් තමයි මොවුන් දෙපළ.ඒ නිසා රටේ සංවර්ධනය ඉතාමත්ම හොඳ තත්වයකට පත්වේවි කියා මා සිතනවා.අපි මන්ත්‍රීවරු වශයෙන් අපටත් විශේෂයෙන්ම කිව යුතුයි මේ රටේ පළාත්පාලන මන්ත්‍රීවරු තුනදහස් ගණනක් බිහිවීමටත් ප්‍රධාන හේතුව වුනේ අගමැති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ මන්ත්‍රීවරු බිහි වීමට කරපු සේවය නිසා.මේ පළාත් පාලන මන්ත්‍රීවරු කවදාවත් බලයක් නැති තැනකට යන්නේ නෑ.බලයක් නැති තැනක මහින්ද මහතා ආරක්ෂා කරගෙන සිටියේ පළාත් පාලන මන්ත්‍රීවරුන්ට දුන් සැලකිල්ල හා ඒ මන්ත්‍රීවරු නගා සිටුවීම සම්බන්ධව.ඒනිසා ඒ කෙලෙහි ගුණය මම හිතන්නේඅපේ මන්ත්‍රීවරු නැවතත් දක්වාවි යන බලාපොරොත්තුව තිබෙනවා.අපේ ගම් නගා සිටුවීමට අවස්ථාව අවුරුදු තුන හතරකට පසු නැවත ඇති වේවි යන බලාපොරොත්තුව අපේ තිබෙනවා.ඒනිසා ඉදිරියේදී ඒ සියලු

බලාපොරොත්තු මේ නගරය වෙනුවෙන් ඉටු කරන්නට අපට සියලු දෙනාගේ සහයෝගය අවශ්‍යයයි යන ප්‍රකාශය කරන අතර විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍යතුමා එම තනතුරේ රැඳී සිටින්නේ මාස 5ක 6ක කාලයක් පමණයි.අප්‍රේල් මාසය වනවිට පළාත් සභා විසුරුවනවා.අපි දන්නේ නෑ මහ මැතිවරණයට ඉල්ලාවිද නැද්ද යන්න කාරණය.නමුත් දැන් අපි කවුරුත් එකතු වෙලා සිටින මොහොතක අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ අම්බලන්ගොඩ නගරයෙන් බිහිවූ ප්‍රධාන අමාත්‍යතුමන් වශයෙන් අම්බලන්ගොඩ නගරය වෙනුවෙන් යම්කිසි සේවාවක් ඉෂ්ට කරන්න කියා.විශේෂයෙන්ම අඩුපාඩු ගොඩක් තිබෙන නගරයක් බවට පත්වී තිබෙනවා අම්බලන්ගොඩ නගරය.විශේෂයෙන්ම මාලු වෙළඳ පොළ සහ අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල.අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල කියන්නේ පැරණි ගොඩනැගිල්ලක්.නමුත් එය අලුත්වැඩියා කොට යම්කිසි තත්වයකට ගතහැකියි.ඒ නිසා මා අපේ මන්ත්‍රීවරු තිදෙනාගෙන් ඉල්ලා සිටිනවා ගරු ප්‍රධාන අමාත්‍යතුමන් යාමට පෙර යම්කිසි මුදලක් අපේ නගර සභාවට ලබාදෙන ලෙස.මාලු වෙළඳ පොළ හෝ සරත් මන්ත්‍රීතුමන් කියූ පරිදි කාණු පද්ධතිය හෝ නගර සභා ගොඩනැගිල්ල සෑදීමට ලක්ෂ 250ක 300ක මුදලක් ලබාගත හැකියි. එතුමාට ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් ලක්ෂ 500 ක් වියදම් කරනවා යන්න එතරම් ලොකු කාර්යයක් නොවෙයි.එතුමන් විසින් ගොඩහේනේ ලක්ෂ 350 ක් වැය කොට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් සාදා තිබෙනවා.දැන්අපේ වාද භේද අවසන්.අපි එකතු වෙලා ඉන්නේ.ඒ නිසා නගරයේ ජනතාව වෙනුවෙන් කරන ඉල්ලීමක් නිසා ලක්ෂ 500 ක වැනි මුදලක් අම්බලන්ගොඩ නගර සභාවට ලබා දෙන්න යන ඉල්ලීම ඔබතුමන්ලා කරන්න.අයවැය කෙටුම්පත සකස් කිරීමේදී ගණකාධිකාරීවරයකුද නැතිව ලේකම්තුමිය ඇතුලු ඒ සඳහා සහභාගී වූ සියලු දෙනාටම අපගේ ගෞරවනීය ස්තූතිය පුද කරන අතර අම්බලන්ගොඩ නගරයේ 2020 අයවැය ගේනන කලින් 2019 අයවැය තුළින් කොට්ඨාශ 13ම වැඩකටයුතු සම්පූර්ණ කිරීමට ශක්තිය ධෛර්යයත් ආදායම් ලබා ගැනීම සඳහා ඒ සියලු නිළධාරීන්ගේ සහායත් ලබාදෙන ලෙස ඉල්ලා සිටින අතර සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කර සිටිනවා.

<u>ගරු නාගරික මන්ත්‍රී අයිරාංගනීමෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි,නවක මන්ත්‍රීවරියක් ලෙස මා අතින් යම් වැරදි වචනයක් ප්‍රකාශ වීම සම්බන්ධයෙන් මා කණගාටු වනවා.නමුත් මා ගොඩක් කණගාටු වනවා මම ගොඩක් කැපවෙලා මෛත්‍රීපාල සිරිසේන මහතාට වැඩ කළේ.මට හරිම දුකයි ඇයි එතුමන් මේ විදියට හිතුවක්කාර ලෙස හිතන්නේ නැති ජනාධිපතිවරයෙක් ලෙස වැඩ කළේ ඇයි කියා.මම මේරටේ ඕනෑම නායකයකුට ගරු කරන කාන්තාවක්.මට හිතා ගන්න බැරි දැන් කියන එක නෙවෙයිනේ එතුමා කියන්නේ. ඒකයි මම එහෙම කිවුවේ.සමහරවිට මගේ වචනේ වැරදීමක් තිබුනානම් මට සමාවන්න.නමුත් මම කිවුවේ මට තියෙන කේන්තියට.එතුමාට අපි දිවි හිමියෙන් වැඩ කළා.අපේ පක්ෂයේ හැට දෙලක්ෂයක් ඡන්දෙ දීලා එහෙම දෙයක් එතුමා කළාම අපි පාක්ෂිකයන්වශයෙන් කතාකළ යුතුයි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූසියලු මන්ත්‍රීවරුන්ට මා ස්තූති වන්ත වනවා.මා ශ්‍රී ලංකාවේ පළාත්පාලන විෂය ක්ෂේත්‍රය ගත්විට අපේ සාම්ප්‍රදාය තිබුනේ ඉන්න මන්ත්‍රීවරුන් සමග අයවැයක් සෑදීම.නමුත් ලංකාවේ පළාත්පාලන ආයතන වල සහභාගීත්ව අයවැයකට යොමු කිරීම අපි මුලින්ම ආරම්භ කළේ අම්බලන්ගොඩ නගර සභාවෙන්.අද අම්බලන්ගොඩ නගර සභාව යම්කිසි පළාත්පාලන ආයතනයකට ආදර්ශමත් වනඅන්දමින් කටයුතු කිරීමට හැකිවී තිබෙනවා.අපි අවුරුදු 10ක් පමණ ගමේ ජනතාවට අවස්ථාව දුන්නා අපේ නගර සභාවෙන් ඔබට වියයුත්තේ කුමක්ද කියා ප්‍රකාශ කරන්න කියා. මහජනතාවගේ අදහස් සලකා බලා ඔවුන්ට සිදුවිය යුතු ආකාරයට ඔවුන් සමඟ කිට්ටු සබඳියාවක් සමඟ කටයුතු කිරීමට අපට හැකියාව ලැබුණා. එහිදි අපි මතක් කළ යුතුයි මේ පළාත් පාලන සේවයේ අවුරුදු විසි ගණනක් සිටියා . මා මේ ඉදිරිපත් කරනු ලබන්නේ 16 වෙනි අයවැයයි අවුරුදු විසි ගණනක් ඉදලා තියෙනවා. එම අවුරුදු විසි ගණන තුලදීම මම අම්බලන්ගොඩ නගර සභාවේ අයවැය මා ඉදිරිපත් කර තිබෙනවා. මේ ඉදිරිපත් කර ඇත්තේ 16 වෙනි අයවැයයි. මා අවුරුදු 4 ක් විපක්ෂ නායක වශයෙන් කටයුතු කර තිබෙනවා. ඒ ඉදිරිපත් කරන හැම වේලාවේම අපිට කිරීමට පුළුවන් උපරිම ශක්තියෙන් තමයි එය ඉටු කළේ. මෙහිද මම ඉතිහාසයේ අපිට ලැබිය යුතු ආදායම 1% කින් ඉවත් කරලා මහජනතාවට සහනයක් සලසන ලෙස . එම 1% කින් ආදායම ඉවත් කරාම අපිට අහිමි වන ආදායම ලක්ෂ 25කි . එම ලක්ෂ 25 අහිමි කරගෙන තමයි මේ කටයුක්ත කරගෙන තිබෙන්නේ. මෙහිදි මා මතක් කිරීමට කැමතියි නව රජයක නව නායකත්වයක් යටතේ තමයි මට මේ ධෛර්ය ලැබුණේ. පාළාත් පාලන ක්ෂේත්‍රය ගැන දැඩිව විශ්වාස කරන නායකයෙක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා. එතුමා තරම් මන්ත්‍රීවරුන් ශක්තිමත් කරපු නායකයෙක් මට මගේ ජීවිත කාලය තුලම දැකලා නෑ ඇත්ත වශයෙන්ම. එතුමා එතරම් අපිට ශක්තියක් වුණා. අපි ගමේ මනුස්සයා ගැන කතා කළා. ඇත්තටම අපි අලුත් පක්ෂයක් සාදා ඒ පක්ෂය තුලින් ජයගහ්‍රණයක් කරන්න අපිට හැකියාවක් ලබා දුන්නේ එතුමා ගෙන ගිය වැඩපිළිවල තමයි.ඒ නිසා අපි එතුමා සම්බන්ධයෙන් දැඩි විශ්වාසයක් තබා මේ වැඩ කටයුක්ත කළේ.මෙම කටයුක්තේදි ජනතාවට සහනය සලසවන්න ගත් වැඩපිළිවල සාර්ථක වීම ගැන අපි විශේෂයෙන් ස්තුති වන්ත වෙනවා. ඒ වගේම

මම ස්තුති වන්ත වෙනවා එක්සත් ජාතික පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට . ඔබලා සර්ව සාධාරණ අන්දමින් යම් ආකාරයකින් මේ සලකා අපිට සහාය ලබා දීම සම්බන්ධයෙනුත් ඒ වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ජනතා විමුක්ති පෙරමුණෙත් ගරු සියලුම මන්ත්‍රීවරු මේ සම්බන්ධයෙන් එකමතිකව තමයි හැම දෙනාගේම අදහස් තුල තමයි මේ අයවැය ඉදිරිපත් කළේ.මේ අයවැයේ කිසිම මන්ත්‍රීවරයෙකුට කියන්න බෑ. මම කියපු දේවල් නෑ කියා.මම යෝජනා කළ දේවල් නැහැයි කියා.කිසිම ගම් වැසියෙකුට කියන්න බෑ අපි යෝජනා කරපු දේවල් නෑ කියා. ගම්වැසියෙකුට අවශ්‍යතාවය තියෙන්නේ කුඹුරක , නියරක , ජල බාස්නාව කුඹුරට හරවා ගොවිතැන් කිරීම නම් එකත් මේකට අඩංගු වී ඇත.ගමේ වැසියන්ට අවශ්‍ය පරිදි තමයි මෙය සකස් කර තිබෙන්නේ . මෙම අයවැය සකස් කිරීමේදි අපිට සහාය දුන් සියළු දෙනාටම අපේ ස්තුතිය පුද කරනවා. මේ අවස්ථාවේදි ඡන්ද විමසීමක් අවශ්‍ය ද? අවශ්‍ය නොවේ . මෙම යෝජනාව එකමතික ව සම්මත වේ.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභාවේ 2019 වර්ෂයේ අයවැය ලේඛනය පිලිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් ඒකමතිකව සහා සම්මත විය.

**05.01.02** තාක්ෂණ සේවා නිළධාරි විසින් **ඇස්තමේන්තු ගත රු400000/=** ක මුදලකින් අම්බලන්ගොඩ නගර සභාවේ පටබැඳිමුල්ල (රේණුක මොටර්ස් ) අසළ පොදු ළිඳ අලුත්වැඩියා කිරීම හා ,මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

තාක්ෂණ සේවා නිළධාරි විසින් ඇස්තමේන්තු ගත රු400000/= ක මුදලකින් අම්බලන්ගොඩ නගර සභාවේ පටබැඳිමුල්ල (රේණුක මොටර්ස් ) අසළ පොදු ළිඳ අලුත්වැඩියා කිරීම සඳහා මම යෝජනා කර සිටිනවා.

**<u>තිරණය</u>**

**අම්බලන්ගොඩ නගර සභාවේ පටබැඳිමුල්ල (රේණුක මොටර්ස් )අසළ පොදු ළිඳ අලුත්වැඩියා කිරීමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.03** NBRO වාර්තාව අනුව නගර සභා කාර්යාලය උඩුමහලේ ස්ථාපිත කිරීම සඳහා නගර සභා ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු සිදු කිරීම , හා මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

NBRO වාර්තාව අනුව නගර සභා කාර්යාලය උඩුමහලේ ස්ථාපිත කිරීම සඳහා නගර සභා ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු සිදු කිරීම.

**<u>තිරණය</u>**

**අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවත් , මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.04** **මහජන ක්‍රීඩාංගනයේ කාණුව (බෝගහ පැත්ත ඉතිරි කොටස** ) පිලිසකර කිරීම හා මෙම කර්මාන්තය සහා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
**මහජන ක්‍රීඩාංගනයේ කාණුව (බෝගහ පැත්ත ඉතිරි කොටස** ) පිලිසකර කිරීම සම්බන්ධව මා යෝජනා කර සිටිනවා.

__තීරණය__
**මහජන ක්‍රීඩාංගනයේ කාණුව (බෝගහ පැත්ත) ඉතිරි කොටස සකස් කිරීමේ යෝජනාව පිළිගැනීම සුදුසු බවත් , මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.01.05** **දෙල්දූව පාර කොන්ක්‍රීට් කිරීම** හා මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
දැන් මේ 05.01.02 සිට 05.01.11 දක්වා ඇති යෝජනා සියල්ලම තියෙන්නේ ඇස්තමේන්තු සමඟ එන යෝජනා පළාත් සභාවෙන් අප වෙත දන්වා එවා තිබෙනවා යෝජනා වශයෙනුත් දමන ලෙස.එහි එක දෙයක් පමණක් 05.01.05 දෙල්දූව පාර කොන්ක්‍රිට් කිරීම පළාත් සභා අරමුදලින් ඉටු කළ යුතු යයි යෝජනා කිරීම. එය සංශෝධනය වෙන්න ඕනෑ. මොකද පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ලක්ෂ 50 ක් ඒ සඳහා වෙන්කර ඇත.එය ඒ ආකාරයෙන් වෙන්න ඕනෑ.05.01.01සිට 05.01.11 දක්වා යෝජනා මා යෝජනා කරනවා. කවුරුහරි ස්ථිර කරනවාද?

__ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්__

05.01.05 යෝජනාව පමණක් සංශෝධනය විය යුතුයි.

__ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්__
එය වෙනස් විය යුතුය. අනෙක් කරුණු එහෙමම තියෙනවා . නිලානි මන්ත්‍රීතුමියට මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීමට අවශ්‍ය ද?

__ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්__
ගරු සභාපතිතුමනි , අපි ප්‍රධාන අමාත්‍යතුමාට ඇත්ත වශයෙන් ස්තුති වන්න වෙන්න ඕනෑ . ප්‍රධාන අමාත්‍යතුමා දෙල්දූව ප්‍රදේශයට යන විට දෙල්දූව පාර දැකලා තමයි මට කිව්වේ දෙල්දූව පාර එහි ගමන් කිරීමට නොහැකි තත්වයක් තිබෙනවා නේද? මේ පාරට මුදල් ලබා දෙන්න කටයුතු කරනවා කියා . නගර සභාවට මේ සඳහා ඇස්තමේන්තුව සකසා දෙන ලෙස කියා සිටියා.
මා ඔබතුමාට මේ බව පවසා තාක්ෂණ සේවා නිලධාරි මහතාට දැනුම් දුන්නා මේ සඳහා ඇස්තමේන්තු සකසන ලෙස ඔබතුමා අප සභාවෙන් කරගෙන යන වැඩවලට මිටත් වඩා ඉදිරියේදී අපේ ප්‍රධාන අමාත්‍යතුමා ලොකු සහායෝගයක් ලබා දෙයි.මේ නිසා ඔබතුමා අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මේ මොහොතේ ස්තුතිවන්ත විය යුතුයි. අපේ ගරු මන්ත්‍රීතුමා ඉල්ලු යෝජනාවත් අප සාකච්ජා කරමින් යන බවත් අපේ සභාවට ඒ ලක්ෂ 50 ත් ලබා ගන්න අපි කටයුතු කරනවා.ඒ D4 යන්ත්‍රයක් ගැනීමට. එබැවින් අප සභාවේ ප්‍රධාන අමාත්‍යතුමත් එක්ක මන්ත්‍රීවරු සාකච්ජා කළ තවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා කටයුතු කරමු කියමින් එතුමාට මේ ගරු සභාවේ, අම්බලන්ගොඩ ජනතාව වෙනුවෙන් ස්තුතිය පුදකරමින් මෙම වැඩ කටයුක්ත ඉක්මනින්ම කිරීමට ඔබතුමා කටයුතු කරයි කියන විශ්වාසය තබමි.

__ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්__
ගරු සභාපතිතුමනි , එම යෝජනාවට අදාල වචන කිහිපයක් කතා කළ යුතුව තිබෙනවා. මොකද අපේ සභා අරමුදලින් මේක කිරීමට ඔබතුමා යෝජනා කළත් රු.5000000/= තරම් වූ වියදමක් අපිට එක පාරක් වෙනුවෙන් දැරීමට නගර සභාවක් විදියට තියෙන අපහසුතාවය මධ්‍යයේ ගරු ප්‍රධාන අමාත්‍යතුමන් එම මුදල නගර සභාවට සම්ප්‍රේෂණය කිරීම පිළිබඳව අපි ඉතාමත්ව ස්තුති වන්ත විය යුතුයි. ඒ හා සමානව දෙල්දූවේ ජනතාව පසුගිය වර්ෂාපතන කාලයේ තුලදී ඉතා විශාල පීඩනයකට ලක් වෙච්ච ජනතාවක් . මොකද පාසල් යන දරුවන්ට එම පාරේ ගමන් කරන විට සපත්තු ගලවා මේස් දෙක ගලවා දමා තමයි පාසල් යාමට සිදු වුයේ . මොකද අපේ ගම් ප්‍රදේශය තුල, අපේ නගර සීමාව තුල ඒ ව්‍යසනයට පත් වුනානම්, අපහසුතාවයට පත් වුනා නම් ඒ ගම් ප්‍රදේශය, ඒ දරුවන් පමණයි අපහසුතාවයට පත් වුණේ. ඒ අනුව එම මාර්ගය පිලිසකර කර ඉතාමත්ම හොඳ මට්ටමින් අපේ තාක්ෂණ

සේවා නිලධාරින්ගේ උපදෙස් අනුව නැවත එවැනි තත්වයක් ඇති නොවන ආකාරයෙන් පිලිසකර කරන්න අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් වෙන් කර එවීම සම්බන්ධව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍ය ශාන් විජයලාල් මැතිතුමාට අපගේ ස්තුතිය පුද කර සිටිය යුතු යයි මා ඉල්ලා සිටින අතර ගරු නිලානි මන්ත්‍රීතුමියට මෙම මුදල් ලබා ගැනීම සම්බන්ධව අපට දුන් සහායෝගය පිළිබඳව නගර සභිකාවක් විදියට ඇය දුන් සහයෝගය පිළිබඳවත් ස්තුති වන්ත වෙනවා.

<u>තිරණය</u>

**දෙල්දුව පාර 185.00 මීටර් කොටසක් තාර යොදා සංවර්ධනය කිරිමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවත් , මෙම කර්මාන්තය පළාත් සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.06** **මහජන සෞඛ්‍ය පරික්ෂක කාමරය වෙන් කිරීම** හා මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

<u>**ගරු සභාපති එම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මහජන සෞඛ්‍ය පරික්ෂක කාමරය වෙන් කිරීම සුදුසු යයි මා යෝජනා කර සිටිනවා.

<u>තිරණය</u>

**මහජන සෞඛ්‍ය පරික්ෂක කාමරය සකස් කිරිමේ යෝජනාව පිළිගැනිම සුදුසු බවත් , මෙම කර්මාන්තය පළාත් සභා අරමුදලින් ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු උප සභාපති කමල් වැල්ලගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් යුතුව ඒකමතිකව සහා සම්මත විය.**

**05.01.07**. නගර සභා ගබඩා කාමරය ඉදිරිපිට වහල ඉදි කිරීම හා මෙම කර්මාන්තය සභා අරමුදලින් ඉටු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| | | බලාපොරොත්තු වන අතරම අද දින කමිටුවට සහභාගී වූ මන්ත්‍රී වරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිනිය පශු වෛද්‍ය නිලධාරිනිය ඇතුළු සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට ස්තුතිය පුද කරන බව. | |
| නිමාව | | ප.ව 4.15 | |

සකස් කළේ,
කළමනාකරණ සහකාර

නිර්දේශ කරමි, අනුමත කරමි.

ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

තිරණය -

2018.10.23දින ප.ව 2.30 ට පැවති පරිසර , සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටු රැස්වීම් වාර්තාව පිළිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රෙෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**06.04 2018.10.15 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව**

**ටෙන්ඩර් කමිටුව**

**2018/10/15 දින ප.ව 2.30**

**සහභාගීත්වය**

1. ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව
2. ධම්මික කොඩිකාර මහතා ගරු නගර මන්ත්‍රී. , අම්බලන්ගොඩ නගර සභාව
3. නන්දන රාජපක්ෂ මහතා ගරු නගර මන්ත්‍රී. , අම්බලන්ගොඩ නගර සභාව
4. බී.ඒ ධම්මිකා මිය ලේකම්. අම්බලන්ගොඩ නගර සභාව
5. පී.එම් විජේසිංහ මිය තාක්ෂණ නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව
6 එච්. එල්. ද සිල්වා නිලමුණි මහතා තාක්ෂණ නිලධාරී, අම්බලන්ගොඩ නගර සභාව
7 ලක්මාලි රුවනි සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ නගර සභාව

කමිටු වාර්තාව

1. බ්‍රෂ් කටර් සහ ග්‍රිල් එක සදහා අවම මිල ගණන් සහ වගකීම් කාලය පිලිබද සලකා බලා u.K.G. enterprises ආයතනයේ මිල ගණන් පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | රජයේ භාණ්ඩ (බඩු) නීතිගත සංස්ථාව | M.H. cader mesa Galle | UKG enterprise galle | u.k.G traders co.(pvt)ltd Gall |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1. | Drill | 01 | | MAKITA 92500.00 (6MONTH) | Hemer 12900.00 (1year) | Hemer 11900.00 (1YEAR) | HEMER 12500.00 |
| 2. | Brush cuter | 01 | | Bg305 14711.71 (6month) | 18500.00 | 16900.00( HUNDI) 6MOUNT H | 17500.00 |

2.පලාත් පාලන ක්‍රීඩා උළෙලේ T- SHIRT සඳහා අවම මිල ගණන් සටහන් කර ඇති nalinda promoshin ආයතනයේ මිල පිළිගැනීම සුදුසු බව තීරණය කර ඇත.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | OK GAYS BENTOTA | සැනසුම ටෙලර්ස් සභව | ශ්‍රියංකාර ටැක්ස් යක්සටයිල | Nalinda promotion maharagama |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | වට්ටම් මිල | ඒකක් තොගය |
| 1. | T-SHIRT | 200 | | 790.00 | 750.00 | 850.00 | 650.00 |

3.හැඳුනුම්පත් සඳහා ඡායාරූප ගැනීම සඳහා කැඳවූ මිල ගණන් අතරින් ලබා දී තිබූ සාම්පල් වල ප්‍රමිතීන් සලකා බලා PHOTO FOCAL ආයතනයේ මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | EDWINS STUDIO Ambalangoda | PHOTO FOCAL Ambalangoda | AKRA FOTO Ambalangoda |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1. | මන්ත්‍රීමණ්ඩලයේ හැඳුනුම්පත් | 21 | | 300.00 | 310.00 | 250.00 |
| 2. | කාර්යාලීය නිළධාරීන්ගේ හැඳුනුම්පත් | 48 | | 300.00 | 310.00 | 250.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 3. | මන්ත්‍රී මණ්ඩලයේ සමූහ ඡායාරූපය | 01 | | 2500.00 | 1875.00 | 6500.00 |

4.පරිගණක යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සඳහා ගාල්ල කලුවැල්ල කාර්මික විද්‍යාලයේ ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විෂය භාර අංශ ප්‍රධානී මහතාගේ නිර්දේශයෙන් අනතුරුව තීරණය කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.(OMAK TECHNOLAGY ආයතනයේ මිල ගණන් ප්‍රමාදවී ලැබුනු බැවින් ප්‍රතික්ෂේප විය.)

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | SOUTHNET GALLE | රජයේ බාණ්ඩ නිශ්‍රිත සංස්ථාව | Tulip Computer | John keels automation |
|---|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | COMPUTER | | | 224899.00 | 272050.00 | 234800.00 | - |

**5.සාහිත්‍ය මාසය සඳහා තිළිණපත් මිලදී ගැනීමේදී වඩාත් වාසිදායක ලුමිනෙක්ස් ආයතනයේ මිල ගණන් සුදුසු බවට තීරණය කරන ලදී.**

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ROYAL pothmedura ambalangoda | Chamara book shop ambalangoda | Luminex pothmedura ambalangod |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | රු.1000 **තිළිණපත්** | 30 | | 950.00 | 950.00 | 850.00 |
| 2. | රු.2000 **තිළිණපත්** | 17 | | 1900.00 | 1900.00 | 1700.00 |
| 3. | රු.700 තිළිණපත් | 41 | | 665.00 | 665.00 | 595.00 |
| 4. | රු.5 00 **තිළිණපත්** | 41 | | 475.00 | 475.00 | 425.00 |
| 5. | රු.3 00 **තිළිණපත්** | 41 | | 285.00 | 285.00 | 255.00 |

6.COMPOST BIN සඳහා ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් එකම ආයතනය PEOPLE TO PEOPLE VOLUNTEERS ආයතනයේ මිල ගණන් දෙක පිලිගැනීමට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | People to people volunteers negombo | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1. | සාමාන්‍ය කොම්පෝස්ට් බදුන | | | 4750.00 | | | |
| 2. | වැඩිදියුණු කල කොම්පෝස්ට් බදුන් | | | 5950.00 | | | |

7. බිත්ති ඔරලෝසු සඳහා ඉදිරිපත් කර ඇති මිලගණන් අතරින් වගකීම් කාලය හා මිල සලකා බලා නෙස්ටර් ආයතනයේ මිලපිලිගැනීම සුදුසු බවට තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | NESTOR WORKS Ambalangoda | DIOMEND BROTHERS Ambalangoda | |
|---|---|---|---|---|---|---|
| | | | | ඒකක් තොගය | ඒකක් තොගය | ඒකක් තොගය |
| 1. | බිත්ති ඔරලෝසු | | PW 156 | Wods (2YEAR) 1500.00 | AJANTA (1YEAR) 1500.00 | |
| 2. | | | LA | WodS (2YEAR) 1500.00 | | |

8.බටකුඩ සහ අත්වැසුම් සඳහා දී ඇති මිල ගණන් අතරින් බටකුඩ නයනරංජන සේල්පොල මගින් ද අත්වුසුම් පූර්ණ වෙළඳසැල වෙතින්ද මිලදී ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු<br><br>අංකය | අයිතමය | වර්ගය | [illegible] | ශ්‍රී වෙළඳසැල [illegible] |
|---|---|---|---|---|
| 1. | බටකුඩ | | 150.00 | - |
| 2. | අත්වැසුම් | | 160.00 | 270.00(inglo<br>) |
| 3. | | | | 75.00(River) |
| 4. | | | | 150.00(සණ<br>කම) |

08. කලුවඩුමුල්ල ක්‍රීඩාංගණය වැට අලුත්වැඩියාව සදහා අවශ්‍ය ද්‍රව්‍ය සදහා 1.5.6. අංක ස්ටාර්ලයින් හාඩ්වෙයාර් වෙතින්ද 2.3.4. අංක JAT හාඩ්වෙයාර් වෙතින්ද මිලදී ගැනීම සුදුසු බව තීරණය කරන ලදී.

| අනු<br><br>අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ශ්‍රී [illegible] සැල [illegible] | JAT හාඩ්වෙයාර් [illegible] | ස්ටාර්ලයින් හාඩ්වෙයාර් |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | 2X2 Gauge green wire mesh අස 5-11 දිග 30M | | | 19500.00<br><br>MECSON<br>17000.00<br><br>S-LON | 1625.00 | 10500.00<br><br>(S-LON) |
| 2. | 1(සනකම)02MM බට | | | 2800.00<br><br>(PAKISTAN) | (PAKISTAN)2<br>400.00 | 2500.00<br><br>(PAKISTAN) |
| 3. | 3/4(සනකම)02MM බට | | | 2000.00<br><br>(PAKISTAN) | 1800.00<br><br>(PAKISTAN) | 1925.00<br><br>(PAKISTAN) |
| 4. | 2(සනකම)02MM බට | | | 5650.00<br>(PAKISTAN) | 5250.00<br>(PAKISTAN) | 5500.00<br>3LKJHH<br>(PAKISTAN) |
| 5. | CUTTING WHEEL(4 ½) | | | 140.00<br>S-LON<br>75.00 | 80.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6. | WELDING STICKS (NO12) | | | 580.00 | 700.00 | 650.00 |

09.ලීබඩු උපකරණ සදහා දී ඇති අවම මිල ගණන් හා ගුණාත්මක භාවය අනුව 1,2, 3,අයිතමයන් සමගි ලීබඩු ආයතනයෙන් ද 4 අයිතමය දම්රෝ ආයතනයෙන් ද මිලදී ගැනීම සුදුසු බව තීරණය කරන ලදී

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | සමගි ලීබඩු [illegible] | සන්මි ලීබඩු | දම්රෝ ආයතනය |
|---|---|---|---|---|---|---|
| | | | | එකක් තොගය | එකක් තොගය | එකක් තොගය |
| 1. | පුටු (ඇදි සහිත) | 02 | | Piyestra 7500.00<br>Piyestra<br>5500.00 | Lowback 7450.00<br>Piyestra 6400.00 | Lowback<br>11137.50<br>7897.50 |
| 2. | ලියන මේස | 02 | | 8900.00<br>Piyestra 11500.00 | Piyestra<br>9600.00 | Mo212757.50Mo1 and m31<br>14107.50 |
| 3. | වානේ කබඩ් | | | Aoc621 13000.00<br>Paoc631 15000.00 | Piyestra<br>13350.00 | 15457.50<br>17347.50 |
| 4. | මෙලමයින් කබඩ් | | | Pvoc002 17700.00 | Piyesrtra<br>15900.00 | |
| 5. | ඇදි රහිත ප්ලාස්ටික් පුටු | | | 1000.00 | Piyestra<br>850.00 | |

10. ක්‍රීඩා මණ්ඩපයේ වයරින් කිරීම සදහා අවශ්‍ය විදුලි උපාංග සදහා ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයේ මිල පිලිගැනීම සදහා තීරණය කරන ලදී.

| අනු අංකය | අයිතමය | ප්‍රමාණය | වර්ගය | ABC ELECTRICALSC OLOMBO<br>එකක් තොගය | PRASANNA ELECTRICAL COLOMBO<br>එකක් තොගය | ASION ELECTRICALS COLOMBO<br>එකක් තොගය | DELTA IMPEX COMPANY COLOMBO<br>එකක් තොගය |
|---|---|---|---|---|---|---|---|
| 1. | 1/044 දුඹුරු පාටවයර් රෝල් | | | 1780.00<br>sls | SLS<br>1750.00 | 1700.00<br>SLS | 1750.00<br>sls |
| 2. | 1/044 නිල් පාටවයර් රෝල් | | | 1780.00<br>SLS | SLS<br>1750.00 | 1700.00<br>SLS | 1750.00<br>sls |
| 3. | 7/053 වයර් | | | 95.00 sls | SLS<br>95.00 | 90.00 SLS | 95.00<br>sls |
| 4. | 2 ගැන් ස්විච් | | | 275.00<br>sls | SLS<br>270.00 | 250.00<br>SLS | 260.00<br>sls |
| 5. | 3 ගැන් ස්විච් | | | 375.00<br>sls | SLS<br>380.00 | 360.00<br>SLS | 380.00<br>sls |
| 6. | 4 ගැන් ස්විච් | | | 480.00<br>sls | SLS<br>460.00 | 450.00<br>SLS | 470.00<br>sls |
| 7. | 4 සන් බොක්ස් | | | 580.00 | 600.00 | 550.00 | 560.00 |
| 8. | ඇන්ගල් හෝල්ඩර්ස් | | | 110.00 | POLICON<br>110.00 | 100.00<br>POLICON | 110.00 policon |
| 9. | බැටන් හෝල්ඩර්ස් | | | 110.00<br>policon | POLICON<br>110.00 | 100.00<br>POLICON | 110.00<br>POLICON |
| 10. | ඒ.බී.සී. 700 බොක්ස් | | | 580.00 | 585.00 | 550.00 | 570.00 |
| 11. | 10ඒ බේකර් කෑලි | | | 420.00 | SLS<br>430.00 | 400.00<br>SLS | 430.00<br>wayaman |
| 12. | 16ඒ බේකර් කෑලි | | | 420.00 | SLS<br>430.00 | 400.00<br>SLS | 430.00<br>sls |
| 13. | ¾කන්ඩියුට් බට | | | 95.00 | 95.00 | 90.00 | 95.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14. | බස් බාර් කෑලි | | | 22.00 | 25.00 | 20.00 | 30.00 |
| 15. | ¾ බෙන්ඩ් | | | 10.00 | 10.00 | 8.00 | 12.00 |
| 16. | ¾ ජන්සන් බොක්ස් | | | 12.00 | 10.00 | 10.00 | 10.00 |
| 17. | ¾ ජන්සන් බොක්ස් | | | 12.00 | 12.00 | 10.00 | 12.00 |
| 18. | ¾ කන්ඩියුට් ක්ලිප් | | | 12.00 | 12.00 | 10.00 | 12.00 |
| 19. | 1ජගුවර් ඇණ | | | 10.00 | 140.00 | 100.00 | 130.00 |
| 20. | 1 කන්ඩියුට් බට | | | 120.00 | 115.00 | 110.00 | 120.00 |
| 21. | 1බෙන්ඩ් | | | 110.00 | 100.00 | 90.00 | 130.00 |
| 22. | ඉන්සියුලේෂන් ටේප් රෝල් | | | 120.00 | 65.00 | 60.00 | 20.00 |
| 23. | 1 මල් ඇණ පැකට් | | | | | | 70.00 |
| 24. | 1 ½ ඉස්කුරුප්පු ඇණ | | | | | | |
| 25. | සිවිලින් ෆෑන් | | | 5650.00 | 6000.00 | 5500.00 | 6500.00 |
| 26. | බේබි ෆෑන් | | | | | | |
| 27. | ¾ ටී සොකට් | | | 12.00 | 12.00 | 10.00 | |
| 28. | 7/053 වයර් රෝල් | | | 12850.00 | SLS 12500.00 | 12000.00 SLS | 14500.00 SLS |
| 29. | 7/0044සින්ගල් කොරි වයර් | | | 15900.00 | සියාරා 15500.00 | 15000.00 | 16500.00 |
| 30. | 4 POLL මේන් ස්විච් | | | 3950.00 ORENGE | ORENGE 4000.00 | 3800.00 ORENGE | 4100.00 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 31. | 4 WAY ABC BOX | | | 110.00 | 125.00 | 100.00 | 150.00 |
| 32. | 7/067 වයර් රෝල් | | | 12750.00 | 13000.00 SLS | 12000.00 SLS | 14500.00 |
| 33. | බීගන් බල්බ් සෙට් | | | 11500.00 | 11000.00 | 10500.00 | 11500.00 |

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

2018.10.15 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව මම යෝජනා කරනවා

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ටෙන්ඩර් කමිටු වාර්තාවේ දී අර බුෂ් කටර් එක්ක ගන්න එක පළවෙනි එක. එහි ග්‍රිල් එකේ දමා ඇත රු.92500/= ක මුදලකට එක ආයතනයක් දමා ඇත. අනෙක් ආයතනය රු.12**5**00 කටත් රු.11**9**00/= කටත් දමා ඇත. දැන් මේ රු.92500/= මකිටා කියා දමා තිබුණද එහි අදාල මිලිමීටර් ප්‍රමාණය වත් නැත සඳහන් වී ඇත්තේ. මා මේ පවසන්නේ මෙහි බොහෝ අඩු පාඩු ඇත. මෙය නිසියාකාරව බලා නියම ආකාරයට කළ යුතුයි. නැතිනම් මෙය ගැටලු සහගත තත්වයකි. අඩුපාඩු වන්නේ මෙම මිළ ගණන් දෙන විට මෙහි මිලි මීටර් ගණන දමා නැත. **½** ද **¼** කියා සඳහන් නොවේ. දැන් රු.92500/= කට එකක් දමා තිබේ.මකිටා කියා .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බුෂ් කටර් එකේ මිලිමටර් ගණන දමා නැද්ද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මා පවසන්නේ මෙය ඉල්ලුම් කරන විට ලොකු අසාධාරණයක් සිදු වෙනවා.මිළ ගණන් ඉල්ලන විට

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

බුෂ් කටර් එකේ මොකක්ද මිලි මටර් ගණ

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

බුෂ් කටර් එකේ නෙමේ මම කියන්නේ ග්‍රිල් එකේ .මෙහි අංක 01 ලෙස සඳහන් වන දෙයයි. නිකං ග්‍රිල් එක ලෙස මෙහි සඳහන් වේ.එහි එක ආයතනයක් එවා ඇත . රාජ්‍ය වානිජ්‍ය නිතිගත සංස්ථාව මකිටා එහි දමා ඇත රු.92500/= ක්, ඊළඟ එකේ එම්.එච්.කාඩ කියන එකේ රු.12900/= ක් ලෙස අනෙක් එකේ 11900/=සඳහන්වේ.යූ.කේ.එච්. රු.12500කි. එහෙත් මෙය තීන්දු වෙන්නේ කොහොමද ?මෙහි ග්‍රිල් එකේ මිලිමීටර් ගණන 6,12,වර්ගයත් නෑ මොකුත් නෑ .ඒ ග්‍රිල් එකේ දමන 12 ද 13 කියන්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඒ ග්‍රිල් එකේ දමන 12 ද 13 කියන්නේ කටුව වෙනම ගන්න එකක්නේ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නෑ. නෑ. ග්‍රිල් එකේ සඳහන් වෙනවා .වක් එකේ සඳහන් වෙනවා . ඉල්ලන විට ඉල්ලිය යුතු වන්නේ, අනෙක් එක වර්ගය මොකක්ද රටේ . එවා මොකුත් නෑ.මෙහෙ ඉල්ලන විට එම ආයතනවලට අසාධාරණයක් වෙනවා. තෝරා ගැනීමේදි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධයෙන් මොකක්ද පැවසීමට හැකි?

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

නෑ. මන් අසන්නේ ග්‍රිල් එකේ ප්‍රමාණය මොකක්ද?මොකද රු.92500/= ක් තිබෙන්නේ හොඳ එකක් විය යුතුයි.ඔගොල්ලෝ ඉල්ලා සිටින්නේ මොකක්ද? ගරු සභාපතිතුමනි , මෙය පැහැදිලි නෑ. අපි නම් මේ සඳහා අත්සන් තබන්නේ නෑ. මෙය අනුමත කරන්නේ නෑ. අපි තුන්දෙනා මෙයට එකඟ නෑ කැමති අය මේ සඳහා කැමති කර ගන්න. මෙය හැමදාම කරන්න බෑ. මෙය හැමදාම සංශෝධනය කරනවා. අනික තව ගොඩක් එවා මෙහි තිබෙනවා.

**<u>ගරු නගර සභා ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

රාහුල මන්ත්‍රීතුමනි , මේ ග්‍රිල් එක කියන්නේ සාමාන්‍ය උපකරණයක්. මේ වර්ගය තමයි වෙනස් වී ඇත්තේ . රු3000/=,රු.4000/=,රු.5000/= රු.10000 සාමාන්‍ය ගණන් වල ග්‍රිල් එක ඕනැම එකට භාවිතා කළ හැකි සභාවේ තිබිය යුතු උපකරණයක්. එච්චරයි අර්ථ කථනය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

අර්ථ කථනය වෙනයි . එය නිත්‍යානුකූලව ගන්නා විට එය ඒ විදියට විය යුතුයි.එකයි මම කියන්නේ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

ඇවිල්ලා තියෙන්නේ ග්‍රිල් එකක් එය මාකිටාද, වයිනිස් ද කියන එකයි මේ ඇවිල්ලා තියෙන්නේ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක නෙමේ මන්ත්‍රීතුමා මා පවසන්නේ ග්‍රිල් එකක් ඇණවුම් කරන විට එය මිලිමීටර් 3,6,12,13 කියලා ලියන්න ඕන. ඒ අනුව තමයි මිළ ගණන් තියෙන්නේ . මිළ ගණන් දෙන ආයතන අසීරුතාවයකට පත් වෙන්නේ.

**<u>ගරු නගර සභාමන්ත්‍රී  ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

**½** ,  **¼** කට්ට ගන්න තියෙනවා. එහෙම විශේෂ එකක් අවශ්‍ය නම් හිල්ටියක් ඕන ඉල්ලන්න. හිල්ටියට විතරයි **¼** , **½** දැමිය නොහැකි වන්නේ . එහි තියෙන්නේ **½** ඉහල කටු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා කියන්න . පැවසීමට අවශ්‍ය දේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස් .එම්.සරත් චන්ද්‍ර  මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මා කැමතියි දැන ගැනීමට අවශ්‍යතාවය කුමක්ද කියා. අහල් **½** ග්‍රිල් පිට් එක දැමිය හැක්කේ හිල්ටියක් වෙන්න ඕන . වර්ගය මකිටා හෝ වයිනිස් හෝ කුමක් වුවත් කමක් නෑ. මැෂින් ධාරිතාවය වෙනස් වෙනවා **¼** බිට් දැමිය හැකි නම් උපරිම මැෂින් එක පොඩියි. **½** දැමිය හැකි නම් මැෂින් එකේ ධාරිතාවය වැඩියි.එවිට ඒ දෙකේ මිළේ වෙනසක් තිබෙනවා.වර්ගය අනුවත් මිලේ වෙනසක් වෙනවා. දැන් මෙතැන ට මට පෙන විදියට වුවමනා වෙන්නේ අහල් **½** බිට් එක දැමිය හැකි හොඳ වර්ගයක මැෂින් එකක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

එක තමයි සටහන් වෙන්නේ .හරියට සටහන් නොවූ නිසා තමයි ප්‍රශ්නේ

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

සමාවෙන්න , එය රු.92500/= වෙන්නේ නෑ . ඒ දලා තිබුණේ අනෙක් එවත්  දාලා තිබුණා .මකිටා  එකක් දලා තිබුණා රු.12500/= එක බලලා ඔය රු.92500/= එක බලලා එය ප්‍රතික්ෂේප  කරලා තමයි ඔය අඩු ගණනේ එක තමයි තෝරා ගත්තේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මන්ත්‍රීතුමා අපි ඔය රු.92500/= නිර්දෙශ කර නැහැ. අපි ඉල්ලුම් කර ඇත්තේ රු.11900/= ඇති ග්‍රිල් එකයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>**

මෙහි වැඩේ හරියට ලියලා එවිය යුතුය.නැතිනම් මේ මිල ගණන් දෙන ආයතන වලට අසාධාරණයක් වෙනවා.

රජයේ නිතිගත සංස්ථාව වැනි රජයේ ආයතනයකින් තමයි එම මිල ගණන් තියෙන්නේ. එගොල්ලෝ හරියට දැනුවත් නොවීම නිසා තමයි එහෙම සිදු වි ඇතතේ .එකයි අපි කියන්නේ .ඒ නිසායි හරියට කරන්න කියන්නේ .අනෙක් එක තමයි 5 වෙනි එක .මොකක්ද මේ රු.1000 තිළිණපත් 30 ක් සඳහා රු.2000 තිළිණපත් සඳහා මිල ගණන් කැඳවලා තියෙන්නේ .කොහොමද එහි මිල ගණන් තින්දු කරන්නේ .සාහිත්‍ය මාසයේ තිළිණයක් මිලදී ගැනීමේ වඩාත් වාසිදායක ලුම්නෙක්ස් ආයතනයේ මිල ගණන් සුදුසු බවට තීරණය කර ඇත.මොනවාද ඉල්ලා ඇත්තේ . මොනවාද වර්ගය . මෙහි මොකුත් නැනේ .

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

ඒ දෙන්නේ වර්ග නෙමේ. මෙය වවුචර් එකක්. මේ වවුචරේ දෙනවා ඒ ආයතනයෙන් බඩු ගන්න . රු.1000/= ක් වටිනා වවුචරය එක ආයතනයකින් දෙනවා රු.950/=ට

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
එය මෙහි සටහන් වූවානම් හරනේ .

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඔබතුමා තෙරුම් ගත්ත විදියයි ප්‍රශ්නේ . මෙතැන හොරයක් මුකුත් නැත .රු.1000/= වැඩේ රු.850/= කර ඇත්තේ .

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
එය හරි . එත් මෙය එහි ලිවිය යුතුයි. මෙහි මිල ගණන් කැඳවනවාද එලෙස.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
වවුචර් කියන්නේ තිළිණපත් වලට එය ගැටලුවක් නැහැ.කවුද ටෙන්ඩර් කමිටු වාර්තාව ඉදිරිපත් කරන්නේ .ග්‍රිල් එක සම්බන්ධව මකිටා කියන එක ඉවත් විය යුතුයි. රු.92500/= මකිටා කියා නැත. එය සංශෝධනය කරනවා

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

සභාපතිතුමා එය සංශෝධනය කර ගන්න. අපි වැරද්දක් පෙන්වා දුන් විට ඔබතුමා ඒ විදියට කතා කරන්න යන්න එපා.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
ඔබතුමා වරද පෙන්වන්න . මෙහි වරදක් නැත. අපි නිවරදි විදියට තමයි කටයුතු කර ඇත්තේ .නිකන් බොරුවට කැහැගසන්න එපා. මෙතැන වරද පෙන්වා නිවරදි කලානම් එය පිලිගන්නටත් පුරුදු වෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>
එකනේ කිව්වේ . ඔබතුමා පිලි ගන්නේ නැහැනේ මෙය.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>
මම පිලිගන්නේ නැහැ කියන එක නෙමේ ඔබතුමා තිළිණපත් හා වවුචර් කියන එකේ සිංහල තේරුමයි ඉංග්‍රිසි තෙරුමයි අතර දන්නේ නැති කමයි තියෙන්නේ . වෙන දෙයක් තමයි තියෙන්නේ .

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි ,මේ නිලධාරි මහතා කිව්ව කතාවත් එක්ක මම පොඩි දෙයක් ඉදිරිපත් කරන්න කැමතියි. ඇත්තටම මෙම නිලධාරිතුමිය සම්බන්ධව අපි කතා කරද්දි මෙම වාර්තාවේ අංග සම්පුර්ණභාවයක් නොතිබෙන්න පුළුවන් .හැබැයි එතුමියට මේ මෙවලම් සම්බන්ධව භාෂාව පිළිබඳ දැනුමක් තිබෙනවාද කියා. එතැනයි ප්‍රශ්නේ . එතකොට තාක්ෂණ සේවා නිලධාරි හෝ උප තාක්ෂණ සේවා නිලධාරි මහතා තමයි මේ තාක්ෂණ භාෂා හැකියාව එතුමියට දෙන්න. මෙතැන පැටලි ඇත්තේ බ්‍රෂ් කටර් එකයි ග්‍රිල් එකයි. අපිත් සමාන්‍ය භාෂාවෙන් ග්‍රිල් එක විතරයිනේ කියන්නේ. බිට් එක හරි මෙකක්වත් කියන්නේ නැනේ . මේ ½ කටුව දමන්න පුළුවන් ග්‍රිල් එකක් දෙන්න කියන ඕඩර් එක තමයි එතකොට එතැන පැටලි ඇත්තේ .එතුමිය ග්‍රිල් එක වෙනුවට බ්‍රෂ් කටර් එකේ මිල දමා ඇත.ඉතිං මේ තාක්ෂණ භාෂාවේ වැරදිමකි ඇත්තේ.මන් දන්නේ නෑ එතුමිය මේ විෂය කෙරෙහි ප්‍රගුණ කරලා මේ

නගර සභාවට ඇවිල්ලා නෙමේනේ. එ නිසා මා පවසන්නේ මේවා පිළිබඳව පරිශීලනය කර තාක්ෂණ නිලධාරීන් හරහා එන්න.සැමදෙනාම මෙය පරික්ෂා කර එතුමියත් සමඟ සම්බන්ධ වී මෙතැනට අඩුවක් පාඩුවක් නොවන පරිදි බාහිර සමාජයට අඩුවක් පාඩුවක් නොවන පරිදි සකසන්න කියන ඉල්ලීම මම කරන්න කැමතියි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**
මෙම වාර්තාව සකසන විට තාක්ෂණ සේවා නිලධාරි මහතෙකුත් පරික්ෂා කල යුතු බවත් , අත්සනත් තිබිය යුතු බවටත් යන අකාරයට සකස් කරන්න.තියෙන අඩු පාඩු වෙනස් වෙන්නේ නැනේ . මෙතැන තියෙන අඩුපාඩු ටෙන්ඩර් මණ්ඩලයෙ ඉන්න ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමා, නන්දන රාජපක්ෂ මන්ත්‍රීතුමා , අපි කිසිම ආකාරයකින් ටෙන්ඩරයක් ප්‍රදානය කරමිට අපේ පෞද්ගලික උනන්දුවක් නැත.අපිට නිලධාරීන් කරන අවශ්‍යතා ඇරෙන්න වෙන දෙයක් නැත.මෙහි සඳහන් වූ සමහර දේවල් අර්ථ දැක්වීමේදී මෙතැන හොරකමක් සිදු වෙනවා කියන අර්ථය සමහර වේලාවට වැරදි විදියට යනවා.සමහරු වැරදි විදියට අකුරු තෙරුම් ගැනීම නිසා වැරදි විදියට අර්ථ දක්වනවා එ නිසා එහිදි අපි ඒ අර්ථ දැක්වීම එක එක්කෙනාට කිමට නොහැකි ආකාරයට මෙය නිවරදි කර ඉදිරිපත් කරන්න.මේ ටෙන්ඩර් මණ්ඩලය මම යෝජනා කරනවා . කවුද එය ස්ථිර කරන්නේ . විරුද්ධව කවුරුහරි ඉන්නවාද ?විරුද්ධයි . මෙම යොජනාවට පක්ෂ අය ඉන්නවා නම් අත ඔසවන්න. මෙහිදි පක්ෂව ඡන්ද 10 විරුද්ධව ඡන්ද 03 ක් ලෙස මෙය සම්මත වේ . විරුද්ධ වීමට හේතු නැගිට කියා සිටින්න.

**ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්**
අසම්පූර්ණ වාර්තා ලබා දීම තුලින් ඒ නිසියාකාරව ටෙන්ඩර් පත් මෙහි සටහන් නොවිම.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්. එම් .නිලානි මෙනවිය කතා කරමින්**
ගරු සභාපතිතුමනි මා සිතනා ආකාරයට ඔබතුමයි අපේ ගරු මන්ත්‍රීවරු අතර ප්‍රශ්නයක් ඇති විය යුතු නැත . ඒ නිසා මිට පසු අපගේ නිලධාරිතුමියලාට ඒ අවශ්‍ය ප්‍රශ්න ඇති නොවන විදියට සභාවට ඉදිරිපත් කරන එම ටෙන්ඩර් වාර්තා ලබා දෙන ලෙස උපදෙස් දෙන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමායි මන්ත්‍රීවරු අතරයි මින් ඉදිරියට ප්‍රශ්න ඇති නොවෙන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්**
ගරු සභාපතිතුමනි , මා සිතනා ආකාරයට එම නිලධාරිණියට මේ පිළිබඳව අවබෝධයක් නැත. හැබැයි අපි මෙය ඉල්ලන අවස්ථාවේදි අපි එතුමියගෙනුයි තාක්ෂණ සේවා නිලධාරිගෙනුත් සැහෙන්න ප්‍රශ්න ගොඩක් ඇසුවා. මම හිතන්නේ ඒ අවස්ථාවේ ඔබතුමාත් එහි සිටියා එහෙම අසා දැනගෙන අවබෝධ කරගෙන තමයි මෙයට එකඟ වුයේ. මම හිතන්නේ මෙතැන ලිවීමේදි ඇතිවූ දෝෂයක් ලෙස . එහෙම නැතුව අපි කිසිම විටක වැරදි තීරණයක් අරගෙන නැත. ඒ ඕනෑම ප්‍රශ්නයකට අපිට උත්තර සැපයිය හැකිය.සිදුවි ඇත්තේ සටහන් කිරීමේ දෝෂයකි.අපි තාක්ෂණ සේවා නිලධාරින්ගෙන් ප්‍රශ්න අසා දැනගෙන තමයි එහි අත්සන් තබා ඇත්තේ. එ නිසා එම තීරණය ගැන සම්පූර්ණයෙන්ම මට වගකිම ගත හැකිය.

**තීරණය-**

2018.10.15 දින ප.ව 2.30 ට පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව පිළිගැනිම වෙනුවෙන් පක්ෂව ඡන්ද 10 ක් සහ විපක්ෂව ඡන්ද 03 ක් වශයෙන් සභා සම්මත විය

ඉදිරියේදි ටෙන්ඩර් කමිටු වාර්තාව සකස් කොට තාක්ෂණ සේවා නිලධාරි මහතා මඟින් පරික්ෂා කොට සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව සභාව විසින් තීරණය කරන ලදී.

**06.05 2018.10.23** දින පැවති ක්‍රීඩා කමිටු වාර්තාව

**ක්‍රීඩා කමිටු වාර්තාව**

## 2018.10.23

**සහභාගිත්වය-**

| | | |
|---|---|---|
| ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා- | | ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ධම්මික කොඩිකාර මහතා | - | ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.ඉනෝකා ක්‍රිෂානති මිය | - | ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩබ්ලිව්.එම්.නිලානි මෙ.වි | - | ගරු නගර සභා මන්ත්‍රිණී,අම්බලන්ගොඩ නගර සභාව. |
| කසුන් ගාල්ලගේ මහතා | - | ක්‍රීඩා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ. |
| ටී.ආර්.සී.කේ.ද සිල්වා මහතා | - | ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| මතීෂ ද සිල්වා මහතා | - | ගා/ධර්මාශෝක විද්‍යාලය,අම්බලන්ගොඩ. |
| ඒ.කේ.එස්.අයි.නන්දනී මිය | - | ගා/ප්‍රජාපතීගෝතමී බා.වි.,අම්බලන්ගොඩ. |
| ඒ.කේ.එස්.ඩී.ශ්‍යාමලී මිය | - | ගා/ග්‍රාමණී ම.වි.,අම්බලන්ගොඩ. |
| ආර්.ජී.නිමල් චන්ද්‍රසිරි | - | 35,පෝරඹ,අම්බලන්ගොඩ. |
| ජේ.ඩබ්ලිව්.ආනන්ද සිල්වා මහතා | - | ඇවිදින්නන්ගේ සංගමය . අම්බලන්ගොඩ. |
| ජේ.ජයවර්ධන මහතා | - | ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ. |
| එස්.එම්.නීල් වසන්ත මහතා | - | පිහිනුම් පුහුණුකරු, අම්බලන්ගොඩ. |
| මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා | - | ක්‍රීඩා කමිටු සාමාජික,පෝරඹ, අම්බලන්ගොඩ. |
| බී.ඒ.ධම්මිකා මිය | - | ලේකම්,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඩී.එච්.සඳුන් ගුණවර්ධන මහතා | - | තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව. |
| එච්.එල්. ද සිල්වා නිලමුණි | - | තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව. |
| ජී.අශෝක කුමාර මහතා | - | ක්‍රීඩා භූමි උපදේශක,අම්බලන්ගොඩ නගර සභාව. |
| ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා | - | දකුණු පළාත් පා පන්දු පුහුණුකරු |
| ඩී.වී.තරංගි මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව. |

**පිළිගැනීම.- ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

අද දින ක්‍රීඩා කමිටුවට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන්ලා ,මන්ත්‍රීතුමියන්ලා, පාසල් නියෝජනය කරමින් පැමිණි ගුරු මහත්ම, මහත්මීන්,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි මහත්ම,මහත්මීන්, නිලධාරි මහත්ම,මහත්මීන් ඇතුළු සියළු දෙනා පිළිගනිමින් ක්‍රීඩා කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි. මීට පෙර මෙම කමිටුව ප.ව 2.30ට පවත්වනු ලැබූ බවත් එම වේලාවට පාසල් හා අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරින්ගේ සහභාගිත්වය අඩු බැවින් මෙම වේලාව යොදාගත් බවත් අද දින සහභාගිත්වය බැලූකල එය සාර්ථක බව පැහැදිලි කරන ලදි.

<u>පසුගිය කමිටුවේ දී සාකච්ඡා කරන ලද කරුණු සමාලෝචනය</u>

**වයස අවු.16න් පහළ පා පන්දු තරගාවලිය සංවිධාන කිරීම.**
**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා,ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මෙම තරගාවලිය සංවිධානය කිරීමට අදාළව පාපන්දු පුහුණුකරු ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය මහතා විසින් ඉදිරිපත් කරන ලද රු.55,000.00 ඇස්තමේන්තුව පිළිගත යුතු බවට ගරු සභාපති නීතිඥ ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කරන ලද අතර කමිටුව විසින් ඒකමතිකව ස්ථිර කරන ලදි.

ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය,
පා පන්දු පුහුණුකරු.

නගර සභා පා පන්දු සංචිතය,

නගර සභාව - අම්බලන්ගොඩ.
2018.10.16.

නගරාධිපතිතුමා,
නගර සභාව-අම්බලන්ගොඩ.

<u>නගරාධිපති කුසලාන වයස අවු.16න් පහළ බාලක පා පන්දු තරගාවලිය -2018</u>
<u>දළ ඇස්තමේන්තුව</u>

2018.09.20 දින ක්‍රීඩා කමිටුවේ සාකච්ඡා කරන ලද පරිදි, පාපන්දු ක්‍රීඩකයන්ගේ දක්ෂතා ඔප් නැංවීම හා නගර සභා පාපන්දු සංචිතයට ක්‍රීඩකයන් තෝරා ගැනීමේ අරමුණින් ,නගරාධිපති කුසලාන වයස අවු.16න් පහළ බාලක /බාලිකා පාපන්දු තරගාවලිය සංවිධානය කිරීමට අදාළ ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| | | | |
|---|---|---|---|
| 01. | ජයග්‍රාහී කණ්ඩායම් සඳහා ශුරතා කුසලාන වියදම | - | රු. 20,000.00 |
| 02. | සහතික පත් සඳහා වියදම | - | 15,000.00 |
| 03. | තරඟ සඳහා තනතුරු වියදම | - | 10,000.00 |
| 04. | විනිසුරු සංග්‍රහ සහ අනෙකුත් වියදම් | - | <u>10,000.00</u> |
| | මුළු විදයම | - | <u>**55,000.00**</u> |

ස්තූතියි

මෙයට,

......................
ඉඳුනිල් එදිරිවික්‍රම සූරිය,
පාපන්දු පුහුණුකරු,
නගර සභා පාපන්දු සංචිතය.

**ඩී.වී.තරංගි -ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව**
මෙම තරගාවලිය සංවිධානය කිරීමට දකුණු පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂකගෙන් අනුමැතිය ලබා ගැනීමේ ලිපිය යොමු කරන ලද බව දැනුවත් කරන ලදි.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය - පාපන්දු පුහුණුකරු,අම්බලන්ගොඩ නගර සභාව.**

මෙම තරගාවලියට ලීග් කලාපයට අයත් පාසල් කණ්ඩායම් සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටින ලදි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි මෙම තරගාවලිය ආරම්භ කළේ 90 ගණන් වල, එහිදි තෝරා ගත් ක්‍රීඩකයන්ගෙන් සැදුම් ලත් සංචිතයේ පළමු කණ්ඩායම ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මගින් සංවිධානය කරන ලද වයස අවු.19න් පහළ කණිෂ්ඨ පාපන්දු තරගාවලියේ අවසන් තරගයට සුදුසුකම් ලබා ගත්තා. ශ්‍රී ලංකා යුධ හමුදාවේ කෙටේරියන්ස් පාපන්දු කණ්ඩායමේ සම්පූර්ණයෙන්ම සෙල්ලම් කරන්නේ අපේ සංචිතයේ හිටපු ක්‍රීඩකයන්. මෙම තරගාවලියෙන් දක්ෂම ක්‍රීඩකයන් 20 තෝරා ගන්න. ඔවුන්ට පුහුණුවීමට අවශ්‍ය සියළුම පහසුකම් අපි සපයා දෙන්නම්. අවුරුදු පහක් වෙනකොට අපේ නගරය වෙනුවෙන් ක්‍රීඩා කරන ක්‍රීඩකයන් 100ක් අපි පුහුණු කරල තියනවා. අදටත් මේ නගරයේ පාපන්දු තියෙන්නේ මෙම තරගාවලිය හා සංචිතය නිසයි. මේක ක්‍රීඩකයන්ටත් ලැබෙන හොඳ අවස්ථාවක්. මෙම තරගාවලියේ විනිශ්චය සඳහා සංචිතයේ පෙර සෙල්ලම් කරපු ක්‍රීඩකයන් සම්බන්ධ කර ගන්න. මෙම තරගාවලිය පිළිබඳව පාපන්දු සම්මේලනය ද දැනුවත් කරන්න.දක්ෂතම ක්‍රීඩකයන් 20 තෝර ගන්න හොඳ කමිටුවක් පත් කර ගන්න.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය - පාපන්දු පුහුණුකරු,අම්බලන්ගොඩ නගර සභාව.**
ජ්‍යෝෂ්ඨ දිස්ත්‍රික් ක්‍රීඩා නිළධාරි සරත් කුමාර මහතා,අම්බලන්ගොඩ ක්‍රීඩා නිලධාරි කසුන් ගාල්ලගේ මහතා, දිස්ත්‍රික් මළල ක්‍රීඩා පුහුණුකරු රාජ් නිරෝෂන මහතා, පාපන්දු පුහුණුකරු මහේන්ද්‍ර වික්‍රමසිංහ මහතා මෙම තෝරා ගැනීමේ කමිටුවට පත්කරගත් බව දන්වා සිටින ලදි.

❖ කළුවඩුමුල්ල ක්‍රීඩාංගණයේ ආරක්ෂිත වැට සෑදීමට අවශ්‍ය බඩු ඇණවුම් කර දීම.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කොහොමද දැන් වැඩ කටයුතු?

**ඩී.වී.තරංගි -ප්‍රජා සංවර්ධන නිලධාරි,අම්බලන්ගොඩ නගර සභාව**
සැපයුම් නිලධාරි විසින් බඩු මිලදී ගෙන ගබඩාව වෙත ලබා දී ඇති බව දන්වන ලදි.

❖ **මහජන ක්‍රීඩාංගණයේ වතුර රැඳෙන එක නැවැත්වීමට හා ගාලු පාර අයින දිගේ ගල් බැම්මට උඩින් යකඩ වැටක් සෑදීමට ඇස්තමේන්තු සකස් කිරීම.**

**ඩී.එච්.සඳුන් ගුණවර්ධන මහතා -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
අදාළ ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති බව දන්වන ලදි.

❖ මාදම්පා ගඟ පිහිනුම් තටාකයේ ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ ඇස්තමේන්තුව ලබා දීම.

**ඩී.එච්.සඳුන් ගුණවර්ධන මහතා -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
මැනුම් ලබා ගෙන තියෙන්නේ, පිහිණුම් තටාකයේ Starting Blocks හයම කැඩිල. Concrete Slab එකත්, කණුත් කැඩිල තියෙන්නේ. Starting Blocks කොන්ක්‍රීට්වලින් හදන්න කියල ඉල්ලීමක් කරල තියනවා.එහෙම හදන එක ගැටළුවක්, ඇලුමිනියම් වලින් හදන එක හොඳයි.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
ධර්මාශෝක විද්‍යාලයේ Pool එක හොඳයි. ඒක බලලා ඒ විදියට හදල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපේ දක්ෂ ළමයි මේවගේ පුහුණුවීම් කරනවා. ප්‍රමිතියට අනුව හදල දෙන්න.

**ජේ.ජයවර්ධන මහතා, ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
අපි ළඟ හදපු Ladders තියෙනවා ඒවත් සවිකර දෙන්න.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
මගේ ළඟත් Ladder එකක් තියෙනවා.අවශ්‍යනම් දෙන්නම්.

**එස්.එම්.නීල් වසන්ත මහතා,පිහිනුම් පුහුණු කරු, අම්බලන්ගොඩ.**
සභාපතිතුමනි, මාදම්පා පිහිනුම් තටාකයේ Finishing එක කරන කොන්ක්‍රීට් කොටසේ බෙල්ලෝ වගයක් හැදෙනවා උන්ගේ කටුවලට ළමයින්ගේ කකුල් කැපෙනවා.

**ජේ.ජයවර්ධන මහතා, ඩොල්ෆින් ක්‍රීඩා සමාජය,අම්බලන්ගොඩ.**
උන් අයින් කරන්න කරන්න හැදෙනවා.අයින් කළවිට ඉතුරුවන කොටසට කැපෙනවා වැඩියි.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මේකට මොකක්ද කරන්න පුළුවන්?ළමයින්ට තුවාල වෙන්න හොඳ නැහැ.

**එස්.එම්.නීල් වසන්ත මහතා,පිහිනුම් පුහුණු කරු, අම්බලන්ගොඩ.**
රබර් ආවරණයක් දාන්න පුළුවන්නම් හොඳයි.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව**
ගහේ ඔය ඉදිකිරීම් කරන එක ගැටළුවක්, Pool හදන අයගෙනුත් උපදෙස් ගන්න පුළුවන්නම් හොඳයි. බළපිටයේ සභාපතිතුමාගේ මස්සිනාත් ඉන්නවා,කථා කරල බලන්න.

**ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
MasterDivers ගෙනුත් උපදෙස් ගන්න පුළුවන්, මමත් පෞද්ගලිකව කථා කරන්නම්.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඇස්තමේන්තුවට ඔය කියන කාරණයත් ඇතුලත් කරලම හදන්න.

❖ මහජන ක්‍රීඩාංගණයේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරිමට හා තණකොළ සිටුවීමට අදළ ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබා ගැනීම.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි මේ විසිරි ජල සැපයුම් පද්ධතිය සකස් කිරීමට අදාළ ඇස්තමේන්තුව අනුමැතියට යවල මාස දෙකකට විතර පස්සේ අඩු පාඩු දන්වල එවල තිබුණ දැන් අළුත් තත්වය මොකක්ද?

**ඩී.එච්.සඳුන් ගුණවර්ධන මහතා -තාක්ෂණ සේවා නිලධාරි ,අම්බලන්ගොඩ නගර සභාව**
ඒ ලිපියෙන් දන්වල තිබුනේ මිල ගණන් ලබා ගැනීම ගැටළු සහගතයි කියල. විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් කරන්න කියල උපදෙස් දීල තිබුණා.අපේ පිරිවිතරයන් දීල නැවත මිල ගණන් කැඳවන්න අවශ්‍යයි. ඇස්තමේන්තුව ලක්ෂ 20ට වැඩි වන නිසා ආයතන තුනකින් අනිවාර්යෙන්ම මිල ගණන් කැඳවන්න කිව්වා.අපි පිරිවිතරයන් හදල තියෙන්නේ ඒ අනුව එම වෘත්තිය ඉටු කරන ආයතන තුනකින් මිල ගණන් මේ සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කරන්නම්.
තණකොළ සිටුවීමේදී පිට්ටනියේ දැනට තියෙන මට්ටම් සමාන නැහැ, ඒ නිසා දැනට තියෙන Layer එක අඟල් තුනක්වත් පස් බුරුල් කරල තව අඟල් 3ක්වත් පස්,කොහුබත් එකතු කරල දාන්න අවශ්‍යයි.
ඒකටත් අපේ පිරිවිතරයන් අනුව තණකොළ වර්ගය නඩත්තු කාලය ආදි වශයෙන් ඇතුළත් කරලා මිල ගණන් කැඳවීම කරන්න කටයුතු කරන්න අවශ්‍යයි.

**ධම්මික කොඩිකාර මහතා,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
මිල ගණන් කැඳවන ආයතනයන්ගෙන්ම Proposal එකත් ගන්නවනම් හොඳයි.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව**
Cricket Board එකෙන් සම්බන්ධ කර ගන්න ආයතනය පිලිබඳව ලිඛිතව ගමු.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**

දැන් මේකට Cricket Board එක සම්බන්ධ කර ගන්න අවශ්‍ය නැහැ. අපිටම තමයි කරන්න වෙන්නේ Cricket Board එකේ දැන් තියෙන ප්‍රශ්න විසඳගෙන පිට්ටනිය හදන්න ගියොත් තව අවුරුදු දෙකක්වත් යාවි. මේ වැඩ ටිකට තව ලක්ෂ 100 විතර යනවා. නගර සභාවෙන්ම වියදම් කරල මේ වැඩය කරමු.පළාත් සභාව භාරේ නගර සභාවට අයිති මුදල් ලක්ෂ 300 විතර තියෙනවා.අපි මහ ඇමතිතුමත් එක්ක කථාකරල මේ ගැන දැනුවත් කරල ඒ මුදල් නිදහස් කර ගන්න බලමු. අපි මේ වසරේ නගර සභා බල ප්‍රදේශයේ දරුදැරියන් 2500 කටත් සියළුම දහම් පාසල් දරු දැරියන්ටත් නොමිලේ අභ්‍යාස පොත් ලබාදෙන්න කටයුතු සංවිධානය කරමින් තිබුනේ ඒකට ඇස්තමේන්තු මුදල ලක්ෂ 50ක්, අපි මුළු සභාවම ඒකමතිකව තීරණය කළා මේ වසරේ පොත් නොදී කොහොම හරි පිට්ටනියේ වැඩ ටික අවසන් කරමු කියල. මගේ ඉලක්කය ඊ ළඟ Big Match එක මේ පිට්ටනියේ පැවැත්වීම. ලංකාවේ මැතකදී හදපු මම දැක්ක හොඳම පිට්ටනිය තමයි ධර්මපාල පිට්ටනිය. ධර්මාශෝක විද්‍යාලයේ හිටපු විදුහල්පති පණ්ඩිතරත්න මහත්මයාගේ මූලිකත්වයෙන් තමයි මේ පිට්ටනිය හැදුවේ. පසුගිය දවසක මමයි ධම්මික කොඩිකාර මන්ත්‍රීතුමයි ගියා මේ පිට්ටනිය බලන්න. පිට්ටනි සෑදීම සම්බන්ධයෙන් හොඳ දැනුමක් තියෙන රවි කියල මහත්මයෙක් තමයි ඒ පිට්ටනිය කරල තියෙන්නේ,අපට ඒ මහත්මයව හඳුන්වා දුන්නා. එතුමාවත් සම්බන්ධ කරගෙන මේ වැඩය හොඳට කරන්න පුළුවන්. To මේ සභාවට විසිරි ජල සැපයුම් පද්ධතිය හා තණකොළ සිටුවීමට අදාල ඇස්තමේන්තු හා මිල ගණන් අනිවාර්යෙන්ම ඉදිරිපත් කරන්න. සභාවෙන් පසු දින සිටම වැඩ කරන්න පටන් ගන්න අවශ්‍යයි.

**ටී.ආර්.සී.කේ.ද සිල්වා මහතා ,ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලය,අම්බලන්ගොඩ.**
සභාපතිතුමනි, දේවානන්ද විද්‍යාලය පැත්තේ කාණුවත් හදල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
පැවිලියන් එක ළඟ ඉඳලා දේවානන්ද විද්‍යාලය දක්වා අළුතින් කාණුවක් සෑදිමට හා මේ කාණුව ප්‍රතිසංස්කරණයට අදාළ ඇස්තමේන්තුත් සභාවට ඉදිරිපත් කරන්න.

**අදහස් හා යෝජනා**

**කසුන් ගාල්ලගේ මහතා,ක්‍රීඩා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ.**
සභාපතිතුමනි, ක්‍රීඩා අමාත්‍යාංශයේ ලක්ෂ 30 වෙන්වෙලා තියෙනවා.අපි යෝජනා කලේ හල්වතුර ඇවිදින මංතීරුව දික් කරන්න. මේ ගැන ලිඛිතව දන්වාවි.අපට අවශ්‍ය ඉඩ පහසුකම් ලබාදෙන්න.
**ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අපි අනුමැතිය ලබා දෙන්නම්.

**ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව**
කොන්ක්‍රීට් කරලද හදන්නේ?

**කසුන් ගාල්ලගේ මහතා,ක්‍රීඩා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ.**
නැහැ, අළුත් ඇවිදින මංතීරු හදන්නේ වැලියි, මැටියි එකතු කරල.

**සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව**
හල්වතුර කියන්නේ සම්පූර්ණයෙන්ම වගුරු ජලාශයක පස් පුරවල හදපු ප්‍රදේශයක්, වැසි කාලවලදි මඩ වෙයි. මේ ගැන තව ටිකක් සොයා බලලා තීරණයක් ගත්තනම් හොඳයි.

**කසුන් ගාල්ලගේ මහතා,ක්‍රීඩා නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අම්බලන්ගොඩ.**
ක්‍රීඩා අමාත්‍යාංශයේ ගමකට ක්‍රීඩාංගණයක් වැඩසටහනට මම යෝජනා කළා තල්ගස්ගොඩ ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න. මීටර් 400 ට්‍රැක් හදන්න පුළුවන් අම්බලන්ගොඩ එකම ක්‍රීඩාංගණය තමයි ඒක. දැනට තියෙන කොටසටම ඇළ පැත්ත තව ටිකක් පුරවගන්න පුළුවන්නම් හොඳයි.
**ඇම්.ඩබ්ලිව්.අරුණ මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මුළින් අපි මේ පිට්ටනියේ වැඩ ටික අවසන් කරගන්න බලමු.ඊට පස්සේ තල්ගස්ගොඩ පිට්ටනියත් හදමු.

**ඒ.ඩබ්ලිව්.ජගත් කුමාර මහතා ,ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි, මානාන පිට්ටනියේ ආරක්ෂිත දැල එක පැත්තක කපලා,මීට පෙරත් දැනුවත් කරල තියෙන්නේ ඒක හදල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
කපලා තියෙන් දැල් කොටස හදල දෙන්න.ධර්මාශෝක විද්‍යාලයේ ක්‍රිකට් පුහුණුකරු කමල් කාරියවසම් මහතා ඉල්ලීමක් කරා මානාන පිට්ටනියේ Turf Wicket තුනක් හදන්න ඉඩ දෙන්න කියල.මේ ගැන ක්‍රීඩා මණ්ඩලයේ සාකච්ඡා කරල තියෙනවා. මානාන පිට්ටනිය තියෙන්නේ L හැඩයට ඇළ පැත්තෙ හදන්න අපට අවසර දෙන්න පුළුවන්,ලිඛිතව ඉල්ලීමක් කරන්න කියන්න. මානාන පිට්ටනිය බැකෝ එක දාල සුද්ද කරල ,අඩුපාඩු හදල දෙන්න. පිට්ටනියේ අනවසරයෙන් හදල තියෙන මඩුවත් ඉවත් කරන්න.

පාසල් වල ක්‍රීඩාව ඔප් නංවන්න නගර සභාව විදියට ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. මේ වගේ Sports Complexes හදන්න යෝජනා තියෙනවානම් අපිට කියන්න.අපි කරල දෙන්නම්.

**මතීෂ ද සිල්වා මහතා,ගා/ධර්මාශෝක විද්‍යාලය,අම්බලන්ගොඩ.**
මම මේ ගැන සොයල දැනුවත් කරන්න කටයුතු කරන්නම්.

**සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා -ගරු නගර සභා මන්ත්‍රී,අම්බලන්ගොඩ නගර සභාව**
ධර්මාශෝක විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පතිතුමාත් මගෙන් ඉල්ලීමක් කලා. අපේ මහජන ක්‍රීඩාංගණය වටේ නා පැළ සිටුවීමට අවසර දෙන්න කියලා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
අවසර දෙන්නම්.

**ඒ.කේ.එස්.අයි.නන්දනී මිය,ගා/ප්‍රජාපතීගෝතමී බා.වි.,අම්බලන්ගොඩ.සභාපතිතුමනි,**
ප්‍රජාපති ගෝතමී බාලිකා විද්‍යාලයට ලබා දී තිබෙන තෙමහල් නිවස පැවති ඉඩමේ දැන් ගොඩනැගිල්ල නැහැ. හොඳටම වල් බිහිවෙලා තියෙන්නේ, පුළුවන්නම් එම ඉඩම එළිපෙහෙළි කරල දෙන්න. අපට ශරීර සුවතා වැඩසටහන් කරන්න පුළුවන්

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්රදීප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
To මහතා මේ වැඩේ කරල දෙන්න.

**ජේ.ඩබ්ලිව්.ආනන්ද සිල්වා මහතා,ඇවිදින්නන්ගේ සංගමය . අම්බලන්ගොඩ.**
මීට කළිනුත් මේ යෝජනාව කරල තියෙනවා,වැඩේ කෙරුනේ නැහැ,Beach Park එකට සෙල්ලම් උපකරණ කිහිපයක් හදල දෙන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
To මහතා මේ වැඩෙත් බලන්න.

**ඉඳුනිල් එදිරිවික්‍රමසූරිය - පාපන්දු පුහුණුකරු,අම්බලන්ගොඩ නගර සභාව.**
සභාපතිතුමනි, මමත් මේ ළඟදි දවසක මාදම්පා ගඟේ පීනන්න ගියා.ඇත්තටම වතුර හොඳටම අපවිත්‍රයි. ගෙවල් වලින් අපජලය මාදම්පා ගඟට එකතු කරනවා.මේ ගැන සොයා බලා පියවරක් ගන්න.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
මීට පෙරත් මේ ගැන පැමිණිලි ලැබිලා තියෙනවා. මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට මේ ගැන සොයා බලා වාර්තාවක් දෙන්න කියන්න.
**එස්.එම්.නීල් වසන්ත මහතා,පිහිනුම් පුහුණු කරු, අම්බලන්ගොඩ.**
ඒ වගේම සභාපතිතුමනි, පාලම ළඟ කරවල වේලන අය මාළු කපල මාළු ඔළු මුහුදට විසිකරනවා. ගඟේ වතුර අඩුවෙන වේලාවට ඒ මාළු ඔළු ගඟට ගහගෙන එනවා.

**ඇම්.ඩබ්ලිව්.අරුණ ප්‍රදිප් මහතා, ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව.**
ඒ අයට එම අපද්‍රව්‍ය නගර සභා ට්‍රැක්ටර්වලට දෙන්න පුළුවන්නේ, මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට මේ ගැනත් සොයා බලන්න කියන්න.

ස්තුති කථාව
**ස්තුති කථාව- ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා,**
අද දින ක්‍රීඩා කමිටුව සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමා ඇතුළු සියළුම නගර සභා මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාටත්, විශේෂයෙන්ම පාසල් නියෝජනය කරමින් පැමිණි ආචර්ය මණ්ඩලයේ සියළු දෙනාටත් ,ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි සියළුම මහත්වරුන්ටත් නිලධාරි සියළු දෙනාටත් ස්තුතිය පුදකර සිටින ලදි.මෙම කමිටුව සඳහා තම ආයතන නියෝජනය කරමින් පැමිණිමේ දී ක්‍රීඩාවේ උන්නතිය සඳහා තීරණ තින්දු ගැනීමට පහසු වන බව පෙන්වා දෙමින් කමිටුව සඳහා උපරිම සහභාගිත්වය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ,

........................................
ප්‍රජා සංවර්ධන නිලධාරි,
නගර සභාව- අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ........................................ | ........................................ |
| ලේකම්, | සභාපති, |
| නගර සභාව- අම්බලන්ගොඩ. | නගර සභාව-අම්බලන්ගොඩ. |

2018.10.23 දින අම්බලන්ගොඩ පුස්තකාල රැස්වීම් ශාලාවේදි පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදී.

තිරණය -

2018.10.23 දින ප.ව 2.30 ට පැවති පුස්තකාලකමිටු රැස්වීම් වාර්තාව පිළිගැනිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රෙෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**06.06 2018.10.31 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව**

<u>නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව</u>
**2018/**10.31

<u>සහභාගීත්වය -</u>

| | |
|---|---|
| **එම්.ඩබ්.අරුන ප්‍රදීප් මහතා.** | **ගරු සභාපති,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ඩී.ධර්මදාස ද සිල්වා මහතා.** | **ගරු නගර සභා මන්ත්‍රී,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ධනසේන මාද්දුවගේ මහතා.** | **ගරු නගර සභා මන්ත්‍රී,නගර සභාව ,අම්බලන්ගොඩ** |
| **බී.ඒ.ධම්මිකා මිය.** | **ලේකම්,නගර සභාව ,අම්බලන්ගොඩ.** |
| **ඊ.වාසනා තරංගි මිය.** | **ප්‍රජා සංවර්ධන නිලධාරි ,නගර සභාව ,අම්බලන්ගොඩ.** |

**පී.එම්.විජේසිංහ මෙනවිය.තාක්ෂණ සේවා නිලධාරිනී, නගර සභාව ,අම්බලන්ගොඩ.**
**ඩී.රජිතා ක්‍රිෂාන්ති මෙන්ඩිස් මිය. කළමනාකරණ සහකාර,නගර සභාව ,අම්බලන්ගොඩ.**

**කුලසේන ගුරුගේ මහතා.** **ප්‍රදේශ නියෝජිත.**

<u>පිළිගැනීම -</u>
ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතාගේ ප්‍රධානත්වයෙන් නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදි .
ගරු සභාපති තුමන් විසින් අද දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පැමිණි සියළු දෙනා පිළිගන්නා ලදි.
**<u>ලැබී ඇති ලිපි ඉදිරිපත් කිරීම -</u>**
මෙවර කමිටුව සඳහා කිසිදු ලිපියක් ලැබී නොතිබුණි.

**<u>යෝජනා හා අදහස් -</u>**

➢ T.H.W. නිවාස වල අංක 62 පදිංචි ගිනිගල් ගොඩගේ නන්දසිරි ද සිල්වා මහතා විසින් තමාට අයත් අංක 90 දරණ බිම් කොටස ඔහුග් දියණිය වන ගිනිගල් ගොඩගේ රුවිනි පේෂලා කුමාරි මියට පවරා දීමට අදාල

- පැවරීමට අදාල ලිපිය.
- දිවුරුම් ප්‍රකාශය

ඉදිරිපත් කර ඇති බැවින් මෙම T.H.W. නිවාස වල ඔප්පු ලබාදීමේදී අංක 90 කොටසේ හිමිකාරීත්වය ගිනිගල් ගොඩගේ රුවිනි පේෂලා කුමාරි මියගේ නමට ඔප්පුව ලබා දීම සුදුසු බවට කමිටුව මඟින් නිර්දේශ කරන ලදි.

➢ මෙම කමිටුව පැවැත් වීමට කරුණු කාරණා නොමැති විටදී මාස් පතාම කමිටුව පැවැත් වීම අවශ්‍යා නොවන බව සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**<u>ස්තූති කථාව -</u>**

ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා විසින් පැමිණ සිටින සියල්ලටම ස්තූතිය පුද කර අතර නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව නිමාවට පත් විය .

**සකස් කළේ,**

........................
**කළමනාකරණ සහකාර**
**නගර සභාව -අම්බලන්ගොඩ.**

..................................
**ලේකම්,**
**නගර සභාව -අම්බලන්ගොඩ.**

..............................
**සභාපති**
**නගර සභාව -අම්බලන්ගොඩ.**

තීරණය -

2018.10.3.1 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද නිවාසහා ප්‍රජා සංවර්ධන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

## 06.07 2018.10.12 දිව පැවති ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමේ කමිටු වාර්තාව

<u>ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමේ කමිටු රැස්වීම</u>
<u>2018.**10.12** දින පෙ.ව. 10.30</u>

<u>සහභාගීත්වය</u>

| | | |
|---|---|---|
| **16.** | කමල් වැල්ලගේ මයා | - ගරු උප සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| **17.** | ඩෙනට් පනියන්දුවගේ මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **18.** | ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **19.** | නන්දන රාජපක්ෂ මහතා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **20.** | දිනයාදුර ධර්මදාස මහතා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **21.** | එම්. අතුල ප්‍රියන්ත මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **22.** | ඩබ්.එම්. නිලානි මෙනවිය | - ගරු නගර සභා මන්ත්‍රිණී, අම්බලන්ගොඩ නගර සභාව |
| **23.** | කේ. ශ්‍රේෂන් මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **24.** | එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා | - ගරු නගර සභා මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| **25.** | ජී.ජී.ආර්. පේෂලා මිය | - ගරු නගර සභා මන්ත්‍රිණී, අම්බලන්ගොඩ නගර සභාව |
| **26.** | ඊ.එම්. ඉන්ද්‍රා අයිරාංගනි මිය | - ගරු නගර සභා මන්ත්‍රිණී, අම්බලන්ගොඩ නගර සභාව |
| **27.** | බී.ඒ. ධම්මිකා මිය | - ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |
| **28.** | ටී. චන්න මයා | - ආදායම් පරීක්ෂක |
| **29.** | අචිරා රංජනි ලොකුගේ මිය | - කළමනාකරණ සහකාර |

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

ත්‍රිරෝද රථ ලියාපදිංචි කිරීමේ රැස්වීම සඳහා සහභාගි වීමට පැමිණි ගරු නගර සභා මන්ත්‍රීතුමන් හා තුමියන්ලාත්, ලේකම් තුමිය, ආර්.අයි. මහතා සහ විෂය ලිපිකරු ඇතුළු සියළු දෙනාම ඉතාමත් ගෞරයෙන් පිළි ගන්නා බව ප්‍රකාශ කරමින් ත්‍රිරෝද රථ ලියා පදිංචි කිරීමේ කමිටුවේ කටයුතු ආරම්භ කරන ලදී.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

එහිදී පෙන්වා දෙන ලද්දේ දැනට ත්‍රිරෝද රථ ලියාපදංචිය සඳහා කැඳවා ඇති 120 දෙනා අතරින් තවදුරටත් ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් වී නොමැති 40 දෙනෙකු පමණ සිටින බවත්ය. මෙය ක්‍රියත්මක කිරීම ආර්.අයි. මහතා ඇතුළු සියළු නිලධාරින්ගේ හා පොලිසියේ වගකීම වන බවත්යග. මෙය ක්‍රියත්මක කිරීමට නොහැකි නම් මේ සඳහා මන්ත්‍රීතුමන්ලා වැය කරන කාලය අපතේ යැවීමක් වන අතරම ඔහු ඇතුළු සියළු මන්ත්‍රීතුමන්ලාගේ තනතුරු වලට ද එය අගෞරවයක් වන බව තවදුරටත් සඳහන් කරන ලදී. තවද මෙම කමිටුවේ කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට නොහැකි නම් එය ඔහු සහභාගි වන අවසාන කමිටුව විය හැකි බවද ප්‍රකාශ කරන ලදී. ත්‍රිරෝද රථ කමිටුව සඳහා සහභාගි වීමට පැමිණි විපක්ෂ නායක තුමන්ද ගෞරවයෙන් පිළි ගන්නා බව ප්‍රකාශ කරන ලදී.

**<u>කේ. ශ්‍රේෂන් මයා - ගරු නගර සභා මන්ත්‍රී,</u>**

**ත්‍රිරෝද රථ ලියාපදිංචිය සඳහා කැඳවුම් කරන ලද අය අතර තවමත් මුදල් නොගෙවා සිටින අය ඇති බව පෙන්වා දෙන ලදී.**

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

**මෙය ක්‍රියාත්මක වන්නේ නැත්තම් මෙයින් වැඩක් නෑ.**

<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>

**වාහන නවතා තැබීම හේතුවෙන් පස්චන හරස් වීදියේ පයින් ගමන් කිරීමට අපහසු බවත් අපේ නගරයේ අපේ අම්බලන්ගොඩ මිනිස්සුන්ට පාරේ ගමන් කිරීමට අපහසු තත්ත්වයක් උදාවී ඇති බවත් පෙන්වා දුන් අතර ඒ සම්බන්ධව තමන් දැඩිව සිටින බවද ප්‍රකාශ කරන ලදී.**

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>

**අපේ නගරයේ මෙය ක්‍රියාත්මක වෙන්න ඕන.**

ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී

**ලේකම තුමිය උප සභාපතිතුමන් ඇතුළු සියළු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් පැවති කමිටුව විසින් ගන්නා ලද අවසාන තීන්දු, මේක ඩෙනට්ගේ වැඩක් සෝභිතගේ වැඩක් කියා නොසිතා ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කර ප්‍රාදේශිය ලේකම්, ප්‍රධාන අමාත්‍යවරයා හා පොලිසිය වෙත ද යැවිය යුතුයි.**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

**මෙතන තෝරණ සුදුසුකම්ලාභි අයට සතියකින් පසු දන්වා යැවිය යුතුයි.**

එම්.අතුල ප්‍රියන්ත මයා - ගරු නගර සභා මන්ත්‍රී

**රන්දොඹේ, බලපිටිය මායිම්වල සිටින අයට අසාධාරණයක් නොවන විධියටත් අපේ නගර සභාවේ නීති ක්‍රියාත්ක කල යුතුයි.**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

වාර්ෂිකව මුදල් ගෙවා ඇති, ලියා පදිංචි වී ඇති ඔබ තුමා කිවූ ආකාරයේ සියළු දෙනාට අපි ලියාපදිංචිය දුන්නා. ඒ ගොල්ලන් ගන්නේ නැත්නම් අපි රාජකාරි කරලා පොලිසිය සමඟ මෙය ක්‍රියාත්මක කල යුතුයි.

ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී

**අපිට ත්‍රිරෝද රථ 05 ක් නවතා තබන තැනකට ත්‍රිරෝද රථ 08 ක් සඳහා ඉඩ ලබා දිය හැකිය.**

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී

උප සභාපතිතුමා මෙය අවසාන කමිටුව ලෙස කීවත් මෙය කෙසේ හෝ ක්‍රියාත්මක කල යුතුයි

ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී

**මෙය හරියාකාරව ක්‍රියාත්මක නොවීම නිසා විශාල මුදලක් අහිමි වෙලා තියෙනවා.**

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී

මේ හේතුවෙන් අපට වාහනක් නවතලා තියන්න විධියක් නැහැ. මම බයිසිකලය නතර කරලා තිබුනාම ඒකත් පෙරල ගිහින් තිබුනා.

ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී

**පාර පුරාම වාහන නවතා තැබීම නිසා වාහන හිරවීමෙන් හිටපු නගරාධිපති තුමාටත් වාහනය ගන්න බැරිව හිටියා. පසුව මම HQY ට කෝල් කරලා ගෙන්නගෙන එම වාහන ලියාගෙන ගියා. අපට නීතිය ක්‍රියාත්මක කරන්න බැ කියලා මම පොලිසියට කීව්වා.**

ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී

ත්‍රිරෝද රථ නවතන තැන් වල බෝඩ් එකක් ගහලා වැඩක් නැහැ. සීමාවන් සලකුණු කර පෙන්වන්න ඕන.

ඩෙනට් පනියන්දූවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී

**කොටුවත් හොඳයි කඩවල් ඉස්සරහ ගහන්න එපා**

කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති

**බස්නැවතුම්පොල ඉදිරිපිට ත්‍රිරෝද නැවතුම්පොලෙහි වැටක් ඉදි කිරීමට යෝජනා වුවද එය මෙතෙක් ක්‍රියාත්මක කෙරිලා නැහැ.**

ඩබ්.එම්. නිලානි මෙනවිය - ගරු නගර සභා මන්ත්‍රිණී

බස්නැවතුම ඉදිරිපිට පලතුරු විකිණීමේ මධ්‍යස්ථානයක් සකස් කිරීමට යෝජනා කරනවා.

<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
**ඒ සඳහා කලින් රිගල් හෝල් එක තිබුන තැනට එහා පැත්තේ තිබෙන තීරුව හොඳයි**

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>
**අපි දැනට මේ ටික ක්‍රියාත්මක කරමු. කමිටුවට ලැබී ඇති ලිපි සම්බන්ධව සලකා බලමු**

| අනු අංකය | නම | ලිපිනය | තීරණය |
|---|---|---|---|
| **01** | ජී.ඩබ්. ලලිත් බන්දුල මයා | 224/1ඒ රෝහල පාර, පොල්වත්ත අම්බලන්ගොඩ | නව අයදුම්පතක් ඉදිරිපත් කර ලබා ගන්නා ලෙස දැනුම් දීමට |
| **02** | සභාපති | ත්‍රිරෝද රථ ගාල මහජන බැංකුව අසල, මහ වීදිය, අම්බලන්ගොඩ | හය දෙනාටම නව අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලෙස |
| **03** | බී.ඩී.ජේ. ද සිල්වා බෝදාහන්දි මයා | කුරුදුවත්ත පාර, අඳාදොල, වතුගෙදර | දිය නොහැකි බවට දැනුම් දෙන්න |
| **04** | එල්.එච්. චමින්ද සම්පත් මයා | නො:4/15, පාළුවත්ත, පෝරඹ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **05** | ජී. සුසන්ත ප්‍රියදර්ශන මයා කේ. නිලන්ත කුමාර මයා | වටරවුම් පාර, පින්නදූව. අම්බලන්ගොඩ | |
| **06** | ඩබ්.ඒ. සුරංග දිනේෂ් වීරකෝන් මයා | 133/ඒ 1, පොල්වත්ත පාර, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **07** | කේ.ඒ. රංජිත් පුෂ්ප කුමාර මයා | 9/313. විද්‍යාල මාවත, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| 08 | එම්.ඩබ්. මාලිත ගිහාන් මයා | නො:04, හීගලදූව පාර, විලේගොඩ අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **09** | කේ.ඩබ්. කපිල මයා | 144/1සී, පෝරඹ, අම්බලන්ගොඩ | සභා තීරණයක් මගින් වෙනස් කරන්න |
| **10** | එන් . කරුණාදාස මයා | නො: 143, හම්බුවත්ත, කුලීගොඩ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කර |
| **11** | නම සඳහන් නොවේ | 80/53, හල්වතුර, විලේගොඩ, අම්බලන්ගොඩ | (ලිපිනය වෙනස් වීම දැනුම් දීම නමක් සඳහන් කර නොමැති බැවින් දැනුම් දීමට නොහැක. |
| **12** | එස්.එච්. චින්තක ශ්‍රීමාල් ද සිල්වා මයා | ශ්‍රීලාල්, මාදම්පාගම, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **13** | එස්.එච්.ජේ.පී. ද සනිල්වා මයා | විජයමාලි, සුදුවැලිකඩ පාර, මාදම්පේ, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **14** | එම්. ලසන්ත ජයලාල් පෙරේරා මයා | මැදගොඩ පාර, රන්දොඹේ. අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **15** | එම්.එච්. සුජිත් නිශාන්ත මයා | නො:100,ගොඩහේන, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **16** | වික්‍රමසුමල් ද සිල්වා මයා | අඳුරන්ගොඩ, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **17** | ඒ. සමන්ත මයා | 293/ඒ, මහරුප්ප, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |

| | | | |
|---|---|---|---|
| **18** | පී.එම්. රංජිත් ද සිල්වා මයා | මාදම්පේ, දේවගොඩ. අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **19** | ඒ.එච්. සුදත් ප්‍රියන්ත කුමාර මයා | නො:19/100, තිලකපුර. අම්බලන්ගොඩ | |
| 20 | සභාපති | අම්බලන්ගොඩ මාර්කට් (පොදු වෙළඳ පොළ අසල) | සියල්ලන්ටම අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන්න. |
| **21** | ප්‍රේමලාල් වරුෂවිතාන මයා | නො:15/7 , ග්‍රාමීණිය විදුහල් මාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **22** | පී.එච්.කේ. ප්‍රීති විරාජ් ද සිල්වා මයා | 48, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **23** | කේ. කමල් ප්‍රසන්න ද සිල්වා මයා | 55/11, දෙල්දුව පාර,අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **24** | අගම්පොඩි දයානන්ද මයා | නො:01, රොටරි නිවාස, ගලගොඩ, කුලීගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **25** | කේ. නලීන් අජිත් කුමාර ද සිල්වා මයා | නො:55/1ඒ, කරෝලිස් වෙද මාවත, අම්බලන්ගොඩ | නව අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **26** | එච්. ප්‍රසාද් විජේරත්න මයා | ගොඩහේන, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **27** | එල්.එච්. රත්නසිරි ද සිල්වා මයා | 437, ගැලවීමේ හමුදා නිවාස, ගලගොඩ, කුලීගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **28** | සනත් පෙරේරා මයා | 456/ඒ, ගාලු පාර, පටබැඳිමුල්ල, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **29** | සභාපති | අම්බලන්ගොඩ මාර්කට් (පොදු වෙළඳ පොළ අසල දකුණ ත්‍රිරෝද රථ සංගමය) | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **30** | සභාපති | එස්.එම්.එස්. ප්‍රියනන්ද, දොලොස්මහේ සේල් පොළ අසල | අයදුම්පත් ඉදිරිපත් කරන්න |
| **31** | බී.ඩබ්. සිරිපාල මයා | 16, පෝරඹ, අම්බලන්ගොඩ | අයදුම්පත් ඉදිරිපත් කර |
| **32** | සභාපති | සමුපකාර මන්දිරය අසල ත්‍රිවීල් සංගමය | අයදුම්පත් ඉදිරිපත් කර |
| **33** | | පුංචිපොල අසල ත්‍රිවීල් සංගමය | අයදුම්පත් ඉදිරිපත් කර |
| **34** | | මහ වීදිය ත්‍රිරෝද රථ ඉවත් කිරීම | අයදුම්පත් ඉදිරිපත් කරන්න |

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී
ත්‍රිරෝද රථ ගාල්වල අයිතිකරුවන් සිටිනවා

**කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති**
**අපේ අවසරයක් නැතිව ත්‍රිරෝද රථ නතර කරන්න දෙන්න බෑ**

ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී
ත්‍රිරෝද රථ සංගම් වල සභාපතිවරුන්ට අවශ්‍ය විදියට කටයුතු කරන්න දෙන්න බෑ

**ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී**
පොලිසිය ලව්වා මෙම තීන්දු ක්‍රියාත්මක කරන්න ඕන.
එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී
තෝරන්නේ කොහොමද, ඒ මිනිසුන් ජීවිකාව ගෙනයන්නේ කොහොමද

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**
ටවුමේ නැවැත්වීමට බලපත්‍ර ලබා දිය හැකි ත්‍රිරෝද රථ සංඛ්‍යාව 220 ක්

**<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>**
**පිළිවෙලක් නැතිව වාහන නවතා තැබීම නිසා අම්බලන්ගොඩට පිටින් එන මිනිසුන් බැන බැන යන්නේ. බනින්නේ නගර සභාවට. අපි මේ ගන්නා තීන්දු සියළු දෙනාම වෙනුවෙන්**

**<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>**
ලිපි අවසන් බැවින් ඉදිරිපත් වී ඇති අයදුම්පත් කමිටුවට ඉදිරිපත් කිරීම

කමිටුවට අයදුම්පත් 136 ක් ඉදිරිපත් වී තිබු අතර පහත සඳහන් අයදුම්පත් සඳහා කමිටුවේ අනුමැතිය ලැබීන

ත්‍රිරෝද රථ ලියාපදිංචිය සඳහා අනුමැතිය ලැබි ඇති අයදුම්පත්

| අනු අංකය | වාහන අංකය | නම | ලිපිනය |
|---|---|---|---|
| 1 | AAW-6467 | පින්නදුවහේවා දුලානි ද සිල්වා | නො: 15/7, ග්‍රාමිණි විද්‍යාල මාවත,කළුවඩුම්ල්ල, අම්බලන්ගොඩ |
| 2 | HR-5941 | එම්.ඩබ්. ප්‍රභාත් ද සිල්වා | 309, ගාලු පාර , අම්බලන්ගොඩ |
| 4 | QT-1641 | බෝලපගේ ලලිතා ස්වර්ණලතා | නො:88/1, කැපුඇල පාර, අම්බලන්ගොඩ |
| 7 | AAP-5947 | මොරගොඩ ලියනගේ ස්වර්ණලතා | නො:04, හීගල්දුව, විලේගොඩ, අම්බලන්ගොඩ |
| 8 | ABB-7037 | ජී.එම්. උෂාන් සම්පත් | 2/14, පෝරඹ, අම්බලන්ගොඩ |
| 9 | AAU-7171 | ඩබ්.එම්. දමයන්ති මැණිකේ වර්ණසූරිය | 27,ආර්.ඊ.ද සිල්වා මාවත, අම්බලන්ගොඩ |
| 10 | QL-6490 | සීක්කුවායමන් ජයරත්න | 58/2,ආර්.ඊ.ද සිල්වා මාවත, අම්බලන්ගොඩ |
| 11 | 207-1210 | එම්.ඩබ්.එච්. පද්මසීලි | 100/5, පින්නදුව, අම්බලන්ගොඩ |
| 12 | YK-7392 | ආර්.එම්. නිලන්ත | නො:03,ආදර්ශ නිවාස, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ |
| 14 | 204-1364 | කේ.එස්.ප්‍රේමචන්ද්‍ර | නො:52/3, මානිමුල්ල, අම්බලන්ගොඩ |
| 15 | QL-9639 | එච්. ආරියතිලක මෙන්ඩිස් | නො:32/2, ශ්‍රී මේදානන්ද මාවත, හෙප්පුමුල්ල, අම්බලන්ගොඩ |
| 17 | ABJ-1030 | ගාල්ලගේ අසන්ත | නො:24, ශ්‍රී බුද්ධදත්ත මාවත, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 18 | YY-6323 | වැල්ලගේ ඉරෝෂිණි ප්‍රියංගිකා | නිව්යෝක් ජනපදය, දළුක්කන්ද, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 19 | YW-9174 | ජයවර්ධනහෙට්ටි කරන්නාගොඩ | 49, පින්නදුව, අම්බලන්ගොඩ |
| 20 | YA-1491 | කේ.කේ. නයෝමි දිල්හාරි | 275/2, ජාතික නිවාස, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 21 | GZ-1747 | තිරිමාදුර නිමල් සංජීව ද සොයිසා | නො:25අත්කම් නිවාස, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 24 | YC-5032 | කේ.ජී.ජී. මංජුලා ප්‍රියන්ති | 79/13, දේවාල පාර. පෝරඹ, අම්බලන්ගොඩ |
| 25 | ABJ-4609 | එස්.කේ. පුෂ්පකුසෝම | නො:65/2, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ |
| 26 | AAJ-5901 | මල්ලියාවඩු නිරංජලා දිල්රුක්ෂි | 07බී, ශ්‍රී බුද්ධදත්ත මාවත, පළමු පටුමග, පොල්වත්ත. අම්බලන්ගොඩ |
| 27 | YY-8983 | කේ. දයාල් ප්‍රියන්ත ද සිල්වා | 327/19, පොල්වත්ත පාර, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 28 | YP-2573 | ඊ.එච්. ශ්‍යාමා නිරෝෂනි | නො:25, නගර සභා නිවාස, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 29 | Hu-1684 | එච්.ටී. ඩෙන්සිල් ක්ලේමන්ට් ද සිල්වා | නො: 03, කන්ද මාවත, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ |
| 30 | ABD-0223 | බී. චමින් ප්‍රියංකර | 343/11, කෙරමිණිය,අම්බලන්ගොඩ |
| 31 | ABJ-3743 | ජේ. දීපිකා ප්‍රියදර්ශනි | 18/5,කැපුඇල පාර, අම්බලන්ගොඩ |

| | | | |
|---|---|---|---|
| 34 | HF-3866 | ඒ.ඩබ්. නන්දික කුමාර | නො:27, ගොඩහේන, අම්බලන්ගොඩ |
| 35 | 207-1119 | ඒ.ඩබ්.සංජය චාමාල් නන්දික කුමාර | 146/3සී, පල්ලෙතොට පාර. තල්ගසගොඩ, අම්බලන්ගොඩ |
| 42 | ABC-1945 | කේ.කේ. චන්ද්‍රසිරි | 2/275,ජාතික නිවාස, තල්ගස්ගොඩ. අම්බලන්ගොඩ |
| 43 | QU-6869 | එච්.එච්. චන්ද්‍රාවති | නො:149බී, පල්ලියගොඩවත්ත, මහවීදිය, අම්බලන්ගොඩ |
| 44 | QF-9694 | කේ. කුමාරි අමල්කා | නො:305/2, මහ වීදිය, අම්බලන්ගොඩ |
| 45 | ABQ-7576 | ජී.ඩබ්. ගාමිණී ටෙරි | 226/5, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 46 | 200-8874 | පී.ඩබ්. ලෝරන්ස් | 137බී, තල්ගස්ගොඩ. අම්බලන්ගොඩ |
| 47 | ABF-5352 | ජී.එප්.එම්. තරංග | 305/3, මහ වීදිය, අම්බලන්ගොඩ |
| 48 | QZ-5246 | එස්.ටී.ජේ.පී. ද සිල්වා | නො:08, රණසූරිය මාවත, පෝරඹ, අම්බලන්ගොඩ |
| 49 | HF-7591 | එල්. නිරෝෂා | 344, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 50 | ABL-9589 | කේ.ජේ.ඩී. සුමිත්‍රා | 24/4 ඩී, පඤ්ඤාලෝක මාවත, කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ |
| 51 | QG-1058 | ලමාහේවා විමලා කාන්ති | නො: 36, බුද්ධදත්ත මාවත, පොල්වත්ත |
| 53 | YJ-6108 | ජී.ඩබ්. මල්කාන්ති ගුණතිලක | 11/9, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 63 | YD-7538 | එම්.එම්. නලීන් චින්තක ද සිල්වා | වැල්ලබඩ, මාදම්පේ, අම්බලන්ගොඩ |
| 64 | 201-7062 | එන්. සුජීව කුමාර ද සිල්වා | නො:107, සන්ධ්‍යා , ඌරවත්ත, අම්බලන්ගොඩ |
| 75 | QW-6792 | බී. මංජුල ද සිල්වා | නො:01, කණුව, කුලීගොඩ |
| 78 | YY-7285 | පී.කේ. චානක ජයන්ත ද සිල්වා | 66, කන්දේගොඩ, අම්බලන්ගොඩ |
| 99 | QA-1626 | එන්.එච්. ග්‍රිටා ඉන්දනි | 409/3, ගාලුපාර, බේරතුඩුව, බලපිටිය |
| 106 | AAJ-3664 | කේ. ලහිරු විරාජ් සිල්වා | 6/90, පින්නදූව. අම්බලන්ගොඩ |
| 108 | ABJ-5488 | යූ.පී. යටිල වසන්ත | නො;15/1, තල්ගස්ගොඩ පාර,පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 109 | QZ-1006 | ඩී. රොහාන් කුමාර රණසිංහ | 6/377,මාදදූව, කුලීගොඩ, අම්බලන්ගොඩ |
| 111 | QM-4794 | ඩබ්. ප්‍රසන්න උදය කුමාරසිරි | 31/14, මිහිතරු නිවස, සමගි මාවත, ආදාදොල, වතුගෙදර |
| 112 | 16-1207 | කේ.එච්. සමන් කුමාර | නො:28/4එම්, රණසූරිය මාවත, පනියන, අම්බලන්ගොඩ |
| 114 | YZ-6345 | ඩී.කේ. වරුසවිතාන | 20, ශ්‍රී විජයාරාම පාර. කළුවඩුමුල්ල, අම්බලන්ගොඩ. |
| 118 | ABA-5996 | ඩබ්.ටී. දේවිකා චමනි | නො:31/1, පින්නදූව, අම්බලන්ගොඩ |
| 120 | YW-3414 | එච්.එච්. නයනි මහේෂිකා | 4/15පාළුවත්ත පාර, පෝරඹ, අම්බලන්ගොඩ |
| 121 | ABO-7176 | කේ.ඩබ්. චන්ද්‍රසීලි | නො: 54, තුඩුවමුල්ල, අම්බලන්ගොඩ |
| 124 | AAZ-8446 | එස්. ස්ටෙලා සමාධි ද සිල්වා | නො:17/7, බෝගහවත්ත, අම්බලන්ගොඩ |
| 126 | YA-5202 | එස්.ටී. ගිහාන් ප්‍රියන්ත | 56/1, පනියන්දූව, අම්බලන්ගොඩ |
| 129 | 204-3737 | එම්.ඩබ්.චතුරාන් ප්‍රියදර්ශන | නො,23පතිරාජ පාර, කෙරමිණිය, අම්බලන්ගොඩ |
| 130 | ABN-7632 | ඒ.ජී. පත්මකීර්ති | 180/191, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 131 | AAI-7673 | එස්.එච්. ඒෂාන් සුරංග චන්ද්‍රසිරි | නො,15 සිතුම් සෙවන, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 132 | AAV-0524 | ඩබ්.ටී. උපුල් තුසන්ත | නො:320, කෙරමිණිය. අම්බලන්ගොඩ |
| 133 | YL-3335 | ඩබ්. සනත් පෙරේරා | 456/ඒ,ගාලුපාර, පටබැදිමුල්ල, අම්බලන්ගොඩ |
| 134 | ABP-7407 | යූ.ජී. සංජීව සඳකැලුම් | නො:36, ඕකන්ද, අම්බලන්ගොඩ |
| 135 | QZ-2049 | එන්. ඩබ්. නිමාලි ප්‍රියදර්ශනි | නො:20/76, ටී.එච්.ඩබ'. නිවාස, දළුක්කන්ද, තල්ගස්ගොඩ, අම්බලන්ගොඩ |
| 136 | ABS-3238 | කේ. සුමිත්‍රා | 193/9, පොල්වත්ත, අම්බලන්ගොඩ |
| 138 | AAO-4395 | ගාල්ලගේ රමණී | නො:22/7, ශ්‍රී බුද්ධදත්ත මාවත, පොල්වත්ත, අම්බලන්ගොඩ |

එස්.එම්. සරත් චන්ද්‍ර ද සිල්වා මයා - ගරු නගර සභා මන්ත්‍රී

අදාල බලපත්‍රය ලබා දෙන්නේ පැය 24 ට ම ද යන්නත් නොමැති නම් රාත්‍රී කාලය හා දිවා කාලය සඳහා වෙන වෙනම බලපත්‍ර දීම කරන්නේ ද යන්න විමසන ලදී.

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>
**ඒක අපට දැන්ම කියන්න බෑ. කව්රුත් උදවු කරන්න ඕන මෙය ක්‍රියාත්මක කර ගන්න.**

<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
ත්‍රිරෝද රථ 10 ක් දාන්න පුළුවන් තැනට ත්‍රිරෝද රථ 20 ක් දානවා. අපි මේ සියළු දෙනාම කැඳවා ඔවුන් දැනුවත් කිරීමක් කරමු.

<u>ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
රථ ගාල්වල ත්‍රිරෝද රථ කීයක් පාක් කරන්න පුළුවන්ද

<u>කමල් වැල්ලගේ මයා ගරු උප සභාපති</u>
**ත්‍රිරෝද රථ 220 ක් පමණ ගාල්ල කල හැකි බවත්. කමිටු නිර්දේශ අනුව අනුමත කරන ලද අයදුම්පත් නිලධාරීන් විසින් පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කලයුතු බවත් ප්‍රකාශ කරන ලදී. අපි අද ඉදිරිපත් කල බලපත්‍ර නුදුන්නු ඉතිරි අයදුම්පත් ප්‍රමාණය අනුව තැන සලකා බලන බව ප්‍රකාශ කරන ලදී . අලුතින් අයදුම්පත් දෙන විට බලප්‍රදේශයේ අයට පමණක් ලබා දීමටත් අනුමත කරන ලද සියළු දෙනාට ස්ටිකර් ලබා දිය යුතු බවත් අදාල තීරණ අනුව කටයුතු කල යුතු බවත් නිලධාරීන්ට ගැටළුවක් තිබේ නම් පොලිසිය දැනුවත් කර රථවාහන සම්බන්ද ගැටළුව නිරාකරණය කර ගත යුතු බවත් සඳහන් කරන ලදී.**

<u>ඩබ්.ඒ. සෝභිත රංජිත් මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
ස්ටිකරය ලබාගෙන නොමැති මුල්වටයේ 120 දෙනාගෙන් ඉතිරි අයට සතියක් තුල ස්ටිකරය ලබා ගන්නා ලෙස දැනුම් දෙන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

<u>ඩෙනට් පනියන්දුවගේ මයා - ගරු නගර සභා මන්ත්‍රී</u>
**කාලයක් තිස්සේ රථ වාහන නිසි පරිදි ගාල් නොකිරීම නිසා පිටස්තර ජනයාගෙන් ලැබෙන අවලාද අපහාස බොහෝ බවත් සියළු දෙනාම වෙනුවෙන් ගන්නා තීන්දු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශිය සංවර්ධන කමිටුව හරහා අනුමැතිය ලබාගෙන ඒ අනුව නඩු දැමීමට ක්‍රියා කල යුතු බවත් , පසුව රත්ගම, බලපිටිය කොට්ඨාශ වල අයටත් බලපත්‍ර ලබා දීම ගැන සලකා බැලිය යුතු බවත් බලහත්කාරයෙන් චන්ඩි කමින් ඉන්න අයට ඉඩදිය නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.**
**කලින් මුදල් ගෙවා ස්ටිකරය ලබා ඇත්නම් පිටස්තර අයට වුවද ස්ටිකර්ය ලබා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. තවද ගරු උප සභාපති තුමන් ඇතුළු නාගරික මන්ත්‍රී තුමන්ලාගෙන් ද මේ සඳහා සහභාගී වීම පිළිබඳ ස්තුතිය පුද කරන ලදී.**

<u>තීරණ</u>

- **අදාල තීරණ ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවට ඉදිරිපත් කර ප්‍රාදේශිය ලේකම්, ප්‍රධාන අමාත්‍යවරයා හා පොලිසිය වෙත ද යැවීමට තිරණය විය**
- 

**දුසුකම්ලාභි අයට සතියකින් පසු දන්වා යැවිය යුතුයි**

- ත්‍රිරෝද රථ නවතා තබන තැන්වල සසීමාවන් සලකුණු කර පෙන්වීමට

පූ

| | | |
|---|---|---|
| සකස් කලේ | ලේකම් | උප සභාපති |
| අචිරා රංජනී ලොකුගේ | බී.ඒ. ධම්මිකා | කමල් වැල්ලගේ |
| | අම්බලන්ගොඩ නගර සභාව | අම්බලන්ගොඩ නගර සභාව |

තීරණය

2018.10.31 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ත්‍රීරෝද රථ ලියාපදිංචි කිරීමේ කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ. සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

**06.08 2018.11.08 දින පැවති මුල්‍ය කමිටු වාර්තාව**

මූල්‍ය කමිටුව
**2018-11.08 දින ප.ව.12.30**

සහභාගීත්වය

| | |
|---|---|
| 01.ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති, අම්බලන්ගොඩ නගර සභාව |
| 02.ජී.සරත් ශ්‍රී ලාල් ද සිල්වා මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 03.ඇම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 04.ඒ ඩබ් .ජගත් කුමාර මහතා | ගරු නගර මන්ත්‍රී, අම්බලන්ගොඩ නගර සභාව |
| 05.බී.ඒ.ධම්මිකා මිය | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව |

**පිළිගැනීම**

ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා මූල්‍ය කමිටුව සඳහා පැමිණි ගරු නගර සභා මන්ත්‍රීවරුන් , නගර සභා ලේකම්, ඇතුලු සියලු නිලධාරී මහත්ම මහත්මීන් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නා ලදී.
අනතුරුව එදිනට කමිටුව සඳහා ඉදිරිපත් කරන ලද පහත විස්තර ඇතුලත් ගෙවීම් වවුචර් පත් සඳහා කමිටු සාමාජිකයින් විසින් අනුමැතිය ලබා දෙන ලදීග

| ගෙවීම් ලබන්නාගේ නම | මිලදීගෙන ඇති භාණ්ඩ පිළිබඳ විස්තර | මුදල රු. |
|---|---|---|
| 01.එල්.ආර්.ඩී.සී.සර්විස්(ප්‍රයිවට්)ලිමිටඩ් | අගෝස්තු මස ආරක්ෂක සේවා වැටුප | 287909.77 |
| 02.සාමාන්‍යාධිකාරී,ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | ගලි ලෝඩ් 25 ක් සඳහා ගෙවීම | 5875.00 |
| 03.රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව (ඇ.අංක 1934 ) | ඒ 4,ලීගල් ප්‍රමාණ හා පාට ඒ4 ගැනීම | 10950.00 |
| 04. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | සැප්තැම්බර් මස දුරකතන බිල | 31459.46 |
| 05. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන | අගෝස්තු ජල බිල | 38667.40 |
| 06. ග සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය සමුපකාර සමිතිය | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් සැප්. 16-30 දක්වා ඉන්ධන බිල | 160872.50 |
| 07.යුනයිටඩ් මෝටර්ස් | පීඑෆ් -7424 රථය සේව කිරීම | 38524.18 |
| 08. එම්.එස්.වීරසිංහ | නගර සභා පුස්තකාල සඳහා සැප්. මස ලබා ගත් පුවත්පත් සඳහා | 48725.00 |
| 09.ජේ.බී දිසානායක මයා | කියවීමේ මාසයේ ආරාධිත දේශන ගාස්තු (අනුග්‍රාහක මුදලින් ) | 15000.00 |
| 10. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2018 ඔක්.1-15 දක්වා VAT කොටසක් ගෙවීම | 96725.31 |
| 11. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන | ජූලි ජල බිල | 38472.13 |
| 12. සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතියවෙනුවෙන් | සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර සැප්.01-15 දක්වා ඉන්ධන බිල | 146357.00 |
| 13.එච්.එම්.ඩී ද සොයිසා | ලෝක ළමා දින සඳහා කොඩි මැසීම (අනුග්‍රාහක මුදලින්) | 15000.00 |

14. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් 2018 111 වන කාර්තුව NBT ගෙවීම 51476.86

15.එච්.එම්.ඩී. ද සොයිසා රෙදි සපයා 1 ක් 450 බැගින් සුදු කොඩි 100 ක් මැසීම 45000.00

16.චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ඇන්ඩ් ක්‍රෂර් 1 ක් 5000 බැගින් අගල්11/2 ගල් 16 ,3/4 ප්‍රමාණයේ ගල් 10*5000,චිප් ගල් 10*6000 190000.00

17.සභාපති කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලය ශ්‍රී ධම්මානන්ද මාවතේ කානු පද්ධතිය පිරිසිදු කිරීමට අදාල රුදවුම් ගාස්තු නිදහස් කිරීම 13307.50

18.ටියුලිප් කම්පියුටර්ස් කීබෝඩ් (800*05),මවුස්(600*10),යූ.පීඑ.ස් (3800*06) 32800.00

19. . සී/ස අම්බලන්ගොඩ විවිධසේවා සමුපකාර සමිතිය සභාව සතු සියලු වාහන හා යන්ත්‍ර වෙනුවෙන් ඔක්. 01-15 දක්වා ඉන්ධන බිල 122823.00

20.රජයේ වාණිජ නීතිගත සංස්ථාව සෞඛ්‍ය අංශයට අවශ්‍ය සවල්(537.26*10), (ඇ.අ.1886)බූට්ස් (2560*25),රේක්ක (230.26*05) 70523.90

21.දේශීය ණය සංවර්ධන අරමුදල ආදාහනාගාරය වෙනුවෙන් 2009ඩ වසරේ ණය වාරාකය ගෙවීම 321000.00

22. දේශීය ණය සංවර්ධන අරමුදල සාප්පු සංකීර්ණය වෙනුවෙන් ලබා ගෙන ඇති ණය මුදලේ 2013 වසර වාරිකය හා පොළිය 97000.00

23.ඒසියන් ඉලෙක්ට්‍රිකල්ස් සෝඩියම් බල්බ (1900*06) (ඇ.අංක1917) 11400.00

24.කග්ගොඩ ආරච්චි මෝටර්ස් පීඑෆ් -7424 රථය සේවා කිරීම 17630.00

25.කේ.පී. චන්දන රුක්ෂාන් 252-0730 රථයේ අලුත්වැඩියාව 19900.00

26. මිළිදු එන්ට්‍රප්‍රයිසස් (ඇනවුම-1951) ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.6095 බැගින් 08 ක් ) 48760.00

27. සාමාන්‍යාධිකාරී,ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය ගලි ලෝඩ් 25 ක් සඳහා ගෙවීම 25875.00

28. මිළිදු එන්ට්‍රප්‍රයිසස් (ඇනවුම-1953) ආදාහනාගාර සඳහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.6095 බැගින් 08 ක් ) 48760.00

29.ක්‍රවුන් ටයර්ස් ප්‍රයිවට් ලිමිටඩ් 14/17.5 ටයර් 1ක් 44900*02, 19.5/24 ටයර් 85000*02 259800.00

30.රත්න මෝටර්ස් (ඇ.අංක 1912) 49-9421 ට්‍රැක්ටරයට අමතර කොටස් ගැනීම (piston/sleeveperlins/ring set/rod bush /plate complet/head lamp/spido meter/&ECT 280200.00

31.ලුමිනෙක්ස් ග්‍රොසරීස් (ප්‍රයිවට්)ලිමි. (ඇ.අංක1927) කැටිරිච් කොල(16*1000)චුත්‍ර කොල(8*500) 20000.00

| | | |
|---|---|---|
| 32.කේ.ඩබ්.රංජනී මානෙල් | කියවීමේ මාසයේ සංග්‍රහ සහ සැරසිලි සදහා අත්තිකාරම් | 20000.00 |
| 33.ඩී.ටී.තරංගි | කියවීමේ මාසයේ ත්‍යාගප්‍රධානයේ සංග්‍රහ අත්තිකාරම් සදහා | 30000.00 |
| 34. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2018 111 වන කාර්තුව මුද්දර ගාස්තු | 35954.92 |
| 35.දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 2018 සැප්.16-30 දක්වා VAT ගෙවීම | 10013.74 |
| 36.උපේන්ද්‍ර එගොඩගේ | ළමා දින සැනකෙලියේ ශබ්ද විකාශන පහසුකම් සැපයීම(අනුග්‍රාහක මුදලින්) | 92200.00 |
| 37.සක්වා ප්‍රින්ටර්ස් | ආරාධනා පත්‍ර මුද්‍රණය (අනුග්‍රාහකමුදලින්) | 43725.00 |
| 38.සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගම | නගර සභාවට අයත් ආයතනයන්හි ජූලි මස විදුලි බිල | 96554.71 |
| 39. සී/ස ලංකා විදුලි පෞද්ගලික සමාගම | නගර සභාවට අයත් ආයතනයන්හි ජූනි මස විදුලි බිල | 94571.87 |
| 40. එම්.ඩබ්.රජිතා දිල්රුක්ෂි | සභා ගරාජයේ සිදුවන අලුත්වැඩියා සදහා අත්තිකාරම් 25000.00 | |
| 41.එස්.එම්.එන්.සමරසේකර | අගල්1 ජීඅයි බට(2400*6)3/4 ජීඅයි බට (1800*17), අගල් 2 ජී අයි බට (5250*1) | 50250.00 |
| 42. මිළිදු එන්ටප්‍රයිසස් (ඇනවුම-1961) | ආදාහනාගාර සදහාකි.ග්‍රෑ.37.5 ක් වූ ගෑස් සිලින්ඩර් (රු.6095 බැගින් 08 ක් ) | 48760.00 |
| 43. ඩී.වී තරංගි | කියවීමේ මාසයේ ප්‍රධාන අාරාධිතගේ වාහන ගාස්තු සදහා ගෙවනලද මුදල ප්‍රතිපූර්ණය(අනුග්‍රාක මුදලින් ) | 11000.00 |
| 44.එල්.ආර්.ඩී.සී.සර්විස්(ප්‍රයිවට්)ලිමිටඩ් | සැප්තැම්බර් මස ආරක්ෂක සේවා වැටුප | 263090.63 |
| 45. සී/ ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ )නීතිගත සංස්ථාව (ඇ.අ.1842) | ටයර් හා ටියුබ් ගැනීම(500*12 ටයර් 02 හා ටියුබ් 02 | 14076.00 |
| 46. සී/ ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ )නීතිගත සංස්ථාව (ඇ.අ.1889) | ටයර් හා ටියුබ් ගැනීම(400*8 ටයර් 03 හා ටියුබ් 03 | 10971.00 |
| 47. බිටුමික්ස් ප්‍රයිවට් ලිමිටඩ් | තාර බැරල් 50 (13750*50) | 687500.00 |
| 48 ඊ.ටී. ලැබ් මැ෴ෆැක්චරින් පුද්.සමා. | ඇඟිලි සළකුණු යන්ත්‍රය සේවා කිරීම | 10971.60 |
| 49.එම්.පි.පී.කේ.පීරිස් | සෞඛ්‍ය අංශයේ ටැක්ටර් සදහා නලා 10 ක් ගැනිම (7000*10) | 70000.00 |
| 50.ජී.ඩබ්. ඉන්දික | ඒබීසී ගල් ගැනීම | 130000.00 |
| 51.කේ.කේ. ජනත් චමින්ද | පෙර පාසැල් චාරිකාව සදහා බස්රථ 03 ක් සැපයීම | 60000.00 |

පැමිණි සැමට ස්තූති කරමින් ප.ව .2.00 ට පමණ කම්ටුවේ කටයුතු නිම කරන ලදී.

.............................. ....................................... ...............................................

සකස් කලේ ලේකම්, ගරු සභාපති.

බී.ඒ. ධම්මිකා , ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප්
නගර සභාව , අම්බලන්ගොඩ නගර සභාව , අම්බලන්ගොඩ

2018.10.31 දින අම්බලන්ගොඩ පුස්තකාල රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මුල්‍ය කමිටු වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම්.ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර මන්ත්‍රී විසින් ස්ථිර කරන ලදී.
තීරණය -

2018.11.08 දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මුල්‍ය කමිටු වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රීනි ඩබ්.එම්.නිලානි මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**07 ටෙන්ඩර් හා මිළ ගණන් :-**

**7:1 ටෙන්ඩර්:-** නැත

**7:2 මිළගණන්:-**

07.02.01 අම්බලන්ගොඩ නගර සභා ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ ජිනසේන පුද්ගලික සමාගම විසිනි. එම මිළ ගණන් පිළි ගැනීමට සභාව තිරණය කරන ලදී.

| ආයතනය | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| JINASENA (PVT) lTD | Sprinter irrigation Systems | රු.3533500/= |
| SANGUINE LANKA AGROCO | Sprinter irrigation Systems | රු.4438250/= |
| MSL AGRO Products(PVT) | Sprinter irrigation Systems | රු.4723625/= |
| Jayasingha constructions | Sprinter irrigation Systems | රු.43373050/= |

**තීරණය**
නගර සභා ක්‍රීඩාංගනයේ විසිරි ජල පද්ධතිය සඳහා ඉදිරිපත් කර ඇති මිළ ගණන් අතුරින් අවම මිළ ගණන් ජිනසේන පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කර ඇති අතර සුදුසු ආයතනය තෝරා ගැනිම සඳහා තාක්ෂණ ඇගයිම් කමිටුව නියෝජනය කිරිම වෙනුවෙන් පළාත් පාලන සහාකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු මහතා , තාක්ෂණ සේවා නිලධාරි සඳුන් ගුණවර්ධන මහතා සහ ගිණුම් අංශ ප්‍රධානි එම්.එච්.රෝෂිණි මියගෙන් සමන්විත තාක්ෂණ ඇගයිම් කමිටුවක් පත්කර එමගින් ගනු ලබන තිරණය මත ටෙන්ඩරය ලබාදිය යුතු ටෙන්ඩර්කරු තේරිම සඳහා ගරු සභාපතිතුමාට බලය පැවරිම සුදුසු බවට ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා යෝජනා කළ අතර ගරුනගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරක ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයක් නොමැති බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

07.02.02 අම්බලන්ගොඩ නගර සභා ආදානාගාරය සඳහා ගෑස් මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ අරුණ ගෑස් සෙන්ටර් විසිනි. එම මිළ ගණන් පිළි ගැනීමට සභාව තීරණය කරන ලදී.

| ආයතනය | අයිතමය | එකක් තොගය |
|---|---|---|
| අරුණ ගෑස් සෙන්ටර් | කිලෝ ග්‍රෑම්37.5 ගෑස් සිලින්ඩර් | රු.6050 |
| මලිඳු එන්ටප්‍රයිසස් | කිලෝ ග්‍රෑම්37.5 ගෑස් සිලින්ඩර් | රු.6055 |

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ආදානාගාරය සඳහා ගෑස් මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් අඩුම මිළ ගණන් ඉදිරිපත් කර ඇත්තේ අරුණ ගෑස් සෙන්ටර් විසිනි. එම මිළ ගණන් පිළි ගැනීමට සභාව තීරණය කරන ලදී.

07.02.03 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය විදුලි උපකරණ පිළිබඳ දකුණු පළාත් ඉංජිනේරුසේවා අධිකාරියේ විදුලි උපාංග ලැයිස්තුව අනුව ඉදිරිපත් කර ඇති මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන වල මිළ ගණන් පිළිබඳව විස්තර සභාවට යෝජනා කරන ලදී.

| *අනු අංකය* | භාණ්ඩ විස්තරය | ශෂි ඉලෙක්ට්‍රිකල් | උදය පුෂ්ප ඉලෙක්ට්‍රිකල් | එෂියන් ඉලෙක්ට්‍රිකල් |
|---|---|---|---|---|
| ***01*** | **ත්‍රිපින් හෝල්ඩර්ස් (පොසිලෙන් )** | **රු170/=** | **(policon) රු.100/=** | **(indion) රු.55/=** |
| ***02*** | **C.G.හොල්ඩර්ස් (සෙරමික් ) හොල්ඩර් මර්කරි** | **රු177/=** | **රු.100/=** | **(policon) රු.105/=** |
| ***03*** | **ආම්** | **රු1650/= (Set)** | **රු.800/=** | **(light guace) රු.260/=** |
| ***04*** | **ආම්ෂේඩ්** | | **රු400/=** | **(light guace) රු375/=** |
| ***05*** | **පී.වී.සී.1/1 3 වයර් දුඹුරු** | **රු.1900/=** | **(aclfiregca) රු.1800/=** | **රු.1900/=** |
| ***06*** | **පී.වී.සී.1/1 3 වයර් නිල්** | **රු.1900/=** | **(aclfiregca) රු1800/=** | **රු.1900** |
| ***07*** | **අත් වයර් පී.වී.සී. 7/0.67(2.5mm 2)** | **-** | **-** | **-** |
| | | **(arpicone)** | **(polikone)** | |

| | | | | |
|---|---|---|---|---|
| *08* | **කන්ඩියුට් බට ¾** | **රු.78/=** | **රු.110/=** | **රු.95/=** |
| *09* | **කන්ඩියුට් බට1** | **(arpicone)**<br>**රු.100/=** | **(policone)**<br>**රු.130/=** | **රු.110/=** |
| *10* | **අගල් 1 බෙන්ච්** | **(**<br>**රු.15/=** | **(policone)**<br>**රු.23/=** | **රු.09/=** |
| *11* | **¾ බෙන්ච්** | **රු.10/=** | **(policone)**<br>**රු.20/=** | **-** |
| *12* | **20w CFLබල්බ්**<br>**(අවම තරු4,වගකීම මාස 18)** | **(orange u)**<br>**රු420/=** | **(orengespinkl)**<br>**රු.450/-** | **(orange)**<br>**රු.460/=** |

තීරණය

අංක0 1 සිට 07 දක්වා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතන වල මිල ගණන් පිළිගැනීමටද අංක 08 සිට 11 දකිවා දකුණු පළාත් ඉංජිනේරු සේවා විදුලි අධිකාරිගේ උපාංග ලයිස්තුව අනුව පිරිවිතර වලට අනුකූල වන ශෂී ඉලෙක්ට්‍රොනික් සහ ඉලෙක්ට්‍රිකල් ආයතනයට ලබා දීම සුදුසු බවද අංක 12 උදය පුෂ්ප ඉලෙක්ට්‍රිකල් වෙතද ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

07.02.04 අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍යා ගල් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතුරින් එහි මිළ ගණන් ප්‍රවාහනය සමඟ නොමැති බැවින් ප්‍රවාහන සමඟ නැවත මිළ ගණන් ඉදිරිපත් කිරීමට යෝජනා කරන ලදී.

| ආයතනය | අයිතතමය | එකක් තොගය |
|---|---|---|
| චන්ද්‍රිකා මෙටල් වර්ක්ස් ඇන්ඩ් ක්‍රෂර් | චිප් ගල් කියුබ්<br>¾ කලු ගල් කියුබ්<br>1 ½ කලු ගල් කියුබ්<br>ABC ගල් කියුබ් | රු.6000/=<br>රු.5000/=<br>රු.5000/=<br>රු.5700/= |
| කවිෂ බ්ලොක් ගල් | චිප් ගල් කියුබ්<br>¾ කලු ගල් කියුබ්<br>1 ½ කලු ගල් කියුබ්<br>ABC ගල් කියුබ් | රු.6000/=<br>රු.5000/=<br>රු.5800/=<br>රු.5700/= |
| පි.එච්.සී. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | චිප් ගල් කියුබ්<br>¾ කලු ගල් කියුබ්<br>1 ½ කලු ගල් කියුබ්<br>ABC ගල් කියුබ් | රු.8000/=<br>රු.6250/=<br>රු.6250/=<br>රු.6250/= |
| ප්‍රියන්ත | චිප් ගල් කියුබ්<br>¾ කලු ගල් කියුබ්<br>1 ½ කලු ගල් කියුබ්<br>ABC ගල් කියුබ් | රු.7500/=<br>රු.6500/=<br>රු.6500/=<br>රු.6500/= |

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මිලඟට ටෙන්ඩර් හා මිළ ගණන් ගල් සැපයුම යටතේ ඇති මිල ගණන් 4 යටතේ ඇති අවම මිල ගණන් ඇති චන්ද්‍රිකා වර්ක්ස් ක්‍රෂර් ආයතනය මඟින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පිලි ගැනීමට මම යෝජනා කර සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අර එවැනිම දෙයක් තමයි , මේ මිළ ගණන් ඉදිරිපත් කිරීමේදි දැන් චන්ද්‍රිකා එකෙන් ඉදිරිපත් කර ඇත්තේ ක්‍රෂර් එකේ මිළ ගණන්. අනෙක් තිදෙනාම ඉදිරිපත් කර ඇත්තේ මෙතැනට ගල් ගෙනවිත් දීම.අර රාහුල මන්ත්‍රීතුමා කිවු පරිදි ඔය අසාධාරණයම එම ආයතනයටත් සිදු වී ඇත්තේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ සම්බන්ධව ඇහයිමක් කළේ නැද්ද?

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එකකෝ සැපයුම් නිලධාරිණිය දැන ගන්න ඕන තාක්ෂණ සේවා නිලධාරින් සමඟ ගිහින් මෙතුමන්ලාගේ උපදෙස් අරගෙන තාක්ෂණ සේවා නිලධාරිතුමියගේ උපදෙස් හරි අරගන්න. දැන් මේ සඳහා තුන්දෙනෙක් සිටිනවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මෙහි දෙපැත්ත සලකන්න.සැපයුම්කරුවෙකු මෙහි බඩු ගෙනත් දමන විටයි එතැනින් ගිහින් බඩු ගන්න එකයි . ඒ පිළිබඳව සොයා බලා නිසියාකාරව විග්‍රහයක් කර කල යුතුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
සැපයුම් නිලධාරිණිය දැන ගත යුතුයි මේ පිළිබඳව. මම මෙය කතා කිරිමට තමයි සිටියේ .මම අත්සන් කර ඇරියාට තීරණය ක්‍රෂර් එකෙන් තියෙන්නේ වෙනම ගානක් අනෙක් අය දී ඇත්තේ මෙතැනට ගෙනවිත් දෙන ගණන.එතකොට අනෙක් ටෙන්ඩර් කරුවන් තිදෙනාටම අසාධාරණයක් වේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**

එතකොට විස්තර කර මේ පිළිබඳව කියන්නේ නැද්ද? එකයි සිදු වී ඇත්තේ.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
මම මෙය උදාහරණයක් ලෙස ගත්තේ තාක්ෂණ සේවා නිලධාරිතුමනි මෙහි පෙනෙනවා අනෙක් තුන්දෙනාම සැපයුම් කරන අය . අනෙක් කෙනා ක්‍රෂර් එකෙන් බඩු ටික දෙන එක කරන්නේ . අනෙක් තුන්දෙනාම ප්‍රවාහන පහසුකම් දී මෙතැනට ගෙනත් බෑමට තමයි කරන්නේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
දැන් ඔය කියන තැන ඉදගෙන දිස්ත්‍රික් මිල ගණන් කමිටු අනුව මෙතැන රැගෙන එමට කියක් යනවාද කියා අර ගාණත් එකතු කර සසඳා ඉදිරිපත් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි ,එහෙම ඉදිරිපත් කිරීමට නොහැකිය. අතනත් කියා නොමැත සැපයුම් කරනවා කියා. අනෙක් තිදෙනාත් කියා නොමැත සැපයුම් කරනවා කියා. මෙතැනට ගෙනත් දෙනවා කියා ටෙන්ඩරයේ සඳහන් නොවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
එතකොට මෙය සිදු විය යුක්තේ කෙසේද ? දැන් ඔය චන්ද්‍රිකා මෙට්‍රල් එකෙන් මෙහෙට ගෙනත් දෙන්නේ නැද්ද? මම එක තමයි අසන්නේ එතකොට අපේ වාහනය එතැනට ගියාම යන වියදමයි අනෙක් අය මෙතැනට ගෙනත් බාන මිළ ගණන් වලයි වෙනසක් ඇත්ද යන්න පිළිබඳව යන දෙකේ වෙනසයි ඔබ අපට දිය යුත්තේ.දැනට අපි මෙය පිලිගන්නම්. මොකද ගිය සිකුරාදා වන විට ගල් ඉවරයි. එතකොට අපිට අලුත් වැඩියා සම්බන්ධයෙන් කරනු ලබන වැඩ කරගෙන යන්න බැරි වෙනවා.නෑ ලබන සභාවට නෙමේ ඊළඟ ටෙන්ඩර් කමිටුවට ඔය කියන විදියට විශ්ලේෂණය කර සභාවට සැපයිම සහ මෙට්‍රිල්ක්‍රෂර් එකෙන් ලබා දෙන මිළ ගණන් දෙකම වෙන වෙනම ගන්න.ඔතැන ගල් කොච්චර ඉල්ලා තිබෙනවාද ? සතියකට ඔබට කියුබ් 15ක් විතර යනවාද ?ඊළඟ ටෙන්ඩර් කමිටුව මේ මස 15 දින පැවැත්වෙනවා. එ නිසායි මා මේ ගැන විමසන්නේ .

**<u>ගරු නගර සභා මන්ත්‍රී කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
ඊළඟ ටෙන්ඩර් කමිටුව වෙනකම් ගල් ඇතිනේ .

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නෑ ගල් නැත. මෙම ටෙන්ඩරය අපි අවලංගු කරනවා . මෙය 15 ටෙන්ඩර් කමිටුවට මිළ ගණන් කැඳවන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. අයිරාංගනී මහත්මිය කතා කරමින්</u>**
තිදෙනාටම කියන්න ප්‍රවාහනය සමඟම මිළ ගණන් ඉදිරිපත් කරන්න කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
නගර සභා ක්‍රීඩා පිටියේ විසිරි ජල පද්ධතියේ මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන අතරින් අඩුම මිල ඉදිරිපත් කර ඇත්තේ ජිනසේන පුද්ගලික සමාගම විසිනි . එම අවම මිළ ගණන් පිළි ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත පිළි ගැනීමට සුදුසු යයි පවසා ඇත. එනිසා මම තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා දිස්ත්‍රික්ක ඉංජිනේරු සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය සඳුන් මහතා , ගිණුම් අංශයෙන් රෝෂිණි මහත්මියත් නම් කරනවා. ඒ ඔවුනේගේ තීන්දුව පරිදි ලබා දිය යුතු ටෙන්ඩර්කරු පිළි ගැනීමට මට බලය පවරන ලෙස ඉල්ලා සිටිනවා. මෙය තවත් ප්‍රමාද වුවහොත් තවත් ගැටලුවක් වේ. සභාව මේ සඳහා එකඟ ද ?

මේ සඳහා සභාවේ සියළුම මන්ත්‍රීවරුන් එකඟතාවය පල කරන ලදි.

**(08)** ගෙවීම්

08.01 කෙරමිණිය පතිරාජ පාර අංක 26 නිවස කාණුව ඉදිකිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ පනියන්දුව ප්‍රජා මණ්ඩලය වෙත රැඳවුම් මුදල රු.58361.98 මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**තීරණය:-**

කෙරමිණිය ,පතිරාජ පාර **,**අංක 26 නිවස අසළ කාණුව ඉදිකිරීමේ කර්මාන්තය සඳහා අම්බලන්ගොඩ පනියන්දුව ප්‍රජා මණ්ඩලය වෙත රු.58361.98 ක් වු රැඳවුම් මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමතිය ලබා දෙන ලදි.

**08.02 එස්.ටී.අමරසේකර මහතා ගලිසේවය ලබා ගැනීම සඳහා සභාවට ගෙවන ලද මුදලින් 25% ගාස්තු අඩු නොකරන ලෙස ඉල්ලීම අනුව සම්පූර්ණ මුදල වු රු.6302.70 ක මුදලක් ගෙවීම සඳහා සභා** ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**තීරණය:-**

එස්.ටී.අමරසේකර මහතා විසින් ගලිසේවය ලබා ගැනීම සඳහා සභාවට ගෙවන ලද මුදලින් 25% ගාස්තු අඩු නොකරන ලෙස කරන ලද ඉල්ලීමට අනුව සම්පූර්ණ මුදල වූ රු.6302.70 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමතිය ලබා දෙන ලදි.

**08.03** ජේ.පී.ලසන්ත එරංග මහතා වරිපනම් පත්‍රිකාවක් සඳහා රු.357/= මුදල් ආපසු ගෙවීම සඳහා සභා අනුමතිය ලබා ගැනීම

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

වරිපණම් පත්‍රිකාවක් සඳහා රු.357/=ක් ගෙවා අරගෙන නැවත එය අපට දී එම මුදල සභාවට ගෙවන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙම මුදල අපේ අතින් ගෙවමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙය නිත්‍යානුකුල දීමට නොහැකිය.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

අපි බලෙන් කිසිම කෙනෙකුට මෙම පත්‍රිකා ගැනීමට පවසා නැත.මිනිස්සු සල්ලි ගෙවා ගත්තාම එය එම පුද්ගලයාට එපා නම් මෙය ආයතනයට වැය බර වැටි ඇත. ඒ නිසා මෙය ප්‍රතික්ෂේප කරනු ලබයි.

**තීරණය**

ජේ.පී.ලසන්ත එරංග මහතා විසින් නගර සභාවෙන් ලබා ගන්නා ලද වරිපනම් ඉල්ලුම් පත්‍රිකාවක්( ඔප්පු සාරාංශ අයදුම් පත්‍රයක් ) සඳහා රු.357.00 ක මුදල ක් ආපසු ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලීම ගරු සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදි

**08.04 Procons Infotoch(PVT)Ltd** ආයතනයෙන් නිළ වෙබ් අඩවිය ලබා ගැනීම වෙනුවෙන් රු.12900/=ක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**තීරණය**

නිළ වෙබ් අඩවිය ලබා ගැනීම වෙනුවෙන් **Procons Infotoch(PVT)Ltd** ආයතනය සඳහා රු.12900.00 ක මුදලක් ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.05 අංක LL6406** දරණ වාහනයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් කග්ගොඩ ආරච්චි මොටර්ස් වෙත **රු.96750/=** සහ සේවා කිරීම වෙනුවෙන් **රු.25675/=** ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාවට අයත් අංක LL- 6406 දරණ වාහනයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.96750/= සහ සේවා කිරීම වෙනුවෙන් රු.25675/= ක මුදලක් කග්ගොඩ ආරච්චි මොටර්ස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.06** අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස සේවය කරන එම්.ආර්. චතුරිකා නිරෝෂණී පෙරේරා මෙනවියට **2018.09.11** දින සිට මසකට රු.13000/= බැගින් දීමනා ගෙවීම සඳහා සභා අනුමතිය ලබා දෙන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මැයට අදාල චක්‍රලේඛනය පරිදි තමයි මෙම ගෙවීම සිදු කරනු ලබන්නේ . එම රාජකාරිය ඉටු කළහොත් එම මුදල් ගෙවීමේ බලය අපි ලේකම්තුමියට පවරනවා. මෙය නැවත දිගින් දිගටම සභාවට දැමීමට අවශ්‍ය නැත.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාවේ මහජන සම්බන්ධතා නිලධාරි ලෙස සේවය කරන එම්.ආර්. චතුරිකා නිරෝෂණී පෙරේරා මෙනවියට **2018.09.11** දින සිට මසකට රු.13000/= බැගින් දීමනාවක් ගෙවීම සඳහා සභා අනුමතිය ලබා දිම සුදුසු බවත් අදාළ චක්‍රෙල්කය අනුව වැඩ කිරිම වෙනුවෙන් මුදල් ගෙවිමේ බලය ලේකම්තුමිය වෙත පැවරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි

**08.07 LL 7642 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් කග්ගොඩ ආරච්චි මොටර්ස් වෙත රු.16010/= ක්** මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

තීරණය -

අම්බලන්ගොඩ නගර සභාවට අයත් LL - 7642 කැබ් රථය සේවා කිරීම වෙනුවෙන් රු. 16010/= ක මුදලක් කග්ගොඩ ආරච්චි මොටර්ස් ආයතනය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.08 2018 ඔක්තෝම්බර් මස** පුස්තකාල සඳහා පුවත්පත් **රු.49330/=** ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමතිය ලබා ගැනීම.

**<u>සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඇත්තටම මෙම පුවත්පත් ගැනීමේදි සියළුම මන්ත්‍රීවරුන්ට එ ගැන අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. දැන් පුවත්පත් වල මිල ගණන් එන්න එන්නම වැඩි වෙනවා. දැන් පුස්තකාලයට මාසයකට රු.50000/= ක පුවත්පත් ගන්නවා. පුස්තකාල 7 ක් ඇත. දැන් අපි පුස්තකාල 7 පොත් ගන්නවා ලක්ෂ 6ක පමණ. හැබැයි අපි ලක්ෂ 6 ක පොත් ගන්නේ නෑ . පුවත්පත් තමයි ගන්නේ . මේ පුවත්පත් වල තමන්ගේ කොට්ඨාශ වල ඇති පුස්තකාල වල යම් කිසි සීමාවක් කිරීම සිදු කළ යුතුයි . මෙවැනි මුදලක් දැරීමට සිදුවීම අපට ඉතාමත් අසීරුය.අපි දැනුම වැඩි කරනවා නම් කළ යුත්තේ පොත් පත් තමයි වැඩිපුර මිලදි ගත යුත්තේ. නැවත සලකා බලන්න.

**08.09** දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට **2018 ඔක්තෝම්බර් මස NBT** කොටසක් සඳහා **රු.20000/=** ක මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

තිරණය -

**2018 ඔක්තෝම්බර් මස NBT** කොටසක් වන **රු. රු.20000/=** ක මුදලක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.10** 2018 IV කාර්තුවේ ඔක්තොම්බර් 16-31 දින දක්වා **රු.27371.05** මුදලක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

තිරණය -

2018 හතරවන කාර්තුවේ ඔක්තොම්බර් 16-31 දින දක්වා VAT මුදල **රු.27371.05** මුදලක් දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**08.11** හිරිකැටිය හරස් පාර ,අතුරු මාර්ගය හා කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය වෙත රඳවුම් මුදල **රු.39052.30** මුදලක් ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**තීරණය**

හිරිකැටිය හරස් පාර ,අතුරු මාර්ගය හා කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා රඳවුම් මුදල **රු.**39052.30 මුදල අම්බලන්ගොඩ හෙප්පුමුල්ල සමගි ප්‍රජා මණ්ඩලය ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.12** අම්බලන්ගොඩ කරිත්තකන්ද සක්වා ප්‍රින්ටස් පාර කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් අදාල බිල්පතේ මුදල වන රු.614515.97 දිස්ත්‍රික් ඉංජිනෙරු මහතාගේ අනුමතියෙන් පසු විලේගොඩ ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මේ සම්බන්ධව මම ස්තුති වන්ත වෙනවා කරිත්ත කන්ද මගේ මේ වසමේ පාර තැනීම කොන්ක්‍රීට් කිරීම සම්බන්ධව . හැබැයි මට කනගාටුවට කරුණක් තිබෙනවා.මෙම කරිත්ත කන්ද ප්‍රජා මණ්ඩලයේ අනුශාෂකවරයා ලෙස මා කටයුතු කරනවා . ඔවුන් මගෙන් විමසා සිටියා අපි ඉදිරිපත් වී සිටිද්දිත් මෙම කොන්ත්‍රාත්තුව වෙනත් ප්‍රජා මණ්ඩලයකට පැවරීම සම්බන්ධයෙන් මෙම වසමට අහිමි වීම සම්බන්ධයෙන් මගෙන් කරුණු විමසුවා.

<u>**සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

ඔවුන්ගේ එකඟත්වය මත තමයි එය දුන්නේ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>

නෑ එහෙම එකඟත්වයක් දී නැත. සභාපතිතුමනි මා මගින් මගටම කිවානේ .මා අත්සන් කර අයදුම් පත්‍ර ලබා දුන්නා . ඔබතුමා ඉදිරියෙත් මෙය මා පැවසුවා. මේක වෙනස් කරන්න කියලා.

<u>**සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

මෙහි සභාපතිතුමා පැමිණි මොහොතේ ඒ අයට පැවසුවා මෙම කොන්ත්‍රාතුව වෙනුවට අපිට වෙනින් කොන්ත්‍රාතුවක් ලබා දෙන ලෙස. අපි දෙන්නම් කියා එකඟත්වයට පත් වුණා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>

ඔබතුමා කියනවානම් මම එය පිලිගන්නම් . එතුමා මට මඟින් මගටම කතා කර කිවා මෙය මේහෙම වෙලා තිබෙනවා කියා. මම පැවසුවා මා දන්නේ නෑ. සභාවෙන් ඔබතුමා මේ පිළිබඳව බැලිමට ගියේ නැත්නම් තමයි මෙහෙම වෙන්නේ කියා. එතුමා අත්සන් කර අයදුම්පත්‍ර භාර දුන් පසු තමයි මෙහෙම සිද්ධ වුණේ. නමුත් මම මෙහෙම ප්‍රකාශ කරන්නේ ඔවුන්ට අනුශාෂක ලෙස එම සමිතියේ සිටින නිසා මා ඔවුන්ට යමක් ඉදිරිපත් කිරීමට තිබෙනවා. ඉතිං මා සභා වාර්තාව ඉදිරිපත් කරන්නම් ඔවුන්ට.

**ගරු නගර සභා මන්ත්‍රිනි ඩබ්.එම් නිලානි මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි , මේ 08.11 හිරිකැටිය හරස් පාරේ අතුරු මාර්ගය කොතනද දන්නේ නැ නේද?

**සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

නැ මෙය කලින් කරන ලද දෙයකි. එහි රැඳවුම් ගාස්තු ගෙවන්නේ නැතිව තිබිලා තියෙනවා.මේ ලඟදි දැනුම් දී තියෙනවා සභාවෙන් රැඳවුම් ගාස්තු ලබා ගන්නා ලෙස. ඒ අනුව ගෙවන්න.මෙය මා හිතන විදියට බොහෝ කලකට ඉහතකදි කරන ලද දෙයකි.

**තීරණය**

අම්බලන්ගොඩ කරිත්තකන්ද සක්වා ප්‍රින්ටස් පාර කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් අදාල බිල්පතේ මුදල වන රු.614515.97 දිස්ත්‍රික් ඉංජිනෙරු මහතාගේ අනුමතියෙන් පසු විලේගොඩ ප්‍රජා මණ්ඩල කමිටුව වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.13** රණසූරිය පාරේ පෙට්ටි බෝක්කු ඉදිකිරීම වෙනුවෙන් අදාල බිල්පත සඳහා රු.1023530.95 පොරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මෙම පෙට්ටි බෝක්කුවේ මුදල් ගෙවීම ප්‍රශ්නයක් නැත .මෙම පෙට්ටි බෝක්කුවේ උස වැඩියි අඩියක් විතර . උස වැඩි නිසා පාරෙන් එක පාරටම හැඩයක් යනවා . හැඩය අඩුකරලා පාර උස වැඩි වන විදියට සැදිමත්, රණසූරිය පාරේ ප්‍රධාන පාරේ ලොකු වලවල් ඇත. එම ලොකු වලවල් ටිකත් වසා සකසා දෙන ලෙසත් , තවත් දෙයක් ඇත කියන්න කනගාටුයි . නිලධාරින් අපහාසුතාවට පත් කරන්න කැමති නෑ. මෙම සමිතියේ කලින් සභාපති ලෙස සිටියේ මම . දැන් මා මන්ත්‍රීවරයෙක් ලෙස සිටින නිසා ගන්න බෑ. ඔවුන් කෙලින්ම චෝදනා කර සිටිනවා. මා පැවසුවා නිලධාරින් අපහසුතාවයට පත් කරන්න එපා .මා දෙදෙනෙකුගෙන් දවස් දෙකක් විමසුවා ගිවිසුමේ පිටපත් අපිට අවශ්‍යායි. සමිතිය කරගෙන යද්දි. එත් අපිට ලැබුණේ නෑ.සමිතිය දවස් දෙකක් විතර කතා කර ඇත. තාක්ෂණසේවා නිලධාරිතුමාටත් කතා කළා . එය ලබාදෙන ලෙස ඉල්ලීමක් කර සිටිනවා. නිලධාරින් අපහසුතාවයට පත් කරන්න නෙමේ මා ප්‍රකාශ කරන්නේ.ඉදිරියටත් මේවැනි දේ නොවීමටයි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මන්ත්‍රීතුමා ඇයි මාව දැනුවත් නොකලේ .

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

විනිවිදභාවයකින් මෙය කරන ලෙස ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

යම් කිසි කොට්ඨාශයක වැඩ කරනවිට එම කොට්ඨාශවල මන්ත්‍රීවරු 12 කු සිටි. ඒ මන්ත්‍රීතුමාට අදාල ඇස්තමේන්තුවේ පිටපත යවන්න. එම මන්ත්‍රීතුමා ඊට පසු හොඳින්ම සොයා බලාවි තමන්ගේ ගමේ කරන වැඩය හරියට කරනවාද කියා. එය ඔවුන්ට යවන්න.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, ගිවිසුම්ගත සමිතියට එය දෙන්න ඔනෑ නේද?

**<u>ගරුසභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ගිවිසුම් ගත සමිතියට නොදී කොහොමද ? එම වැඩය කරන්නේ. නොදී කළ නොහැක .ගිවිසුම අත්සන් කර ඇත්තේ ඔවුන් විසිනි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**
ගිවිසුම අත්සන් කළා . එහි පිටපත ලැබුණේ නැහැ. මම හිතන්නේ විෂයභාර නිලධාරිතුමිය ඒ මොහොතේ සිටියේ නැත. ගිවිසුම අත්සන් කළා. එහි පිටපතයි අපිට නොලැබුණේ.

**<u>ගරුසභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

සෑම පිටපතක්ම සමිතියට යවන්න. දැන් මෙහෙම වෙන්නේ අදාල සමිතියේ සභාපතිතුමා සමඟ කොන්ත්‍රාත්ගත් මහතාත් එනවා. කොන්ත්‍රාත් ගත් මහතා මෙය අරගෙන යනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

නිලධාරිමහත්මිය ඒ මොහොතේසිටියේ නෑ. නිලධාරිණිය අපහසුතාවයට පත් කරන්න නෙමේ මා මෙය පැවසුවේ. පසුව මා මෙය තාක්ෂණසේවා නිලධාරි මහතාට පැවසුවා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
යම් කිසි කොට්ඨාශයක වැඩක් කරනවානම් එහි පිටපතක් අදාල කොට්ඨාශයේ මන්ත්‍රීවරයාට ඇස්තමේන්තු අනිවාර්යෙන්ම යවන්න. එවගේම ආදාල ප්‍රජා මණ්ඩලයටත් යවන්න. ප්‍රජා මණ්ඩලයට යවන්නේ ඒ ප්‍රජා මණ්ඩලයේ බිත්තියක හරි කොතැනක හෝ එය පළ කළ විට ගමේ වැසියෙකුට ගියවිට මෙන්න මෙහි මේ විදියට තමයි වැඩ කටයුතු සිදු වනනේ කියා දැන ගත හැකිය. වරදක් ඇත්නම් එම වරද ගැන විවේචනය කිරීමේ හැකියාව ඇත.

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , මට චෝදනාවක් ආවා ඒ සම්බන්ධව

**<u>සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
ගරු මනත්‍රීතුමාගෙන් සමාව ඉල්ලා සිටිනවා එවැනි දෙයක් සිදු වුණා නම් . ඇයි ඔබතුමා මා පිළිබඳ දැනුවත් නොකලේ.
**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , අර බයිබස් පාර තියෙන්නේ . ඒ පාරේ පොඩි ගල් සියල්ලම සෝදා ගෙන ගොස් ඇත. විශාල ගල් මතු වී ඇත. එය පොඩ්ඩක් සාදා දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එම පාර අපි සාදනවා.

**<u>ගරුසභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**
මෙම පාරේ උස මාත් දකිනවා . එයට හරියන රැම් එකක් තිබෙනවාද? අඩුපාඩුවක් නැතිව මෙය කරන්න. අපි මේ සඳහා මුදල් ගෙවන්නම් .

**<u>ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්</u>**

මෙය උස්වූ එක නම් ගොඩක් හොඳයි. ගංවතුර කරදරය නිසා මෙය උසට සෑදූ එක හොඳයි.මෙම උස නිසා හැඩය වෙනස් වී ඇත. වාහන ගමන් කරන විට ප්‍රශ්නයකි.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

එය උසට සෑදීම හොඳයි. මට මතකයි ගංවතුර ඇතිවූ කාලයක පාසල් ළමුන් එහාට මෙහාට කරන්න ට්‍රැක්ටරයක් පදවන්න කවුරුත් සිටියේ නැත. මා එදා එම ට්‍රැක්ටරය ධාවනය කර ළමුන් දමාගෙන එහා පැත්තට ගියා. එම නිසා ඔය උසට සෑදිය යුතුයි.

**තීරණය**

රණසූරිය පාරේ පෙට්ටි බොක්කු ඉදිකිරීම වෙනුවෙන් අදාල බිල්පත සඳහා රු.1023590.95 ක මුදලක් පොරඹ පනියන ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී අතුල ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.14** අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගනයේ කොන්ක්‍රීට් කාණු ඉදි කිරිමේ කර්මාන්තය වෙනුවෙන් රු.800723.10 ක මුදල පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දැන් මන්ත්‍රීවරුන්ට ප්‍රකාශ කරන්න කැමතියි . අපි සභාවට පැමිණි පසු මුලින්ම කිරීමට ගත් වැඩය. ඔන්න අද තමයි ගෙවීමට ඉදිරිපත් වි ඇත්තේ. එවැනි තත්වයක් පළාත් සභාව තුලින් ඇති නොවේවා කියා ප්‍රර්ථනා කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ධනසේන මාදුවගේ මහතා කතා කරමින්**

සභාපතිතුමා , උප සභාපතිතුමා එය ලබා ගත යුතුයි

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

අපි මිනිසුන්ටයි වැඩ කරන්නේ.

**තීරණය**

අම්බලන්ගොඩ නගර සභා ක්‍රිඩාංගනයේ කොන්ක්‍රීට් කාණු ඉදි කිරිමේ කර්මාන්තය වෙනුවෙන් රු.800723.10 ක මුදලක් පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.15** අම්බලන්ගොඩ පටබැඳිමුල්ල අදහානාගාරයේ විමිනිය අලුතින් සුදු යකඩ මඟින් ඉදි කිරීම වෙනුවෙන් 50% ක ඉතිරි මුදල වන රු1030306.12 ක මුදල NDRD ආයතනයට ගෙවිම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , මා ඉල්ලා සිටිනවා අර ගලවගෙන ආ විමිනිය තියෙනවානේ එය ඉතා ඉක්මනින් මෙය වෙන්දෙසි දමා විකුණන ලෙස. මෙය දිර දිර යනවා මෙතැනත් අවලස්සන වී ඇත. මේ සියලු දේ ගෙනවිත් දමන්නේ මෙහි. මා ඉල්ලා සිටින්නේ මේවා වෙන්දෙසි දමා විකුණන ලෙස. පරණ යකඩ වලට හරි මෙය දෙන්න.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

දෙසැම්බර් මස වෙන්දෙසියට දමන්නම්. ලණු පැදුරු වගයකුත් මෙතැන තියෙනවා . මේවා දිරා අයින්වෙනවා. මේවා කලින් හරි වෙන්දෙසියට දමන්න.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මා මෙය අයින් කිරීමට පැවසුවා. එහෙත් ඒවා අයින් කරන්න එපා කියා ඇත.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙය ගෙනාපු එක හරියට හරි . මන්ත්‍රීතුමා පවසන්නේ මෙය යකඩ වලට හරි විකුණන ලෙසයි.

**තීරණය**
අම්බලන්ගොඩ පටබැඳිමුල්ල අදහානාගාරයේ විමිනිය අලුතින් සුදු යකඩ මඟින් ඉදි කිරීම වෙනුවෙන් 50% ක ඉතිරි මුදල වන රු1030306.12 ක මුදල NDRD ආයතනයට ගෙවීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.16** නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් සඳහා රු 81000/= මුදලක් ගෙවිම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

තිරණය -

නගර සභා මන්ත්‍රීතුමන්ලාගේ ගමන් වියදම වන රු.81000.00 ක මුදල සභා අනුමැතියට යටත්ව ගෙවීම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**08.17** ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් Eser Marketing International (PVT)LTD ආයතනයට රු373700/= මුදලක් ගෙවීමට සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් එම මුදල ගෙවීම සඳහා සභාවේ අනුමතිය ලබා දෙන ලදී.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

සභාපතිතුමනි , කොහේටද ඔය ගෙවන්නේ.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**
අපගේ ශරීර සුවතා මධ්‍යස්ථානයට ගත් දුවන මැෂිම සඳහායි.

**තීරණය**
ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් රු373700.00 ක මුදලක් Eser Marketing International (PVT)LTD ආයතනය වෙත ගෙවීම සුදුසු බවට ගරු ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**(09)** ගිණුම්

**2018 සැප්තැම්බර් මාසයට අදාල ගිණුම් වාර්තා සභාගත කිරිම**

**තීරණය**
2018 සැප්තැම්බර් මාසයට අදාල පොදු ගිණුම් - වියදම් වැය විශ්ලේෂණය හා 2018 සැප්තැම්බර් මස වියදම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති එම් . ඩබ් . අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කරන ලද අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සම්මත විය.

(10) **ඇස්තමේන්තු**

**10.01** අම්බලන්ගොඩ නගර සභාවේ පටබැදිමුල්ල (රේණුක මොටර්ස් )අසළ **පොදු ළිඳ අලුත්වැඩියා කිරීම** සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද **රු.400000/=** ඇස්තමේන්තුව සභාගත කරන ලදි.

තීරණය:-
අම්බලන්ගොඩ නගර සභාවේ පටබැදිමුල්ල (රේණුක මොටර්ස් )අසළ පොදු ළිඳ අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.400000 .00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ගංගේ සරත් ශ්‍රී ලාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.02** නගර සභා ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව සඳහා රු170000/= අදාල ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

මෙය මෙම ගණනින් ඉටු කළ හැකිද . මේ දැන් මුළු ගොඩනැගිල්ලම කඩන්න කියපු වැඩය රු.170000/= මුදලකින් නිම කිරීමට හැකිද ? මෙයින් මේ වැඩේ සම්පූර්ණ වෙන්නේ නැද්ද ? මෙය හෙටම වුණත් කමක් නැත සිදු කළාට .

තීරණය:-
අම්බලන්ගොඩ නගර සභා ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව සඳහා සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.170000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.03 මහජන ක්‍රීඩාංගනයේ කාණුව (බෝගහ පැත්ත)** ඉතිරි කොටස සඳහා රු.922000/=ක ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

බෝ ගස එහා පැත්තේ කාණුවක් නැත . එම කාණුව ඉදිකිරීමට. එය ඉතා ඉක්මනින් නිම කරන
ලෙස දන්වා සිටිනවා.

**තීරණය**
මහජන ක්‍රීඩාංගනයේ කාණුව (බෝගහ පැත්ත) ඉතිරි කොටස සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.920000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.04 දෙල්දූව පාර ප්‍රතිසංස්කරණය කිරීම** සඳහා අදාල ඇස්තමේන්තු සභා ගත කිරීම.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

උක්ත කරුණට අදාල ඇස්තමේන්තු 3 ක් ඉදිරිපත් කර ඇත. නිලානි මන්ත්‍රීතුමිය මේ දෙල්දූව පාර කොටසක් තාර යොදා සංවර්ධනය කිරීමට රු.500000/= ක් වැයවේ. ඒ එක කොටසක් . දෙල්දූව පාර 300m කොටසක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම රු.6500000/= මුදලක් වැයවේ. මාර්ගය දෙපස කාණු පද්ධතිය සැකසීමට රු.6500000/= මුදලක් වැයවේ. මෙම වැඩය නිම කිරීමට රු.13500000/= මුදලක් වැයවේ.දැනට රු.5000000 නිම කළ හැකි කොටස කරන්න.

**තීරණය**
දෙල්දූව පාර 300 m කොටසක් කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.6500000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් දැනට පළාත් සභාව මගින් ලබා දි ඇති ලක්ෂ 50 ක මුදල මගින් ඉටු කළ හැකි ප්‍රමාණය ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.05** **දෙල්දූව පාර කාණු පද්ධතිය** සඳහා අදාල ඇස්තමේන්තුව සභා ගත කිරීම.

**ගරු නගර සභා මන්ත්‍රීනි ඩබ්. එම් . නිලානි මෙනවිය කතා කරමින්**

සභාපතිතුමනි , මේ සඳහා අපි සභා අරමුදලින් කාණු දමමු.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

හරි අපි එය බලමු .

තීරණය:-
දෙල්දූව මාර්ගය දෙපස කාණු පද්ධතිය සකස් කිරිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.6500000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවත් මෙම කටයුත්ත දැනට පළාත් සභාව මගින් ලබා දි ඇති ලක්ෂ 50 ක මුදල මගින් ඉටු කළ හැකි ප්‍රමාණය ඉටු කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.06** **මහජන සෞඛ්‍ය පරික්ෂක කාමරය වෙන් කිරීම** සඳහා රු.200000/= ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.

**තීරණය**

මහජන සෞඛ්‍ය පරික්ෂක කාමරය වෙන් කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.200000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.07** **නගර සභා ගබඩා කාමරය ඉදිරිපිට වහල ඉදි කිරීම** සඳහා අදාල ඇස්තමේන්තුව සභා ගත කිරීම.
මේ සඳහා ඇස්තමේන්තු ඉදිරිපත් කර නොමැත.

**10.08** **මෝදර දේවාල පාර මාර්ග බාධක** ඉදිකිරීම සඳහා රු.40000/= ඇස්තමේන්තුව සභා ගත කරන ලදි.

**තීරණය**
මෝදර දේවාල පාර මාර්ග බාධක ඉදිකිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.40000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.09** අම්බලන්ගොඩ පටබැඳිමුල්ල පොදු වෙළඳ පොළ **කඩකාමර අංක 06** අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් කරන ලද **රු.68,540.61** ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ .සෝභිත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි , ඔය අංක 06 කඩ කාමරය මොකක්ද දන්නේ නෑ නේද ?

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එහි අලුත් වැඩියා කටයුතු කිරිම සඳහායි. මෙම කඩ කාමරය අපි ටෙන්ඩර් කර ඇත. මෙය එම තැනැත්තාටම ඉටු කරගෙන එම තැනැත්තාගේ බද්දෙන් අඩු කර දමමු.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි එම පුද්ගලයා ලඟ මුදල් නොමැති බව උදන්වා ඇත. නගර සභාවෙන් එය ඉටු කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

එම පුද්ගලයා රු300000/= ක පමණක මුදලක් නගර සභාවට ගෙවා ඇත. එම නිසා මෙය ඉටු කර දෙන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

එම පුද්ගලයා රු.500000/= පමණ මුදලක් නගර සභාවට ගෙවා ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ පටබැඳිමුල්ල පොදු වෙළඳ පොළ කඩකාමර අංක 06 අලුත්වැඩියා කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් කරන ලද රු.68,540.61 ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.10** මාදම්පා ගඟ අසළ පිහිනුම් තටාකය අලුත් වැඩියා කිරීමේ ඇස්තමේන්තුව රු.640000/= සභා ගත කරන ලදී.

**තීරණය**

මාදම්පා ගඟ අසළ පිහිනුම් තටාකය අලුත් වැඩියා කිරීමේ ඇස්තමේන්තුව රු.640000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.11** පොල්වත්ත සාප්පු සංකිර්ණයේ වැසිකිළි වළ අලුත් වැඩියාවේ ඇස්තමේන්තුව රු40000/= සභා ගත කරන ලදී.

**තීරණය**

පොල්වත්ත සාප්පු සංකිර්ණයේ වැසිකිළි වළ අලුත් වැඩියාව සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.40000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.12** අම්බලන්ගොඩ පොදු වෙළඳ පොළ වැසිකිළියේ දොර සකස් කිරීම රු.40000/= ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**</u>

ගරු සභාපතිතුමනි ,පොදු පොළඳ පොළ (මාලු වෙළඳපොලේ ) දොර සාදන්නේ මොනවාගෙන්ද?

<u>**ගරුසභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**</u>

ඇලුමිනියම් දොරක් සෑදිම සඳහා

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**</u>

අපේ ලී තිබුණානේ . මඩුවට දැම්මානේ ඔක්කොම කොට ටික ගෙනහින්. අලුමිනයම් වලින් සෑදුවොත් වීදුරු බිදෙනවානේ . එහි වීදුරු දොරක් තිබුණානේ එහි. එය සාදා තිබුණේ. දැනුණුත් එය බිඳ දමා ඇත. වසර කිහිපයක් වෙනවා විනාශ වී.

<u>**ගරු නගර සභා මන්ත්‍රී සෝභිත රංජිත් මහතා කතා කරමින්**</u>
එම වැසිකිළියේ දොරක් නැද්ද? එම කැඩුණු දොර අලුත් වැඩියා කර ගැනීමට නොහැකිය.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**</u>
අපේ සභාවේ කවුරුත් නැද්ද මෙය අලුත් වැඩියා කිරිම සඳහා.
**තීරණය**
අම්බලන්ගොඩ පොදු වෙළඳ පොළ වැසිකිළියේ දොර සකස් කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.40000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.13** මහජන ක්‍රිඩාංගනයේ ඉහල කොටසේ වාහන නැවතුම් අංගනය ඉදිකිරීමරු5000000/= (BOC එක ලඟ) ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

**තීරණය**
මහජන ක්‍රිඩාංගනයේ ඉහල කොටසේ වාහන නැවතුම් අංගනය ඉදිකිරීම (BOC එක ලඟ) සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.5000000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සභා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.14** අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති යතුරුපැදි නැවතුම් අංගනය සඳහා ගේට්ටුවක් සවි කිරීමටරු.20000/= ඇති ඇස්තමේන්තුව සභා ගත කරන ලදී.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**</u>
එතැන ත්‍රීරෝද රථ ගාල පිටුපස යතුරුපැදි 6 ක් 7ක් පණයි නතර කල හැක්කේ.

<u>**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**</u>

කඩහිමියන් විසින් පවසා සිටිනවා ඔවුන්ගේ යතුරුපැදියක්වත් මෙහි නතර කිරිමට නොහැකි බව.
ඔවුන් ඉල්ලා සිටින්නේ එම අයගේ වාහන නතර කර තැබිමට.

**තීරණය**

අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ ඉදිරිපිට ඇති යතුරුපැදි නැවතුම් අංගනය සඳහා ගේට්ටුවක් සවි කිරීම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.20000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**10.15** හල් වතුර කසළ අංගනයේ කසළ තුනි කරිම සඳහා D4E යන්ත්‍රය යොදා ගැනීමට අදාළව රු 497000/= ඇස්තමේන්තුව සභාගත කිරීම.

**තීරණය**

හල්වතුර කසළ අංගනයේ කසල තුනි කිරිම සඳහා D4E යන්ත්‍රය යොදා ගැනිම සඳහා තාක්ෂණසේවා නිළධාරි විසින් සකස් කරන ලද රු.497000.00 ක ඇස්තමේන්තුව පිළිගැනිම සුදුසු බවටත් මෙම මුදල සහා අරමුදලින් ගෙවීම සඳහාත් ගරු සභාපති ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වූ බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

## (11) වෙනත් කරුණු

**11.01 අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 සැප්තැම්බර්** මාසය සඳහා වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 17 ½ ක් බවත් පැමිණි රෝගීන් ගණන 131ක් බවත් රෝගීන් පැමිණීමේ දෛනික සාමනාය ගණන 7 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු.13418.14ක් බවත් රෝගීයෙක් සඳහා වැය වූ මුදල රු.102.42 ක් බවත් දන්වා තිබුණි.

තීරණය:-

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 සැප්තැම්බර්** මාසය සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**11.02 අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 ඔක්තෝම්බර්** මාසය සඳහා වාර්තාව සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 19 ½ ක් බවත් පැමිණි රෝගීන් ගණන 162ක් බවත්

රෝගීන් පැමිණීමේ දෛනික සාමනාය ගණන 7 ක් බවත් මාසය සඳහා වැයවූ ඖෂධවල වටිනාකම රු.16955.76 බවත් රෝගීයෙක් සඳහා වැය වූ මුදල රු.104.66 ක් බවත් දන්වා තිබුණි.

තීරණය:-

**අම්බලන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ 2018 ඔක්තෝම්බර්** මාසය සඳහා වාර්තාව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**11.03 2019** වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා අනුමතිය ලබා ගැනීමට අදාල ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

2019 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඇති දැන්වීම සිංහල , ඉංග්‍රීසි , දෙමළ යන භාෂා තුනෙන්ම Daily News , දිනකර පත්‍රයට පළ කිරීමට අනුමතිය ඉල්ලා සිටිම.

තීරණය:-
2019 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඇති දැන්වීම සිංහල , ඉංග්‍රීසි , දෙමළ යන භාෂා තුනෙන්ම Daily News , දිනකර පත්‍රවල පළ කිරීම සඳහා ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදි.

**11.04** පළාත් පලාන කොමසාරිස් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්බන්ධ තොරතුරු නිලධාරින් හා අභියාචනා නිලධාරින් පත් කිරීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.

තීරණය:-
පළාත් පලාන කොමසාරිස් විසින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්බන්ධ තොරතුරු නිලධාරින් හා අභියාචනා නිලධාරින් පත් කිරීම සම්බන්ධව එවන ලද ලිපියට අනුව අම්බලන්ගොඩ නගර සභාවේ ප්‍රධාන කළමණාකරන සහකාර තොරතුරු නිලධාරියා ලෙසත් අභියාචනා නිලධාරියා ලෙස නගර සභාවේ ගරු සභාපතිතුමාත් පත් කිරිම සම්බන්දව සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරන ලදි

**11.05** අම්බලන්ගොඩ RIO Sports CLUB ආයතනයේ ක්‍රිකට් ඇකමඩිය මගින් සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය 2018.11.11 දින කොඩි කණු **25** ක් සහ පාට කොඩි **25ක්** නොමිලේ ලබා දීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදී.

අම්බලන්ගොඩ RIO Sports CLUB ආයතනයේ ක්‍රිකට් ඇකමඩිය මගින් සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය 2018.11.11 දින පැවැත්වෙන බැවින් ඒ සඳහා කොඩි කණු **25** ක් සහ පාට කොඩි **25ක්** නොමිලේ ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.
තීරණය:-

අම්බලන්ගොඩ RIO Sports CLUB ආයතනයේ ක්‍රිකට් ඇකමඩිය මගින් සංවිධානය කරනු ලබන සය සාමාජික ක්‍රිකට් තරඟාවලිය 2018.11.11 දින පැවැත්වෙන බැවින් ඒ සඳහා කොඩි කණු **25** ක් සහ පාට කොඩි **25ක්** නොමිලේ ලබා දෙන ලෙසට කරන ලද ඉල්ලිමට අනුව සභා අනුමැතියට යටත්ව ලබා දිම වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**11.06** තල්ගස්ගොඩ පෙර පාසලට නොමිළේ අධ්‍යාපන චාරිකාව සඳහා බස් රථය ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ,උප සභාපතිතුමා සහ මන්ත්‍රීවරුන්ට පෙර පාසලේ ගුරුතුමිය ඇතුළු දෙමාපිය සංගමය විසින් ස්තුතිය පුද කිරීමේ ලිපිය සභා ගත කරන ලදී.

## (12) න්‍යාය පත්‍රයට ඇතුළත් නොවූ වෙනත් කරුණු

12.01 ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්ථාලය ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

උක්ත කරුණ සම්බන්ධව ගාල්ල කොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය අධ්‍යක්ෂක විසින් අම්බලන්ගොඩ ඕලන්ද ස්තාලය සහිත ගොඩනැගිල්ල පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට දෙන ලෙසත එම ගොඩනැගිල්ලට ජල හා වැසිකිළි පහසුකම් ලබා දෙන ලෙස මා වෙත ඉල්ලීමක් කර ඇත. එබැවින් මෙම ගොඩනැගිල්ල සහිත භූමිය නගර සභාව විසින් භුක්ති විඳින්නේද එම භූමිය කවර කටයුත්තක් සඳහා භාවිතා කරන්නේද ?ජල හා වැසිකිළි පහසුකම්

සපයා දීමේ හැකියාව පවති ද යන්න පිළිබඳ දන්වා එවන ලෙස ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් ඉල්ලිමක් කර ඇත.මෙම භූමිය නගර සභාවට ගැසට් මඟින් පවරා ඇත. එම භූමිය සංරක්ෂණය කරන්නේ රජයේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව. වැසිකිළි සෑදිම සඳහා නම් තව දීමට නොහැකිය. ඒ සඳහා ඉඩ නොමැත.එතැන වැසිකිළි සාදා වැඩක් නැත. මෙය ප්‍රාදේශිය ලේකම්තුමිය විසින් තමයි ඉල්ලීමක් කරන්නේ. ඒ භූමිය එම අයට පවරා දෙන ලෙස ඉල්ලා සිටි. මොකද මේ සම්බන්ධව මන්ත්‍රීවරු ප්‍රකාශ කරන්නේ. එය ප්‍රතික්ෂේප කරන ලදී

**තීරණය**
ඓතිහාසික අම්බලන්ගොඩ ඕලන්ද ස්ථාලය ගොඩනැගිල්ල සහිත භූමිය සඳහා ජල සහ වැසිකිළි පහසුකම් සපයාදිම සම්බන්ධයෙන් හැකියාවක් පවතිද යන්න සම්බන්ධව අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිරිපත් කළ ලිපියට අනුව මෙම ඉල්ලිම ප්‍රතික්ෂේප කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව මේ සඳහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

12.02 2018 නොවැම්බර් මාසයේ මාසික සභා රැස්වීම සඳහා සහභාගි වීමට නොහැකි බව ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පනියන්දුවගේ මහතා විසින් දන්වා එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2018 නොවැම්බර් මාසයේ මාසික සභා රැස්වීම සඳහා සහභාගි වීමට නොහැකි බව දන්වා ඩෙනට් පිනියන්දුවගේ මහතා විසින් දන්වා ඇත.

**තීරණය**
**කොළඹින් බැහැර සිටින බැවින්** 2018.11.13 දින පැවති මාසික සභා රැස්විම සඳහා සහභාගි විය නොහැකි බව දන්වමින් ගරු නගර සභා මන්ත්‍රී ඩෙනට් පන්යන්දුවගේ මහතා විසින් ඉදිරිපත් කරන ලිපියට අනුව එම දින සඳහා නිවාඩු ලබා ගැනිම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදි.

**12.03** නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ අලුත් වැඩියාව සම්බන්ධව පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු තුමාන් සමඟ ස්ථානය පරීක්ෂණයක් සිදු කරන ලද ලිපියේ විස්තර සඳහන් ලිපිය සභාගත කරන ලදී.

නගර සභා කාර්යාල ගොඩනැගිල්ලේ අලුත් වැඩියාව සම්බන්ධව පලාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු තුමාන් සමඟ ස්ථානය පරීක්ෂණයක් සිදු කරන ලදි. එහි පරීක්ෂණයන්ට අනුව හා වාර්තාවට අනුව සඳහන් කර සිටියත් උඩුමහලේ දැනට පවතින හරස් බිත්තිය එකවර ඉවත් කිරීම නුසුදුසු බවයි. ඒ අනුව දැනට පවතින ගොඩනැගිල්ලේ ව්‍යුහමය තත්වය පිළිබඳ පළමුව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා පළමු අදියර ලෙස පවතින සිවිලිම සම්පුර්ණයෙන් ඉවත් කිරීම හා සිමෙන්ති හුණු බදාම කපරාරුව ඉවත් කිරීම සුදුසු බවයි. ඒ අනුව සිවිලිම හා කපරාරුව (අභ්‍යාන්තර ) ඉවත් කිරීම සඳහා අදාල ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇත.

තීරණය:-
නගර සභා ගොඩනැඟිල්ලේ අලුත්වැඩියාව සම්බන්ධව පළමු අදියර ලෙස පවතින සිවිලිම අලුතින් ඉවත් කිරීම සහ සිමෙන්ති හුණු බදාම කපරාරුව ඉවත් කිරීම සුදුසු බැවින් සිවිලිම හා කපරාරුව ( අභ්‍යන්තර ඉවත් කිරිම සඳහා අදාළ ඇස්තමේන්තුව ඉදිරිපත් කර ඇති බැවි සභාවට ඉදිරිපත් කරන ලදී.

**12.04** විදුලි උපාංග සඳහා 400W මර්කරි චොක් ඇණවුම් කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

මෙකී කරුණට අදාලව 2018 ඔක්තෝම්බර් මස මාසික මහා සභාවේදි සාකච්ජා වු කරුණු මත තාක්ෂණ සේවා නිලධාරි වන මා හට ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා ඇත. මෙම ඇණවුම් කිරීමේදි මාගේ අධික්ෂණයකින් තොරව මෙය සිදු වී ඇති බවත් පළමුව සඳහන් කරමි.

❖ මර්කරි චොක් මිලදී ගැනීමට ප්‍රථම ගබඩාව විසින් එම උපාංග ගබඩාව විසින් එම උපාංග ගබඩා රික්විෂණයේ සඳහන් කර ඇත්තේ මර්කරි බල්බ් සඳහා චොක් 400W වශයෙනි.

❖ ඒ අනුව මිල ගණන් ලබා ගැනීමට වෙළඳ ආයතන වලට ඉදිරිපත් කර ඇති ලේඛණ වලද සඳහන් කර ඇත්තේ මර්කරි බල්බ් චෝක් 400Wලෙසය.

❖ ඉහත සටහන් කිරීම් දෙකම වැරදි බව නිරීක්ෂණය වේ . මන්ද මර්කරි බල්බ් වල වෝට් 125 ලෙස සටහන් විමයි. මාගේ දැනීම අනුව මේ වන විට නගර සභාව විසින් භාවිතා කරන්නේ වොට් 125 මර්කරි බල්බ් බවද වාර්තා කරමි.

❖ මෙම ගැටලුව නිසා මා විසින් මෙම මර්කරි චොක් සපයා ඇති වෙළඳ ආයතනය වන ඒෂියන් ඉලෙක්ට්‍රිකල් ආයතනයට දුරකථනයෙන් විමසූ විට ,

| | |
|---|---|
| වොට් 400 චොක් එකක මිල | රු.3800/= බවත්, |
| වොට් 125 චොක් එකක මිල | රු.2950/= (කොපර් ) බවත් |
| වොට් 125 චොක් එකක මිල | රු1700/= (ඇලුමිනියම් ) බවත් දන්වා සිටින ලදී. |

❖ ඒ අනුව මිල ගණන් ඉදිරිපත් කර ඇත්තේ වොට් 125 (රු.2950/=) බව නිරීක්ෂණය වේ

❖ එසේ නමුත් වෙළඳ ආයතනය විසින් බිල්පත් ඉදිරිපත් කිරීමේදී ද වොට් 400 මර්කරි චොක් ලෙස සටහන් වී ඇති බවද වාර්තා කරමි.

❖ මේ වන විට ගෙනවිත් ඇති චොක් වොට් 125 බවද කොපර් මර්කරි චොක් බව නිරීක්ෂණය වේ.

එහි සඳහන්ව ඇත්තේ MEXER Q 125

125W/1,154/2056/+N130/Δ+75
230V50 H2 ලෙසය.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , දැන් එය වැරදියි. දැන් ඔය වොට් 125 චොක් එකක් මිල අඩුයි. ඇත්ත කතන්දරය නම් වොට් 400 චොක් එකක් වෙන්නේ රු.1650/= ක් බවයි රු.2950/= මිල නියම කර ඇත්තේ වොට් 450 චොක් එකයි .වොට් 450 චොක් එකක් කොළඹ වන්නේ රු.1650/= කි . එත් මම එය කතා කිරීමට යන්නේ නෑ. මොකද ටෙන්ඩර් කරපු නිසා. අපි මෙහිදි කියා සිටින්නේ නිළධරින්ගේ පැහැදිලි වැඩ පිළිවලක් තිබිය යුතුයි මේ සම්බන්ධව. මොකද මේවා අපේ පෞද්ගලික මුදල් නෙමේ මෙවා. මහජනතාවගේ දේවල් නිසා. මෙතන වොට් 450 චොක් 50 ක් ගෙනත් ඇති බව අපට මුල්‍ය කමිටුවට ආවා.වොට් 400 න් 50 ක්. දැන් අම්බලන්ගොඩ නගර සභාවට අවශ්‍ය වන්නේ වොට් 400 චොක් 8 ක් පමණි. මම ඇහුවේ එයයි. වොට් 125 එක අවශ්‍ය නිසා 450 න් ගෙනාවේ ඇයි කියා. මෙය මුදල් අපතේ යාමකි.රු1650/= ට රු2950/= දක්වා වැඩිවීම අපට පාඩුවකි.එයයි අපි පවසන්නේ . අපිට ප්‍රශ්නයක් නෑ. අපිත් නිකන් ඉන්නවා.අපි මෙය පිට ගිහින් කියන්න යන්නේ නෑ. අපි කියන්නේ මෙය නිවරදි මාර්ගයට යන්න කියා.නිලධාරින්ගේ හරියට ඉන්වෙන්ට්‍රි වෙලා ඒ චොක් ටික නිකුත් කලානම් ප්‍රශ්නයක් වන්නේ නැහැ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

දැන් මන්ත්‍රිතුමා රු.2950/= කියා තිබෙනවානේ. ඔබතුමා කියන්නේ එය කියද කියා.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

වොට් 400 චොක් එකක් 1650/= ක මුදලකි වන්නේ . අවශ්‍ය නම් මම මෙය සභාපතිතුමාට විස්තර ටිකක් පෞද්ගලිකව මෙය ඉදිරිපත් කරන්නම්.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

එම ආයතන මෙතැනට යොමු කරන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්</u>

ආයතන යොමු කරන්න නෙමේ කියන්නේ. පැහැදිලි විස්තර ටිකයි මම ඉදිරිපත් කළේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>

අපි මෙය ටෙන්ඩරයක් මගින්ඉදිරිපත් කර ඇත.

නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මම ඒ ගැන කතා කරන්නේ නැත. මෙතැන කතා කරන්නේ මෙහෙට වොක් 50 ආවා නම් වොට් 400 වොක් සවිකරනු ලැබුවේ කොහොමද? සවිකලේ කොහේද ? ඒ ටිකයි අපිට අවශ්‍ය වන්නේ.වෙට් 125 වොක් කොහේද සවි කර ඇත්තේ. දැන් එහි සඳහන්ව ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. මෙය නිවරදි මාර්ගයට යා යුතුයි.මෙතැන රු.65000/= ක පමණ වෙනසක් ඇත.එහෙම කතා කරනවා නම් .අපි ඔබතුමාගේ වරදක් නෙමේ කියන්නේ. ඔබතුමා අපි දන්නවා කවුද කියන එක. අපි වසර ගණනක් ඔබතුමා සමඟ සිටියා. ඔබතුමා ශත 5 ක වත් වංචාවක් කරන්නේ නෑ.නමුත් අපි කියන්නේ මේ වංචාවක් නොකරනවා වෙන්න පුළුවන් . නමුත් මෙය පැහැදිලි විනිවිදභාවයකින් එම පොත් පත් සටහන් කිරීම ආදිය නිසියාකාරව විය යුතුයි. එකයි අපි කියන්නේ.මෙම මුදල් නගර සභාවට ඉතිරි කිරීම තමයි අපේ මුලික පරමාර්ථය.වැඩියෙන් යන මුදල් ඉතිරි කර ගැනීම සඳහායි.වොට් 400 වොක් 50 කිව්වාම අපි දන්නවා. අපි නගර සභාවේ සිටියානේ .වොට් 125 වොක් අවශ්‍යයි. නමුත් මම දත්ත ඇතිව ඔබතුමාට දෙන්නම් විස්තර ටික. කාගේවත් බුදලයක් නෙමේ නගර සභාව . නිලධාරින්ගේ වැඩ කරන කොට පැහැදිලි විය යුතුයි.වැඩේත් කරගෙන නගර සභාවට ඉතිරි විය යුතු මුදල් ඉතිරි විය යුතුයි. ඔය සම්බන්ධව පරික්ෂණයක් මට ඉහලින් හරි ඉල්ලා සිටිය හැකියි.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

නෑ මෙහි ඔබතුමා කියපු වාර්තාව තමයි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

ඔතැන වාර්තාවේ තියෙනවානේ වොට් 400 වොක් එකට වොට් 125 වොක් එක රු.2400/= ගණනක් කියා. වොට් 400 වොක් එකත් 1600/= ගණනකි. අවශ්‍ය නම් එන්න කියන්න. මම පෙන්වන්නම්. ඔය කියන නිලධාරියාට එන්න කියන්න . මම පෙන්වන්නම්. එකයි මා පවසන්නේ තර්කානුකුල වෙනවා නම්

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මන්ත්‍රීතුමා මෙහෙම දෙයක් ඇත. නිලධාරීන් මොනවා කිවත් අපි ඇත්තටම මෙය දන්නවා නම් අපි එය නවත්වා හරි තැනට යා යුතුයි.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මම ඔය දුටුවේ ටෙන්ඩර් කමිටුවේ එන වාර්තාව නෙමේ.මුල්‍ය කමිටුවේ එන වාර්තාවේ විස්තරයයි මා දැක්කේ.නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රීලාල් මහතාගෙන් මම මෙය විමසුවා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඔබතුමා මේ ගැන ඇහුවා .එමනිසා තමයි වාර්තාවක් ඉදිරිපත් කරන්නේ.

ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා කතා කරමින්

මා විමසා සිටින්නේ වොට් 125වොක් අවශ්‍ය තැනට වොට් 450 වොක් 50 ක් ගෙනාවේ කුමකටද? එය ගෙනාවායි කියමුකෝ? වොට් 400 වොක් කොහේද සවි කරනු ලැබුවේ. එයින් පිච්චුන ටික කෝ? අපි විමසා සිටින්නේ එයයි.එය පැහැදිලිව ඇති නම් අපිට කිසිදු ගැටලුවක් නැත.මොකද මෙහි වැඩේ කිරීමට අවශ්‍යයි.

ගරු නගර සභා මන්ත්‍රීනි ඊ් අයිරාංගනි මහත්මිය කතා කරමින්

ගරු සභාපතිතුමනි , ඔය ලේඛන සකස් කරනු ලබන්නේ කවුද?

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මෙය නිලධාරින් විසින් සකස් කරනු ලබයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ් අයිරාංගනි මහත්මිය කතා කරමින්</u>**

මේ අවශ්‍ය තාවයන්ට ලේඛන සකස් කරනවා නම් බල්බ් අවශ්‍ය ප්‍රමාණ සපයනවා නම් එවා කොහේද සවි කරනු ලබන්නේ යන විස්තර පිළිබඳවත් සැලකිය යුතුයි. මෙතුමා ප්‍රකාශ කර ආකාරයට නගර සභාවේ මුදල් අපතේ යන විදියට බඩු රැස් කර ගැනීමකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කලින් විදුලි අංශය ඇණවුම් සම්බන්ධයෙන් තක්ෂණ සේවා නිලධාරින්ගෙන් අනු දැනුමකින් තොරව නිලධාරින්ගෙන් තමයි වාර්තා සකසා ඇත්තේ.කලින් තිබුණේ තාක්ෂණ සේවා නිලධාරින් විසින් එන වාර්තාව අනුව තමයි ඇණවුම් සිදු කෙරුණේ.නිලධාරින් පාලනය කරන කාලයේ මෙය විෂයක් විදියට තමයි ඇණවුම් කිරීම භාර ගෙන ඇත්තේ. පසුගිය සභාවේ අපි මේ පිළිබඳ ඉදිරිපත් කරණු ලබන කරුණු අනුව සමස්ත වශයෙන්ම විදුලි අංශයේ ඇණවුම් කිරීම නිකුත් කිරීමේ බලය තාක්ෂණ සේවා නිලධාරින්ට පවරන ලෙස දන්වන ලදී. මෙහිදි 50 ක් ගෙනෙන විට රු.2950/= කට ගෙන ඇති විටක රු.1600/= වෙළඳ පොලේ ඇත්නම් මෙතැන රු.1350/= ක් මුදලක් ඇත්තටම සොරකම් කර ඇත. එම තත්වය වැලැක්විය යුතුය.එය බලන්න. අපි චෝදනා ලබන්න කැමති නෑ.අපි වරදක් සිදු වි අත්නම් අහන්න කැමතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

ඔබතුමා වැරදි නෑ. අපි ඒ පිලිබඳව දන්නනේ නෑ.දන්නේ නැති එක හරි අපට පෙනේනවානම් මෙය වැරදි බව අපි ඔබතුමා දැනුවත් කිරීම අපේ වගකීමකි . ඒ නිසායි මා මෙය පැවසුවේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

එය නිවැරදියි. වොට් 125 එක ගෙනාව වුණාට දැන් මේතැන රු.1350/= ක විතර වෙනසක් තියෙනවා කියා පෙනෙනවා. දැන් මේ ගරු රාහුල මන්ත්‍රිතුමා කියන විදියට රු.1600/= විතර ගන්න පුළුවන් එක අපි මිලදි ගෙන ඇත්තේ රු.2950/= ක මුදලකට.එය එක් කරුණකි. අනෙක් එක මේවා 50 ක් මිලදී ගෙන ඇත. එම නිසා මෙම තත්වය වලක්වා ගත යුතුය.මෙවැනි තත්වයක් තිබිය නොහැකිය. මට මේ මන්ත්‍රීවරුන්ට කඩ ගණනේ යන්න කියන්න බෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත මහතා කතා කරමින්</u>**

ගරු සභාපතිතුමනි, මේ සඳහා වහාම පරික්ෂණයක් පවත්වන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පරික්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය නොවේ. අපි මේ සම්බන්ධව ටෙන්ඩරයක් කැඳවා තමයි මෙය සිදු කරනු ලැබුයේ. මෙහි වරද ඇත්තේ වොට් 400 ද වොට් 125 යන්න පිළිබඳවයි. නමුත් ඒ වුණත් අපිට ඇසට පෙනීමට ඇත්නම් මෙතැන රු.65000/= ක , රු.60000/= වෙනසක් ඇති බව. අපි මෙය මෙතනින් නතර කළ යුතුයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

අනෙක් කරුණ නම් කලින් කරපු ක්‍රමවේදය නම් අපි සමහර දේවල් ගැන දන්නේ නැති වු විට අදාල තාක්ෂණ සේවා නිලධාරින් දන්නේ නැත්නම් ඉලෙක්ට්‍රික් පැත්ත නම් දන්න ඉංජිනේරුවකුගේ වාර්තාවක් ගෙන තමයි අපි එම වැඩය කරනු ලබන්නේ . අපි වාහනයක් සෑදීමට ගියත් ලංගම සේවයේ ඉංජිනේරු මහතාට හරි කියා විස්තර ගෙන තමයි අපි නිත්‍යානුකුලව එය කරනු ලබන්නේ . දැන් මේතැන වේලා තියෙන්නේ මෙම 50 වොක් ගෙනාවා නම් 50 සවි කිරීමේ ක්‍රමවේදය මෙතැන තිබිය යුතුයි. එය අපි පැහැදිලිව සකසා ගත යුතුයි. එම පිච්චුන වොක් එක භාර දී ඇත්ද ?, නැතිනම් ඕනම තැනක මෙය සවි කල හැකිය. බල්බ් සඳහා ද මෙය බැලිය යුතුය. එ ගැනයි මා කියන්නේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව වැඩිම අවධානය යොමු කොට කටයුතු කරන්න. නැතිනම් හරි ප්‍රශ්නයක් විය හැකිය. මෙම ගෙනෙන බඩු සම්බන්ධයෙන් අපට පුළුවන් වෙනම මන්ත්‍රී කණ්ඩායමකට නිරික්ෂණය කරන්න අවසර දීමට හැකිය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත මහතා කතා කරමින්</u>**
මා යෝජනා කර සිටිනවා මේ සම්බන්ධව අදාල මන්ත්‍රීවරු කණ්ඩායමක් පත් කරන ලෙස. එම ගෙනෙන චොක් සහ බල්බ් පිළිඳුව සොයා බැලීමට.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
අපි මේ සඳහා අපේ පාලක පක්ෂයේ කවුරුත් මන්ත්‍රීවරු නැතිව විපක්ෂයේන්ම පත් කරනවා. ගරු නගර සභා මන්ත්‍රී සෝභිත මහතා , ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතාත් පත් කරනවා.මෙහි වරදක් ඇත්නම් , අපිට වරද සභාවට දෙන්න. මෙම දෙය සිදු කළ යුතු බව. මෙය ගියවර සභාවේ ගෙවීම පිළිබඳව ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිතවික්‍රම මහතා විසින් ඉල්ලන ලද වාර්තාවයි මේ. එම කතාව වැරදියි . එය වරදක් ලෙසම දැකිය යුතුයි.

තිරණය -
නගර සභාව සඳහා මර්කරි චෝක් මිළදි ගැනිම සම්බන්ධයෙන් වරදක් පවතී නම් එය සභාවට ඉදිරිපත් කිරිමටත් ඉදිරියේදි සභාවට භාණ්ඩ ඇණවුම් කිරිමේදි ගරු නගර සභා මන්ත්‍රී රාහුල ලලිත වික්‍රම මහතා , ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්.සරත්චන්ද්‍ර මහතා සහ ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා යන විපක්ෂය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කණ්ඩායම විසින් නිරික්ෂණ කිරිම සුදුසු බවටත් ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**12.05** රියෝ ක්‍රීඩා සමාජය මගින් නගර සභාවට අය විමට ඇති ජල ගාස්තුව වන රු.207307.63 ක මුදල අයකර ගැනීමෙන් පසු ජල සැපයුම සෘජුව ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා ගැනිමට අවසර දීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදි.
**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත මහතා කතා කරමින්</u>**
මෙච්චර මුදලක් හිඟ වුණත් ජල සැපයුම විසන්ධි නොකළේ ඇයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මෙය අපි ගෙවා ඇත.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**
මෙපමණ මුදලක් එකතු වනකම් මොකද කලේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මෙම වාර්තාව ඉදිරිපත් කළ ඇත්තේ තාක්ෂණ සේවා නිලධාරි මහතා විසිනි . මෙහි මොකක්ද සිදු වී ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඩබ්. ඒ. සෝභිත මහතා කතා කරමින්</u>**
මෙහි බිල මාසෙන් මාසයට හිඟ මුදලුත් සමඟ ගෙවන්න කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
නෑ ඔවුන් ජල සැපයුම අරගෙන නැත. රියෝ ක්‍රීඩා සමාජය පිහිටා තිබෙන්නේ අපේ නගර සභා භූමියේ. අපි කැමැත්ත දිය යුතුයි ජල සම්පාදන මණ්ඩලයට ජල සැපයුම ලබා දෙන ලෙස. එත් මෙය දීමට නම් අපේ ගාස්තු ගෙවිය යුතුය.

**<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍ර අයිරාංගනී මහත්මිය සෝභිත මහතා කතා කරමින්</u>**
ගරු සභාපතිතුමනි , මෙය කොටස් වශයෙන් ගෙවන්න කියන්න . එතකම් අපේ වතුර බ්‍රවිසරයෙන් වතුර ගන්න කියන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මෙය මාස හයකින් ගෙවා නිම කරන්න කියමු.ඉන්පසු ජල සැපයුම ලබා ගන්න කියමු.

ජල සැපයුම ලබා දීම සම්බන්ධයෙන් රියෝ ක්‍රීඩා සමාජය අප ක්‍රීඩා සමාජය සඳහා ජාතික ජලපවාහන මණ්ඩලය වෙතින් ජල පහසුකම් ලබා දීමට නගර සභාවේ අවසර ලබා දෙන ලෙස ලිපියක් ජලපවාහන මණ්ඩලය වෙත ලබා දෙන ලෙස ඉල්ලා ඇත. රියෝ ක්‍රීඩා සමාජය මඟින් නගර සභාවට අයවීමට ඇති ජල ගැස්තුව රු.207307.63කි . අයකර ගැනීමෙන් පසුව ජල සැපයුම ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා දීමට අවසරය දීමට සුදුසු ලෙස දන්වා ඇත. අපිට ඔවුන් ගෙවිය යුතුයි රු.207307.63 කි. මෙය ගෙවා නැත. අපේ ජල මාර්ගයෙන් තමයි ජලය ගෙන මෙපමණ බිලක් ඇත්තේ.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
බැඩ්මින්ටන් ක්‍රීඩාංගණය සඳහා ජල සැපයුම ලබා දී ඇත්තේ කොහෙන්ද? මෙම මුදල ගෙවන්නේ නැතිව ලිපියක් දිම වැරදියි. මෙය අයකර ගත යුතුයි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජී සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි , මා හිතන්නේ මෙහි වාර්තාවක් ගත යුතුයි කියා. ජල කරාමයක් පළුදු වීමෙන් ජල කාන්දු වුණාද දන්නේ නැත.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
මෙය රියෝ ක්‍රීඩා සමාජය විසින් ගෙවිය යුතුයි. මෙහි ජයන්ත ජයවීර මහතා විසින් ඉල්ලා සිටියේ මෙය කොටස් වශයෙන් ගෙවීමට ඉඩ දෙන ලෙසය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>
මෙම කොටස් වශයෙන් ගෙවීම අනුමත කරමු. මොකද ජල සම්පාදන මණ්ඩලයෙන් වුණත් මෙවැනි තත්වයකදි එය අනුමත කරනවා.
<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
දැන් මේ රියෝ ක්‍රීඩා සමාජයට මෙය කොටස් වශයෙන් ගෙවීමට ඉඩ දෙනවාද?

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>
කොටස් හතරකින් ගෙවීමට ඉඩ දෙමු සභාපතිතුමනි.

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
හරි අපි කොටස් හතරකින් ගෙවීමට දුන්නායි කියමු . මෙකි ලිපිය දෙන්නේ කවදාද? එහෙම නම් ඒ අය මෙය දැන් ගෙවනවා. එහෙම ගෙවන්න සල්ලි නෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>
එ කියන්නේ ජල සම්පාදන මණ්ඩලයෙන් ජල සැපයුම ලබා දෙන්නේ නැද්ද?

<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>
ඔවුන් අපේ ජල සැපයුමෙන් තමයි අරගෙන ඇත්තේ.

තිරණය -

රියෝ ක්‍රීඩා සමාජය මගින් නගර සභාවට අයවිමට ඇති ජල ගාස්තුව වන රු.207307.63 ක මුදල වාරික 04 කින් අයකර ගැනීමෙන් පසුව මොවුන්ගේ ඉල්ලීම පරිදි මෙම ක්‍රඩා සමාජය සඳහා ජල සම්පාදන මණ්ඩලය මගින් ජල පහසුකම් ලබා ගැනීමට නගර සභාවේ අවසරය ලබාදෙන බවට ලිපියක් ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උපසභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

**12.06 අම්බලන්ගොඩ නගර සභාවේ කසල කළමනාකරණ ඒකකය පරිසරය ආරක්ෂා කරමින් ඔබ සමඟ එක්ව කසල වෙන්කර එකතු කිරීමට බලාපොරොත්තුවේ යන ලිපිය සභාගත කරන ලදී.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

මේ සම්බන්ධව නිවසේ , ගෙවත්තේ , ව්‍යාපාරික ස්ථානයේ එකතුවන ඔබේ කසල දිරන හා නොදිරන වශයෙන් වෙන් කර තබා ගන්නා ලෙසත් , දිරන කසල සුපුරුදු පරිදි ලබා ගන්නා බවත් ,නොදිරන කසල බ්‍රහස්පතින්දා දින පමණක් නගර සභා සේවකයින් වෙත ලබා දීමට කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි. 2018.12.01 දින සිට **දිරන හා නොදිරන වශයෙනුත් වෙන් නොකරන ලද කසල නගර සභාව විසින් රැගෙන නොයන බව කාරුණිකව දන්වමි. මෙය මා දකිනවා මහරගම නගර සභාවේ නම් දිරන කසල සතියේ දවස් 6 ක් ගන්නවා. නොදිරන කසල එක දවසක් පමණයි ගන්නේ. මිනිසුන් ලෑස්තියි මෙය වෙන්කර දීමට. නමුත් මිනිසුන් පවසන්නේ අපි මේ දෙකම එකේ දමාගෙන යනවා කියා. අම්බලන්ගොඩ මෙය කලින් කර තිබෙනවා. දිරනවා නොදිරන කියා බෑග් දෙකම දමා ගන්නවා අර එකටම. එම නිසා දිරන කසල දවස් හයක එකතු කිරිමටත් නොදිරන කසල එක දවසක එකතු කිරීමට වැඩ පිළිවලක් සකස් කරන්න. සතියේ දවසක අපි හිතමු බදාදා හරි බ්‍රහස්පතින්දා හරි. දැන් එය සිකුරාදාට දමා ගන්න එපා.නොදිරන කසල එකතු කිරිමට එක දවසක වැඩසටහනක් අපට දෙන්න.**

ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.ජගත් කුමාර මහතා කතා කරමින්

ගරු සභාපතිතුමනි, සමහර තැන්වලට දවස් දෙකක් දී ඇත. එවැනි තැන්වලට කොහොමද මෙය සිදු වන්නේ. දවස් දෙක තියෙන තැන්වලින් අඩු කරන්න එපා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

ඒ විදියට වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ.

ගරු නගර සභා මන්ත්‍රී ඩබ් ඒ.සෝභිත රංජිත් කුමාර මහතා කතා කරමින්

**ගරු සභාපතිතුමනි , අර පල්ලියගොඩ වත්තේ කුණු දැමීම සඳහා කරත්තයක් ඉල්ලා සිටියා. එම ගමේ මිනිසුන්ට කුණු දැම්මට තැනක් නැත. සිංගර් හංදියේ බෝඩ් එක ගසා තිබෙනවා කුණු දමන්න එපා කියා. දැන් එම මිනිසුන්ට කුණු දැම්මට තැනක් නැත. එම කරත්තය ලබා දෙන්න. මම මීට කලිනුත් ඉල්ලිමක් කළා. එහි කුණු දැම්මට තැනක් නැත.**

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එම කරත්ත වලට ටෙන්ඩර් කළා නේද?

ගරු නගර සභා මන්ත්‍රී ඩබ් ඒ.සෝභිත රංජිත් කුමාර මහතා කතා කරමින්

මා ගිය සභාවෙත් මෙය කතා කළා.

ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්

එම කරත්තයක් කියද? අපි එයට කරත්තයක් ලබා දෙන්නම්.

**තීරණය**

නිවසේ , ගෙවත්තේ , ව්‍යාපාරික ස්ථානයේ එකතුවන කසල එකතු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපිය සම්බන්ධයෙන් සාකච්ජා කළ සභාව දිරන කසළ දින 06 ක් එකතු කිරිමටත් නොදිරන කසල එකතු කිරිම වෙනුවෙන් බදාදා හෝ බහස්පතින්දා යන දින දෙකෙන් එක් දිනයක් යොදා ගැනිමටත් එදින නොදිරන කසළ පමණක් එකතු කිරිමටත් , 2018.12.01 දින සිට දිරන සහ නොදිරන කසල වශයෙන් වෙන් නොකරන ලද කසල නගර සභාව විසින් රැගෙන නොයන බවට ජනතාව දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදා හැරිමටත් සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ.ඩබ්.සෝභිත රංජිත් මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

**12.07** ප්‍රාදේශිය මහ ලේකම්කාර්යාලය පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය ලබා ගැනීම සහා අනුමතියට යටත්ව ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කරන ලදී.

ප්‍රාදේශිය මහ ලේකම්කාර්යාලය, අම්බලන්ගොඩ පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය ලබා ගැනීම. අම්බලන්ගොඩ ප්‍රාදේශිය සේවකයන්ගේ සුහදතාවය වැඩි කිරීම සඳහා සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලියක් 2018.11.23 දින පැවැත්වීමට මනාන ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

**තීරණය**

අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලිය නිලධාරින්ගේ ශරිර සුවතාවය වැඩිදියුණු කිරිම හා සුහදතාවය වර්ධනය කිරිමේ අරමුණින් කාර්යාල නිලධාරින් අතර පැවැත්වෙන සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟාවලිය 2018.11.23 වන දින පැවැත්විම වෙනුවෙන් එදින පොල්වත්ත පියසේන ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන ලෙසට ඉල්ලිම ඉටු කිරිම සුදුසු බවට ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදිප් මහතා යෝජනා කළ අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදුව ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති වු බැවින් සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදි.

✠ **වෙනත් කරුණු**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එස්.එම්. සරත් චන්ද්‍ර මහතා කතා කරමින්</u>**

**කළුවඩුමුල්ල ටෙලිකොම් කුළුණ ළඟ කාණු පද්ධතියක් සාදනවා කියා. එය යෝජනා වී ප්‍රතිපාදනත් අනුමත වී ඇති බව පවසා ඇත . එහෙත් වැඩ කටයුතු සිදු වී නැත.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මේ සම්බන්ධව මට ලිපියකුත් ලැබෙන්න සැලැස්සුවා . ප්‍රතිපාදන හම්බ වු බව පවසා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ප්‍රතිපාදන කොහෙන්ද දන්නේ නැ ලැබි ඇත්තේ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මෙය අප පැමිණිමටත් කලින් සිදු වු දෙයකි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කොහෙන්වත් ප්‍රතිපාදන යම්කිසි ආයතනයකින් ලැබි ඇත්නම් ඕනැම වැසියෙකු වෙනුවෙන් එම කාර්ය ඉටු කරනු ලබයි. අපි නිකං ඉඳ නෑ. ඒවා අපිට වියදම් කරන්න බෑ .එම කාර්ය සඳහා යොදවනවාම තමයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

මේ පිළිබඳව අදාල පුද්ගලයා තමයි අපිට දැනුවත් කළේ මෙහෙම මුදලක් ලැබුණා කියා.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

කවුද එහෙම කියන්නේ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

පෙම්මාවඩු මහතා තමයි එහෙම පවසා ඇත්තේ.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

ඒ කියන්නේ කාගෙන්ද ලැබි ඇත්තේ?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ලලිත් ධම්මික කොඩිකාර මහතා කතා කරමින්</u>**

අපි පැමිණිමටත් කලින් පළාත් සභාවෙන්ද කොහෙන්ද

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**

දැන් මෙහෙමයි නගර සභාවේ යෝජනා සම්මත වුණාම මිනිසුන් හිතනවා ප්‍රතිපාදන ලැබුණායි කියා. එ තියෙන මුදල්ම තමයි අපිට ඇත්තේ. එහෙනම් මන්ත්‍රීවරයෙක් හරි කවුරුහරු මෙම ප්‍රතිපාදන මුදල් එවන්න ඕන. එහෙම එවලා නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>**

කේ. ඒ. ඩබ්. මහේෂ් කියන මහතා ලිපියක් එවා ඇත. එඩෙරමුල්ල ප්‍රදේශයේ කාණු සකසා ගැනීම සඳහා . අම්බලන්ගොඩ එඩෙරමුල්ල වසර කිහිපයක් තිස්සේ වැඩ නිම නොකරන ලද කාණුවක් පවති. වැසි දිනවලදි එය උතුරා යමින් අපගේ ගෙවත්තට වතුර ගලා එයි . මිට පෙර අම්බලන්ගොඩ නගර සභාව දැනුවත් කලත් ඊට පිලියමක් නොකරන ලදී. එත් පසුගිය වසරේ පාර අයිනේ අනෙක් පැත්තෙන් අලුතින් කාණුවක් සාදා පාර හරහා වැඩ නිම

නොකරන ලද කාණුවේ අපවිත්‍ර ජලය අප නිවසේ රැදී පවතී. මේ සඳහා පිලියමක් ලබා දෙන ලෙස ඔහු ඉල්ලා ඇත. අර එඬේරමුල්ලේ මෙතුමාගේ වැඩ පළට ටිකක් එහායින් පාර හරහා කාණුවක් දමා ඇති ස්ථානයයි.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
ඔතැන කාණුවක් දමා අපේ අතින් ගෙව්වා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>
නෑ සභාපතිතුමනි , මෙය සිදු වී ඇත්තේ අපේ පාලන කාලයේ නෙමේ . කොමසාරිස් පාලන කාලයේ . ඇත්තටම අර පැත්තෙන් කාණුව දමා විත් අර මිනිසුන් විරුද්ධ වුණායි කියා කාණුව අනෙක් පැත්තෙන් දමා ඇත.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මන්ත්‍රීතුමා ඔබතුමා ඔය පිළිබඳව හොඳටම දන්නවා. මොන පාරවල් සෑදුවාත් ඔය නගර සභාව සතු මුදල් වියදම් කළ එඬේරමුල්ල පාරේ නම් කාණු සාදන්න බෑ.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජගත් කුමාර මහතා කතා කරමින්</u>

ගරු සභපතිතුමනි , මම දන්නවා එය. ප්‍රාදේශිය ලේකම්තුමාගේන් ඉල්ලීමක් කර එයින් ඉතුරු වැඩ කොටස කර දෙන්න කියා. ඔබතුමාට මේ සඳහා සහභාගි විය හැකිය.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කතා කරමින්</u>

අපේ කෙරම්ණිය පටුමගේ වල ගොඩලි තැන් වසා ගෙන යන විට ගල් රෝල අපදාවකට ලක් වුණා. පුංචි බෝක්කුවක් කඩා ගෙන ඇතුලට වැටුණා.එම නිසා අපිට මීටර් 30 ක පමණ කොටසක ගල් අතුරා ඇත. තාර දමා ගැනීමට නොහැකි වුණා. මොකද ගල් රෝල යාමට නොහැකි නිසා. අපේ පරිපාලකවරයා ඒ අවස්ථාවේ ගල්රෝල ගෙන අවශ්‍ය කටයුතු කළා. නමුත් ඉන් එහාට තාර දමා ගැනීමට නොහැකි වු කොටසේ මිනිසුන් ගෙවල් 60 ක පමණ ප්‍රමාණයක් තියෙනවා. ඒ කොටසේ තාර දමා ගැනීමට අවශ්‍ය නිසා අපිට අවශ්‍ය වන්නේ නෑ. බොයිලේරු එහෙම. අපිට වළක් කපා සාදා ගත හැකිය. අපිට කම්කරුවන් පස් හය දෙනෙකුගේ සේවාව අවශ්‍යයි කඩිනමින්. ගල් උඩ තමයි මිනිසුන් යන්නේ. එය අවධානම් තත්වයක් තමයි තියෙන්නේ.ලෑලි පුපුරා ඇත. එම නිසා කඩිනමින් මේ සඳහා විසඳුමක් දෙන්න.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
අපගේ ටොන් 2 1/2 රෝල වැඩද ? එය දමා මෙම කාර්ය කර දෙන්න.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි එම්.ඩබ්.නිලානි මෙනවිය කතා කරමින්</u>

ගරු සභාපතිතුමනි, ඊළඟ සභාවට කලින් පුස්තකාලයේ වැසිකිළිය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන්න . දැන් අපි ඇවිත් මාස හයක් පමණ ගත වි ඇත.

<u>ගරු නගර සභා මන්ත්‍රීනි ඊ. ඉන්ද්‍ර අයිරාංගනී මෙනවිය කතා කරමින්</u>

මේ සම්බන්ධව ඔබතුමාගෙන් මේ සම්බන්ධව මාත් ඉල්ලා සිටිනවා . මොකද කාන්තා මන්ත්‍රීවරුන් සිටිනවා . ඔබතුමා කිව්වාත් මෙය ඉක්මනින් සාදා දෙන්න. තවත් කරුණක් තිබෙනවා. ඔකන්දේ නාන ළිඳ පිළිබඳ ප්‍රශ්නේ. එය ගම්වැසියන්ගේ තද ඉල්ලීමකි. එයට ඇස්තමේන්තු සකසා ඇත. එත් එය තවම සිදු වී නැත.

**<u>ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්</u>**
මන්ත්‍රීතුමිය මේ සඳහා සමිතියක් සමඟ අපට එවන්න. අපි වැඩය කර දෙන්නම්.

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි , කරිත්තකන්දේ මෙම ටියුෂන් සෙන්ටර් එක ගාව අපි කාණුව සම්බන්ධ කරන්න කිව්වා ඇළට . එහා පැත්තේ මනුස්සයා අඩි 16 පාර අඩි 4ක් පාරේන් අල්ලා ටයිබ්ම් එකක් දමා ඇත. මම තාක්ෂණසේවා නිලධාරි මහතාගෙන් විමසුවා . මෙය අනවසර එකක් බව දන්වා සිටියා. අවසර ගත්තෙත් නැතිලු.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

පාරේන් අල්ලා ඇත්ද?

**ගරු නගර සභා මන්ත්‍රී ජී.සරත් ශ්‍රීලාල් මහතා කතා කරමින්**

අඩි 16 ක් පාර හල්වතුර පාර .එහි අඩි 12 න් ටයිබිම් එකක් දමා අඩි 4 කුත් අල්ලා ඇත.වහාම පරික්ෂණයක් පවත්වා වැඩ නතර කරන්න

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

මෙහි වැඩ නතර කරන්න ඉක්මනින්. පාර අල්ලා ඇත්නම් අපේ බැකෝ යන්ත්‍රය දමා ඉවත් කර දමන්න.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

ගරු සභාපතිතුමනි, මෙය සභාවට ඉදිරිපත් කර නැත. අම්බලන්ගොඩ, පොරඹ , පනියන මරණාධාර සමිතියේ භාණ්ඩ තබා ගැනීම සම්බන්ධව. පන්සලේ තමයි මේවා දමා තිබුණේ. අ.ම. කරුණාතිලක දෙවු පුරවැසි ශාලාවේ කාමරයක් වසා ඇති බව.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

කාමරයක් වසා නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී මගගේ අතුල ප්‍රියන්ත මහතා කතා කරමින්**

තියෙනවා කියා අරංචියක් ආවා. බඩු ටික දමා ගැනීමට සමිතියේ සභාපතිතුමාගේ ගෙදර තමයි තියෙන්නේ. ලොකු අවශ්‍යතාවයක් ඇත.

**ගරු සභාපති එම්.ඩබ්.අරුණ ප්‍රදිප් මහතා කතා කරමින්**

කාමරයක් වසා නැහැ. මන්ත්‍රීතුමා එය සම්පූර්ණ අංග සම්පූර්ණ ටයිල් කරන ලද ගෙයකි. එහි බඩු දමා නාස්ති කරනවා කියන්නේ අපරාධයක්. එහෙනම් අපි ඒ අයට බඩු දා ගන්න පොඩි තැනක් හදා ගැනීමට පොඩි ඉඩක් දෙමු.

පස්වරු 2.30 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් විය.

බී. ඒ. ධම්මිකා,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

අරුණ ප්‍රදීප් මණිමෙල් වඩු,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2018 -11–28** වන දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.